වාණිජ කලාපය	29,962,436	18,700,920	1,289,259	466,473	510,217	50,929,305
කාර්යාල කලාපය	12,058,396	3,526,243	3,379,047	290,235	267,303	19,521,224
තොරතුරු තාක්ෂණික කලාපය	20,581,329	10,120,606	1,573,615	234,030	2,335,953	34,845,534
පරිවර්තන කලාපය	24,562,858	749,912	42,783	282,415	244,566	25,882,535
කර්මාන්ත හීරුව	10,003,560	1,265,708	-	1,436,880	253,102	12,959,251
කර්මාන්ත කලාපය	6,223,220	334,541	50,868	3,040,452	263,983	9,913,064
නේවාසික කලාපය	11,496,719	685,918	101,831	1182257	383,432	13,850,158
මුළු අවකාශය	134,377,903	39,257,307	7,661,723	6,992,974	5,678,445	193,968,353

වගුව 4.6 : විදුලිය අවශ්‍යතාවය සඳහා පුරෝකථනය කළ අවකාශය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සමස්තසැලසුම් ප්‍රදේශය පුරා යෝජිත ඉඩම් පරිහරණය මත පදනම්ව සම්මත විදුලි ඉල්ලුම පුරෝකථනය කර ඇත. එමෙන්ම අනෙකුත් අධිකාරීන් මඟින් යෝජිත ඕනෑම විදුලි සැපයුම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති න් සෘජුවා හෝ වක්‍රව අගනගර සංවර්ධන සැලසුම සඳහා දායක කරගනු ලැබේ

උපාය මාර්ගික මැදිහත්වීම 2 : ජල සැපයුම

වර්තමාන තත්වය :

ජල සැපයුම් උපායමාර්ගික සැලැස්මේ අරමුණක් වනුයේ අගනගර සංවර්ධන ප්‍රදේශයට අවශ්‍ය 100% ජල සැපයුම ලබාදීමයි. එබැවින් දැනට පවත්නා ජල සැපයුම , අනාගත ජල ඉල්ලුම සහ ශ්‍රී ලංකාවේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් යෝජිත ව්‍යාපෘති හඳුනාගැනීම වැදගත්ය. මෙම ජල සැපයුම් ඉල්ලුම පළාත් පාලන ආයතනත්හි ප්‍රක්ෂේපණ මත පදනම්ව නිශ්චය කර ඇත. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දත්ත වලට අනුව, පවත්නා ජල සැපයුම අදාළ ප්‍රදේශ සඳහා පහත පරිදි වේ.



රූපය 4.1 : කොළඹ දිස්ත්‍රික්කයේ ජල සැපයුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන හා පරීක්ෂණ අංශය - 2018

වර්ෂ 2011 සඳහා වූ ජල ඉල්ලුම

පළාත් පාලන ආයතනය	වර්තමාන ජල සැපයුම (2011) (ඝ.මී දිනකට)			
	ගෘහස්ථ පරිභෝජනය	ගෘහස්ථ නොවන පරිභෝජනය	විශේෂ පරිභෝජනය	දිනයක මුළු සාමාන්‍ය පරිභෝජනය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව	20690	1925	0	33754
කඩුවෙලමහ මහ නගර සභාව	23466	2616	2269	41694
මහරගම නගර සභාව	23440	3035	2421	42496
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	15218	1348	2201	27598
මුළු ජල සැපයුම	**82814**	**8924**	**6891**	**145542**

වගුව 4.7 : ජල ඉල්ලුම (ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය) - 2011
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය

2011ට පවතින දත්ත පදනම් කරගෙන අනාගත තත්වය පුරෝකතනය කිරීම දුෂ්කර කාර්යයක් හේතුවෙන් ඒ සඳහා ජාතික ජල සැපයුම සහ ජලා පවාහන මණ්ඩලය මඟින් 2015 සඳහා කරන ලද ප්‍රක්ෂේපනයද අගනගරයේ ජනගහනයද පදනම් කරගෙන අනාගත තත්වය ප්‍රක්ෂේපනය කර ඇත.

2015 වර්ෂය සඳහා වන ජල ධාරිතා ඉල්ලුම (සැකසීම ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය)

පළාත් පාලන ආයතනය	ජනගහනය 2015	ගෘහස්ථ පරිභෝජනය (ඝ.මී දිනකට)	ගෘහස්ථ නොවන පරිභෝජනය (ඝ.මී දිනකට)	විශේෂ පරිභෝජනය (ඝ.මී දිනකට)	දිනයක සාමාන්‍ය මුළු පරිභෝජනය (ඝ.මී දිනකට)	දිනක උපරිම මුළු පරිභෝජනය (ඝ.මී දිනකට)
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව	111048	19410	3162	1457	34326	37759
කඩුවෙලමහ මහ නගර සභාව	264630	38420	4288	4168	66709	73381
මහරගම නගර සභාව	208416	30658	3914	2421	52848	58132
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	137913	18608	1644	2201	32076	35284
මුළු ජල සැපයුම	**722,007**	**107,096**	**13,008**	**10,247**	**185,959**	**204,556**

වගුව 4.8 : ජල ඉල්ලුම 2015 (ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය) - 2015
මූලාශ්‍රය : ජාතික ජල සැපයුම සහ ජලා පවාහන මණ්ඩලය - 2018

2018 වර්ෂය සඳහා වන ජල ධාරිතා ඉල්ලුම (සැකසීම ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය)

	ජනගහනය 2018	ගෘහස්ථ පරිභෝජනය	ගෘහස්ථ නොවන පරිභෝජනය	විශේෂ පරිභෝජනය	දිනයක සාමාන්‍ය මුළු පරිභෝජනය	දිනක උපරිම මුළු පරිභෝජනය
අගනගර සංවර්ධන සැලැස්මේ සංකල්පයට අනුව මුළු ජල සැපයුම	774,082	114,820	13,946	10,986	19,9371	219,310

වගුව 4.9 : 2018 වර්ෂය සඳහා ජල ඉල්ලුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන සහ පරේස්ෂණ සැලසුම් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

2030 වර්ෂය සඳහා වන ජල ධාරිතා ඉල්ලුම
(සැකසීම ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය)

පළාත් පාලන ආයතනය	ජනගහනය 2030	2030 ප්‍රක්ෂේපණය (ඝ.මී. දිනකට)					
			ගෘහස්ථ නොවන පරිභෝජනය	විශේෂ පරිභෝජනය	ප්‍රදේශයන්හි මුළු ඉල්ලුම	දිනයක සාමාන්‍ය මුළු පරිභෝජනය	දිනක උපරිම මුළු පරිභෝජනය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව	130724	25622	4171	1672	31465	37910	41702
කඩුවෙලමහ මහ නගර සභාව	330358	56818	6419	5059	68296	82176	90396
මහරගම නගර සභාව	260181	45998	5745	2783	54526	65690	72261
කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව	172677	26248	2317	2525	31090	37457	41203
මුළු ජල සැපයුම	**893940**	**154686**	**18652**	**12039**	**185,377**	**223233**	**245562**

වගුව 4.10 : ජාතික ජල සම්පාදන සහ ජලා පවාහන මණ්ඩලයට අනුව 2030 දී ජල ඉල්ලුම
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන සහ ජලා පවාහන මණ්ඩලය - 2018

2030 වර්ෂය සඳහා 893,940 කා ජනගහනයක් සඳහා ජාතික ජලසම්පාදන හා ජලා පවාහන මණ්ඩලය ජල ඉල්ලුම ප්‍රක්ෂේපණය කර ඇති අතර ඉදිරි වසර 30 සඳහා ගණනය කරන ලද 1,545,900 ජනගහනයද, 45%කින් ඉහල යන ගෘහස්ථ නොවන භූමි ප්‍රමාණයද පදනම් (3 වන පරිච්ඡේදය බලන්න) කරගෙන මෙම සැලැස්ම සඳහා අනාගත ජල ඉල්ලුම 2050 වර්ෂයට ප්‍රක්ෂේපනය කර ඇත.

	ජනගහනය 2018	ගෘහස්ථ පරිභෝජනය (ඝ.මී. දිනකට)	ගෘහස්ථ නොවන පරිභෝජනය (ඝ.මී. දිනකට)	දිනක උපරිම මුළු පරිභෝජනය
මුළු භූමි	1,545,934	267,506	37,648	305,154

වගුව 4.11 : අගනගර ප්‍රදේශය සඳහා වූ ජල ඉල්ලුම 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන සහ පරේක්ෂණ සැලසුම් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අගනගර සංවර්ධන සැලැස්මේ ජල ඉල්ලුම් ප්‍රක්ෂේපණයට අනුව , ජාතික ජල සම්පාදන සහ ජලා පවාහන මණ්ඩලයේ ප්‍රක්ෂේපණයට අනුව ප්‍රදේශයට 118281 m3 ප්‍රමාණයක අතිරේක ජල ඉල්ලුමක් ඇත.

2030 වර්ෂය සඳහා ජාතික ජලසම්පාදන හා ජලා පවාහන මණ්ඩලයෙන් යෝජිත ව්‍යාපෘති

පවතින ක්‍රමවේදය	අනාගත ක්‍රමවේදය	ජල ප්‍රතිකාරක පහසුකම්	යෝජිත ජල ප්‍රතිකාරක පහසුකම් සැපයුම (දිනකට)	සැපයීමට ඇති පිරිසිදු ජලය (ඝ.මී. දිනකට)				
				2012	2015	2020	2025	2030
කෝට්ටේ	කෝට්ටේ	අඹතලේ	39768	47734	53239	36011	38007	34729
		වැලිවිට	0	0	0	16502	17649	24257
බත්තරමුල්ල	බත්තරමුල්ල	අඹතලේ	22119	31182	37149	0	0	0
		වැලිවිට	0	0	0	37472	40309	43351
කඩුවෙල	කඩුවෙල	ලබුගම	14392	20563	22300	23246	28461	25766
		වීකෝ	0	0	3655	4053	856	916
		වැලිවිට	0	0	0	0	0	4791
මහරගම	මහරගම	කලටුවාව	4019	4567	5190	0	0	0
		අඹතලේ	19834	24245	26272	0	0	-
		වැලිවිට	0	0	0	38474	41379	44476
කොලොන්නාව	කොලොන්නාව	ලබුගම	1258	1522	8283	0	0	0
		කලටුවාව	2095	2840	0	0	0	0
		අඹතලේ	39203	48714	49332	58160	62793	67757
		වැලිවිට	0	0	0	0	0	0
එකතුව			**142688**	**181367**	**205420**	**213918**	**229454**	**246043**

වගුව 4.12 : 2030 වර්ෂය සඳහා ජල සම්පාදන සහ ජලා පවාහන මණ්ඩලයෙන් යෝජිත ව්‍යාපෘති
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන සහ ජලා පවාහන මණ්ඩලය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 3 : ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

වර්තමාන තත්වය :

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ප්‍රශ්නයක් බවට පත්ව ඇත. රටේ වැඩිම ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් කොළඹ දිස්ත්‍රික්කය උත්පදනයාවේ. අපද්‍රව්‍ය කළමනාකරණ උපායමාර්ගික මැදිහත්වීම මෙම සැලැස්මේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය අංගයකි.

යෝජිත අගනගර ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල දැනට පවතින ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමය පහත පරිදි වේ.



රූපය 4.2 : කොළඹ දිස්ත්‍රික්කයේ ඝන අපද්‍රව්‍ය උත්පාදනය
මූලාශ්‍රය : www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka

- *කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන 50% ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් කඩුවෙල පළාත් පාලන ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබයි.*
- *මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන 60% ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් කඩුවෙල පළාත් පාලන ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබයි.*
- *කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන 80% ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් කඩුවෙල පළාත් පාලන ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබයි.*
- *කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන 98 % ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් කඩුවෙල පළාත් පාලන ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබයි.*

ඒ අනුව වර්තමානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම ප්‍රමාණවත් නොවේ.



රූපය 4.3 : කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රම
මූලාශ්‍රය : www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka

වත්මන් ධාරිතාව සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම

පළාත් පාලන ආයතනය	වත්මන් ඝන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය	ධාරිතාව
ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව	කරදියාන විවෘත කසළ බැහැරකරන ස්ථානය	අක්කර 25 වූ භූමි ප්‍රමාණයක දිනකට මෙට්‍රික් ටොන් 500 ක් බැහැර කිරීමට ඇති හැකියාව
මහරගම නගර සභාව		
කොටිකාවත්ත ප්‍රාදේශීය සභාව	විවෘත කසළ බැහැරකරන ස්ථානය	දිනකට මෙට්‍රික් ටොන්40
කඩුවෙල මහා නගර සභාව	කඩුවෙල අපද්‍රවය බලශක්ති ව්‍යාපෘතිය	දිනකට මෙට්‍රික් ටොන් 35

වගුව 4.13 : වර්තමාන ධාරිතාව සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රම
මූලාශ්‍රය : අදාල පළාත් පාලන ආයතන - 2018

අපද්‍රව්‍ය ජනනය වන ප්‍රමාණය ගණනය සඳහා භාවිත කරනු ලැබූ උපකල්පන

ප්‍රදේශය	ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය උත්පාදනය (නේවාසික) (මෙට්‍රික් ටොන්)
මහා නගර සභාව	0.7
නගර සභාව	0.4
ප්‍රදේශීය සභාව	0.3

වගුව 4.14 : පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය උත්පාදනය නක්සේරු කිරීම සඳහා උපකල්පන
මූලාශ්‍රය : ඝන අපද්‍රවය කළමනාකරණ අධිකාරිය - 2018

නේවාසික ජනගහනය මත පදනම්ව වර්තමාන ඝන අපද්‍රව්‍ය උත්පාදනය

පළාත් පාලන ආයතනය	2018 නේවාසික ජනගහනය	ඝන අපද්‍රව්‍ය උත්පාදනය (මෙට්‍රික් ටොන්) 2018
කඩුවෙල මහා නගර සභාව	277693	194
මහරගම නගර සභාව	232093	93
ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව	98962	69
කොටිකාවත්ත ප්‍රාදේශීය සභාව	165266	50
සමස්ත ප්‍රදේශය	**774013**	**406**

වගුව 4.15 : නේවාසික ජනගහනය මත පදනම්ව ඝන අපද්‍රව්‍ය උත්පාදනය ප්‍රක්ෂේපනය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

2050 දී ප්‍රක්ෂේපිත තත්වයන් :

නේවාසික ජනගහනය මත පදනම්ව ඝන අපද්‍රව්‍ය උත්පාදනය කිරීම ප්‍රක්ෂේපනය කර ඇත

පළාත් පාලන ආයතනය	2050 නේවාසික ජනගහනය	ඝන අපද්‍රව්‍ය උත්පාදනය (මෙට්‍රික් ටොන්) 2050
කඩුවෙල මහා නගර සභාව	414217	290
මහරගම නගර සභාව	777780	311
ශ්‍රී ජයවර්ධනපුර මහා නගර සභාව	107517	75
කොටිකාවත්ත ප්‍රාදේශීය සභාව	246420	74
සමස්ත ප්‍රදේශය	**1545934**	**750**

වගුව 4.16 : නේවාසික ජනගහනය මත පදනම්ව ඝන අපද්‍රව්‍ය උත්පාදනය ප්‍රක්ෂේපනය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සංචලනය වන ජනගහනය මත පදනම් වූ ඝන අපද්‍රව්‍ය උත්පාදනය

උපකල්පනය :

සංචලනය වන ජනගහනයේ ඒක පුද්ගල ඝන අපද්‍රව්‍ය උත්පාදනය දිනකට කිලෝග්‍රෑම් 0.15 කි. (මූලාශ්‍රය : www. Environment clearance.nic.)

	Floating Pop	Solid Waste Generation (MT)
Floating Population of Capital City 2018	902,400	135
Floating Population of Capital City 2050	2,500,000	375

වගුව 4.17 : මධ්‍ය ජනගහනය මත පදනම් වූ ඝන අපද්‍රව්‍ය උත්පාදනය ප්‍රක්ෂේපනය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ස්ථානවල වර්තමාන ධාරිතාව දළ වශයෙන් මෙට්‍රික් ටොන් 575 ක් වන අතර ප්‍රදේශයන්හි වර්තමාන අපද්‍රව්‍ය උත්පාදනය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 574 කි. යෝජිත කැපිටල් සිටි ප්‍රදේශයේ ප්‍රක්ෂේපනය කරන ලද ඝන අපද්‍රව්‍ය උත්පාදනය මෙට්‍රික් ටොන් 1130 කි. එම හේතුව නිසා අනාගතයේදී මෙට්‍රික් ටොන් 555 එකතු කළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා විසඳුමක් ආරම්භ කිරීම අවශ්‍ය වේ.

04 පරිච්ඡේදය
පහසුකම් කළමනාකරණ උපායමාර්ගය

උපයෝගීතා කළමනාකරණය සඳහා වූ උපායමාර්ගික මැදිහත්වීම : භෞතික යටිතල පහසුකම්

උපායමාර්ගික මැදිහත්වීම 3 : ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

උපායමාර්ගික මැදිහත්වීම 4 : අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති

මහ කොළඹ ප්‍රදේශයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 3500 ක් අරුවක්කළු හි හඳුනාගත් ස්ථානයකට බැහැර කිරීමට මෙගාපොලිස් අමාත්‍යාංශය පුරෝකථනය කර තිබේ. එයට ශ්‍රී ජයවර්ධනපුර කෝට්ට මහ නගර සභාවේ සහ කොට්ටිකාවත්ත ප්‍රදේශ සබා ප්‍රදේශවල අපද්‍රව්‍ය ඇතුළත් වේ

කෙසේ වෙතත්, එහි ප්‍රති ප්‍රතිඵලයක් ලෙස ඉතිරි පළාත් පාලන ආයතන දෙක සඳහා විසඳුමක අවශ්‍යතාවය ඉහළ ගොස් තිබේ. අනාගතයේදී දිනකට මෙට්‍රික් ටොන් 400 ක් පමණ වන නේවාසික ඝන අපද්‍රව්‍ය වලින් 65% ක් කළමනාකරණය කළ යුතුව ඇත්තේ කඩුවෙල සහ මහරගම පළාත් පාලන ආයතන විසිනි. වර්තමානයේ කරදියානා භූමියේ ධාරිතාව මෙට්‍රික් ටොන් 500 ක් වන අතර කඩුවෙලා අපද්‍රව්‍ය බලශක්ති ව්‍යාපෘතිය දිනකට මෙට්‍රික් ටොන් 35 ක ධාරිතාවක් දරයි.

තවද, යෝජිත අගනගරයේ අනාගත සංචලනය වන ජනගහනය දිනකට දළ වශයෙන් මෙට්‍රික් ටොන් 400 ක ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් ජනනය කරනු ඇතැයි අනුමාන කෙරේ. පළාත් පාලන ආයතන අනුව සංචලනය වන ජනගහනයෙන් මෙම පුරෝකථනය කරන ලද ඝන අපද්‍රව්‍ය උත්පාදනය පිළිවෙලින් ශ්‍රී ජයවර්ධනපුර සහ කොට්කාවත්ත පළාත් පාලන ආයතන සඳහා මෙට්‍රික් ටොන් 100 සහ මෙට්‍රික් ටොන් 200 ලෙස උපකල්පනය කෙරේ. මෙම ඝන අපද්‍රව්‍ය අරුවක්කළු වෙත මාරු කිරීමෙන් කළමනාකරණය කිරීමට අපේක්ෂා කරන අතර, ඉතිරි මෙට්‍රික් ටොන් 200 සහ 13 ප්‍රමාණය කඩුවෙල සහ කරදියාන අපද්‍රව්‍ය බලශක්ති ව්‍යාපෘතිය මඟින් කළමනාකරණය කරගැනීමට අපේක්ෂා කරණු ලබයි. කෙසේ වෙතත්, කරදියානාහි ධාරිතාව උපරිම කිරීම මඟින් මෙට්‍රික් ටොන් 65 ක අතිරේක ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුවේ.

උපායමාර්ගික මැදිහත්වීම 4 :
අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය

වත්මන් තත්වය :

බැක්ටීරියා, රසායනික ද්‍රව්‍ය සහ වෙනත් විෂ ඇතුළු අපවිත්‍ර ද්‍රව්‍ය වලින් පිරී ඇති බැවින් අපජලය තවදුරටත් භාවිතයට සුදුසු නොවන බව සාමාන්‍යයෙන් විශ්වාස කෙරේ. එබැවින් ජලය නැවත පරිසරයට මුදා හැරීම සඳහා අපවිත්‍ර ද්‍රව්‍ය පිළිගත හැකි මට්ටමකට ප්‍රතිකාර කිරීම හා අඩු කිරීම ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, දැනට යෝජිත අගනගර සැලසුම් ප්‍රදේශය සඳහා නිසි අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ ක්‍රමයක් නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නිසි ලෙස අපජල බැහැර කිරීමේ ජාලය නොමැතිවීම 'නගර ස්වභාවය' පවත්වා ගැනීමට දුෂ්කරවේ. ඒ අනුව, මෙම කොටසේ අරමුණ ප්‍රදේශයේ අපජල උත්පාදනය කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීමක් ඇති කරයි.

ප්‍රදේශයේ පවත්නා අපජල උත්පාදනය

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (කඩුවෙල)	
2018 ජනගහනය	277693
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	222,154
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	26,658
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	9,330
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	35,989
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	7,198
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	43,187
	45,000 ඝ.මී. දිනකට

වගුව 4.18 : කඩුවෙල අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (මහරගම)	
2018 ජනගහනය	232,093
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	185,674
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	22,280
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	7,798
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	30,079
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	6,015
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	36,095
	36,000 ඝ.මී. දිනකට

වගුව 4.19 : මහරගම අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ)	
2018 ජනගහනය	98961.71597
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	79,169.37277
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	9,500.324733
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	3,325.113657
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	12,825.43839
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	2,565.087678
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	15,391
	15,000 ඝ.මී. දිනකට

වගුව 4.20 : ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය -2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (කොටිකාවත්ත)	
2018 ජනගහනය	165265.885
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	13,2212.708
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	15,865.52496
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	5,552.933735
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	21,418.45869
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	4,283.691739
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	25,702
	25,000 ඝ.මී. දිනකට

වගුව 4.21 : කොටිකාවත්ත අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

2050 දී පුරෝකථනය කළ අනාගත තත්වය

ප්‍රදේශය තුළ 2050 වසර සඳහා පුරෝකතනය කල නිපදවන අපජල ධාරිතාව

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (කඩුවෙල)	
2050 ජනගහනය	414,217
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	331,373
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	39,765
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	13,918
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	53,682
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	10,736
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	64,419
	25,000 ඝ.මී. දිනකට

වගුව 4.22 : කඩුවෙල අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (මහරගම)	
2050 ජනගහනය	777,780
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	622,224
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	74,667
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	26,133
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	100,800
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	20,160
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	120,960
	120,000 ඝ.මී. දිනකට

වගුව 4.23 : මහරගම අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ)	
2050 ජනගහනය	107,517
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	86,014
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	10,322
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	3,613
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	13,934
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	2,787
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	16,721
	17,000 ඝ.මී. දිනකට

වගුව 4.24 : ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අපජල පිරිපහදු කිරීම හා බැහැර කිරීමේ පද්ධතිය (කොටිකාවත්ත)	
2050 ජනගහනය	246,420
ජනගහනයෙන් 80%ක් අවරණය වන පරිදි සැලසුම් කිරීම	
ජල පරිභෝජනය (දිනකට ඝන මීටර්)	197,136
ඒක පුද්ගල අපද්‍රව්‍ය ජල උත්පාදනය	120 ඒ.පූ/ලී/දිනකට
මූලික අපජල ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	23,656
මූලික අපජල ප්‍රවාහයෙන් 35% ක් වාණිජ ආයතන වලින් අපජල උත්පාදනය වන ලෙස ගැනීම	8,280
සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	31,936
20%පසට උරාගැනීම (දිනකට ඝන මීටර්)	6,387
මුළු ජනගහනය මත මුළු සාමාන්‍ය වියළි කාලගුණ ප්‍රවාහය (දිනකට ඝන මීටර්)	38,323
	38,000ඝ.මී. දිනකටay

වගුව 4.25 : කොටිකාවත්ත කෝට්ටේ අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ පද්ධතිය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ඉහත වගු වලින් ගම්‍ය වන්නේ 2030 වන විට අගනගර සංවර්ධනයත් සමඟ පවත්නා අපජල උත්පාදනය දෙගුණයක් වනු ඇති බවයි. එම හේතුව නිසා, සැලැස්ම ක්‍රියාත්මක කිරීමත් සමඟ අපජලය පිළිබඳ ගැටළුව විසඳීම ඉතා වැදගත්වේ.

අපජල පවිත්‍රකරණය හා බැහැර කිරීම සඳහා හඳුනාගත් ව්‍යාපෘති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සහ අවට ප්‍රදේශ සඳහා අපජල පවිත්‍රකරණය (SP-I-1) හඳුනාගෙන ඇති අතර කඩුවෙලා මහා නගර සභාව, මහරගම නගර සභාව, කොට්ටිකවත්ත ප්‍රාදේශීය සභාව, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවෙන් කොටස් ද ඇතුළුව මුළු ජනගහනය 218,800 ක් මීට අයත්වේ. එසේ වුවද, එය ආවරණය කරන්නේ මුළු භූමි ප්‍රමාණයෙන් 21% ක් පමණි. එබැවින් මුළු ප්‍රදේශය සඳහාම අපජල පවිත්‍රකරණය හා බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක් සකස් කිරීම අවශ්‍ය වේ.



	集水面積 (ha)	計画水量 (m3/分)
MTPS01	86.9	1.1
MPS01	245.9	3.2
MTPS02	81.2	1.1
MPS02	545.3	7.1
MPS03	261.7	3.4
MPS04	337.2	4.4
MPS05	1507.0	19.6
MPS06	98.3	1.3
MPS07	473.9	6.2
MTPS03	未定	
MTPS04	未定	
MPS08	1033.4	13.4

රූපය 4.4 : අපජල පවිත්‍රකරණය සහ බැහැර කිරීමේ ව්‍යාපෘති යෝජනාව
මූලාශ්‍රය : ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය - 2018

4.4. උපායමාර්ගික මැදිහත්වීම : සමාජීය යටිතල පහසුකම්

සමාජ යටිතල පහසුකම් ඝනයට සාමන්‍යයෙන් සමාජ සේවා සඳහා වන වත්කම් ඇතුළත් වේ. මේ අතරට රෝහල් ආදී සෞඛ්‍ය සේවා, පාසැල් සහ විශ්ව විද්‍යාල ඇතුලුව අධ්‍යාපන සේවා, ප්‍රජා නිවාස බන්ධනාගාර ඇතුළු පොදු පහසුකම් ද, දුම්රිය හා මහා මාර්ග පද්ධතිය ඇතුළත් ප්‍රවාහන සේවා ද ඇතුළත් වේ.

මෙම ව්‍යූහයයන් සමාජයේ යහපැවැත්ම සඳහා වන කොදු නාරටිය ලෙස ක්‍රියාත්මක වන බැවින් අගනගර සංවර්ධන සැලැස්ම ප්‍රධාන වශයෙන් සැලසුම් ක්ෂේත්‍රයේ සෞඛ්‍ය හා අධ්‍යාපන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ඒ අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත

උපායමාර්ගික මැදිහත්වීම 1 : අධ්‍යාපන ආයතන

වත්මන් තත්වය

ජාතික පාසල් 19කින් සමන්විත සමස්තපාසල් 18ක් අගනගර සැලසුම් කලාපය තුළ පිහිටා ඇත.

වර්ගය	රජයේ පාසැල් ගණන
ජාතික පාසල්	19
අ.පො.ස උ/පෙළ දක්වා	23
අ.පො.ස සා/ පෙළ දක්වා	30
ප්‍රාථමික පාසල්	9
එකතුව	81

වගුව 4.26 : අගනගරය තුළ පාසල් ව්‍යාප්තිය
මූලාශ්‍රය : අධ්‍යාපන අමාත්‍යාංශය - 2018

සිතියම 4.1 : අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය - රජයේ පාසල් – 2018

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිපාලන හා සංවර්ධන කටයුතු, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



අධ්‍යාපනය පහසුකම්හි ව්‍යාප්තිය - රාජ්‍ය පාසල් සමාජ යටිතල පහසුකම් උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම	**දත්ත මූලාශ්‍රය** සම්පත් ජනිකඩ, (ප. පා. ආ)	**සැකසුම :** බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

2050 දී ප්‍රක්ෂේපිත තත්වය

2012 වාර්ථා වූ 145,000 ක් වූ අගනගරයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 59%ක් වූ 85,267ක් රජයේ පාසල් වල අධ්‍යාපනය ලබන අතර, ඉතිරි 41% අන්තරජාතික සහ අනෙකුත් පාසල් ජනගහනයට ඇතුළත් වේ.

1. *පරතරය අවුරුදු 5ත් 19ත් අතර සිසුන් අගනගර කලාපය තුළම පිහිටා ඇති පාසල් සඳහා වයස් යාමේ ලක්ෂණයක් පවතී*
2. *පාසලක සිටින සිසුන් ප්‍රමාණය එම පාසලට දැරිය හැකි උපරිම සිසුන් ප්‍රමණය ලෙස හඳුනා ගැනේ.*

2050 වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත පාසල් සිසුන් ජනගහනය 169,700 කි.

තවදුරටත් 2050 වර්ෂයේදී රජයේ පාසල් 17%කින් වර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර එම වර්ධනයට පහසුකම් සැපයීම සඳහා පුරෝකථනය කරන ලද ශිෂ්‍ය ජනගහනය, යෝජිත මාර්ග ජාලය සහ යෝජිත සකල්පිත සැලැස්ම මත පදනම්ව සුදුසු ප්‍රදේශ හඳුනා ගැනේ.

ජාතික පාසල් සහ ද්විතීකපාසල් සඳහා කිලෝමීටර 3ක් සහ ප්‍රාථමික පාසල් සඳහා කිලෝමීටර් 1ක දුරකට විහිදී යන කලාපයක් හඳුනා ගෙන ඇත. මෙමඟින් අපේක්ෂා කරනුයේ අගනගරය පුරා පාසැල් ව්‍යාප්ත කරමින් පාසල් සංඛ්‍යාව වැඩිකිරිමකින් තොරව පවතින පසැල්හි ධාරිතාව ඉහල නැංවීම අපේක්ෂා කෙරේ.

යෝග්‍යතා විශ්ලේෂණයට අනුව අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වඩාත් සුදුසු ප්‍රදේශ ලෙස දැනුම නගර කලාපය සහ පර්යන්ත නගර කලාපය හඳුනාගෙන ඇත.

සිතියම 4.2 : අගනගර සංවර්ධන සැලැස්මේ පාසල් යටිතල පහසුකම්

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරවේදී සහ සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සැලසුම් ප්‍රදේශයේ පාසල් ආවරණ කලාපය
සමාජ යටිතල පහසුකම් උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිසරෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



පාසල් සඳහා සුදුසු ප්‍රදේශ
සමාජ යටිතල පහසුකම් උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 4.3 : පාසල් සඳහා යෝග්‍යතා විශ්ලේෂණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 2 : සෞඛ්‍ය ආයතන

වත්මන් තත්වය

ශ්‍රී ජයවර්ධනපුර රෝහල , ජාතික මානසික සෞඛ්‍ය ආයතනය සහ අපේක්ෂා රෝහල වැනි ගුරු අභ්‍යාස කාණ්ඩයට අයත් රෝහල් 3ක්ද ඇතුළුව රජයේ හා පෞද්ගලික රෝහල් 22ක් අගනගර සීමාව තුළ පිහිටා ඇත.
සෞඛ්‍ය පහසුකම් සැලසුම් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇති අතර වඩාත් වැදගත් දෙය නම් බොහෝ රාජ්‍ය හා පෞද්ගලික සෞඛ්‍ය පහසුකම් වාණිජ නගරය වන කොළඹට ආසන්නව පිහිටා ඇත.

වර්ෂ 2050 සඳහා ප්‍රක්ෂේපණය කරන තත්වය

2012 දී ජනගහනය සහ රෝහල් අනුපාත සලකා බැලූ විට එය 10,000: 0.32 ලෙස සටහන් වේ. 2030 වර්ෂය වන විට එය ප්‍රක්ෂේපණය කරන ලද ජනගහනය සමඟ 10,000 : 0.26 ක් වනු ඇතැයි නිශ්චය කර ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ලෝක සෞඛ්‍ය ප්‍රමිති අනුව, රෝහල් ඇඳන් ඝනත්වය පුද්ගලයන් 1000කට ඇඳන් 5ක් ලෙස සඳහන් වේ. එය 2012 දී ඇඳන් 2.4/ පුද්ගලයින් 1000 වෙනුවෙන් ලෙස සටහන් විය. 2050 දී මෙසේ ප්‍රක්ෂේපණය කරනු ලැබූ ඇඳන් ඝනත්වය 1.95ක් / ප්‍රක්ෂේපණ ජනගහනයේ ඇතුළත් පුද්ගලයින් 1000කටය .

අගනගර සංවර්ධන සැලැස්මේ 10 වන පරිච්ඡේදයේ හඳුනාගත් වැදගත් උපායමාර්ගයක් වනුයේ අධිකණය පද්ධතියට අදාළ ආයතනයක් අගනගරය තුළ හඳුනාගත් අක්ෂය තුළ පිහිටවීමයි. මෙම පිහිටවීම සඳහා අගනගර සංවර්ධන සැලැස්මෙන් හඳුනාගත් සුදුසුම විකල්ප මාර්ගය භූමිය වුයේ IDH මුලික රෝහල පරිශ්‍රය පිහිටි භූමියයි. එම හේතුවෙන් මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ IDH මුලික රෝහල අවශ්‍ය ධාරිතාවන් සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ලෝක සෞඛ්‍ය ප්‍රමිතින්ට අනුව නැවත ස්ථානගත කිරීම සඳහාද අවශ්‍ය විකල්ප භූමි හඳුනාගෙන ඇත.



සිතියම 4.4 : සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්තිය - 2018

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සෞඛ්‍ය පහසුකම්හි ව්‍යාප්තිය
සමාජ යටිතල පහසුකම් උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
Google සිතියම් , 2018

සැකසුම් :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 4.5 : සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්තිය - විකල්ප 1 (රෝහල්)

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සෞඛ්‍ය පහසුකම්හි ව්‍යාප්තිය - විකල්ප 01
සමාජ යටිතල පහසුකම් උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
Google සිතියම් , 2018

සැකසුම් :
බස්නාහිර පළාත් අංශය හා පරීක්ෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



සිතියම 4.6: සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්තිය - විකල්ප 2 (හවගමුව)
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සෞඛ්‍ය පහසුකම්හි ව්‍යාප්තිය - විකල්ප 02 සමාජ යටිතල පහසුකම් උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම	දත්ත මූලාශ්‍රය Google සිතියම් , 2018	සැකසුම් : බස්නාහිර පළාත් අංශය හා පරීක්ෂණ හා පුනුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය	නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018



05

ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගික සැලසුම

05 පරිච්ඡේදය
පහසුකම් කළමනාකරණ උපායමාර්ගය

හැඳින්වීම

අභිමතාර්ථ හා අරමුණු

ප්‍රවේශය

5.1 හැඳින්වීම

5.1.1. අභිමතාර්ථ හා අරමුණු

ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගය පළමු පරිච්ඡේදයේ දක්වා ඇති තෙවන අරමුණ වෙත ළඟා වීමට සෘජුවම බලපාන අතර අනිකුත් අරමුණු සියල්ල සාක්ෂාත් කරගැනීමට ද උපයෝගී වනු ඇත.

5.1.2. ප්‍රවේශය

අගනගර සංවර්ධන සැලසුමේ අන්තර්ගත වන්න වූ ඉලක්ක හා අරමුණු උදාකර ගැනීම සඳහා ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගය මඟින් සැලසුම් ප්‍රදේශය ඇතුළත හා පිටත නගර කලාප අතර සම්බන්ධතාව වර්ධනය කරගැනීමට ප්‍රධාන වශයෙන් අරමුණුකර ඇත. එමෙන්ම කාර්යක්ෂම ආර්ථික පලදායිතාවයක් හා සුවපහසු පොදු ප්‍රවාහන සේවයක් මඟින් නගර කලාප ඒකාබද්ධ කරමින් මාර්ග තදබදය අවම වූ, විෂ වායු විමචනය අවමවූ , සුපිරිසිදු, ගුණාත්මක ප්‍රවාහන සේවයක් ඇති කරලීමට අපේක්ෂිත අතර , වඩා ආරක්ෂාකාරී වූ පරිසරයක් ප්‍රදේශය පුරා නිර්මාණය කරලිමද අරමුණු වේ. එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ප්‍රථමයෙන් ඝනත්වය මත පදනම්ව පහත දක්වා ඇති පරිදී පිළියෙළ කරගනු ලැබූ නගර කලාප ධුරාවලියට අනුකූලව ප්‍රවාහන ජාලය සැලසුම් කර ලදී.

ප්‍රථම පෙළ ප්‍රමුඛතා මංසන්ධි	–	*කොස්වත්ත - බත්තරමුල්ල, කොට්ටාව - මාකුඹුර, නුගේගොඩ*
දෙවන පෙළ ප්‍රමුඛතා මංසන්ධි	–	*මහරගම, රාජගිරිය*
තෙවන පෙළ ප්‍රමුඛතා මංසන්ධි	–	*කඩුවෙල, මාලඹේ, කොටිකාවත්ත - අංගොඩ, තලවතුගොඩ*
සිවුවන පෙළ ප්‍රමුඛතා මංසන්ධි	–	*අතුරුගිරිය, කොරතොට, හෝකන්දර, පැලවත්ත, පිටකෝට්ටේ*

ප්‍රවාහන සංවර්ධන සැලසුමේ දෙවන ඉලක්කය ලෙස ක්‍රමානුකූල ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීමෙන් අගනගර සැලසුම් කලාපය තුළ පවතින්න වූ මාර්ග තදබදය අවම කිරීමට අවදානය යොමු කර ඇති අතර එමඟින් නාගරික පද්ධතියේ කාර්යක්ෂම බව වැඩි කිරීමට ද අවධානය යොමුකර ඇත.

මෙයට අමතරව අගනගර සැලසුම් කලාපයේ අන්තර්ගත වන්න වූ තෙත්බිම පද්ධතිය නගරයේ ප්‍රධාන ප්‍රවාහන පද්ධතිය වෙත සම්බන්ධ කිරීමටද ප්‍රවාහන සැලසුම මඟින් උත්සහ දරා ඇත.

සිතියම 5.1 : අගනගරයෙහි යෝජිත නාගරික ඝනත්වය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



යෝජිත නාගරික ඝනත්වය
අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම් :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

05 පරිච්ඡේදය
පහසුකම් කළමනාකරණ උපායමාර්ගය

උපාය මාර්ගයේ විෂය පථය

වර්තමාන පසුබිම

5.2. උපාය මාර්ගයේ විෂය පථය

1. මෙම උපාය මාර්ගයෙන් ආවරණය වන සැලසුම් රාමුව තුළ අන්තර්ගත වන්නේ :

    අ. සැලසුමේ සඳහන් කර ඇති ප්‍රක්ෂේපිත ජන සංඛ්‍යාව හා විවිධ අංශ යටතේ යෝජනා කර ඇති සේවාවන් හා ක්‍රියාකාරකම් සඳහා පැමිණේවී යැයි අපේක්ෂා කරණ ජනසංඛ්‍යාව දල වශයෙන් ඇස්තමේන්තු කර ඇති පරිදි විවිධ ප්‍රවාහන මාදිලි යෝජනා කිරීම හා එම සැලසුම් ක්‍රියාත්මක කළ යුතු කාලපරිච්ඡේද හා භූමි ප්‍රදේශ නිර්ණය කිරීමය.

    ආ. නාගරික සංවර්ධන අධිකාරිය හා අනිකුත් ආයතන මඟින් හඳුනා ගෙන ඇති ව්‍යපෘති මඟින් ඉහත හඳුනාගත් අවශ්‍ය තාවය පරිපූර්ණ කිරීම.

    ඇ. ඉහත ප්‍රවාහන සම්බන්ධ ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමට යෝග්‍ය ප්‍රදේශ හඳුනා ගැනීම.

    ඈ. අවශ්‍යතාවය සලකා, හඳුනාගත් ව්‍යපෘති කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කිරීම.

2. කෙසේ වෙතත්, මෙම උපායමාර්ගය පොදු අවශ්‍යතා පමණක් සපුරාලන අතර, යටිතල පහසුකම් සංවර්ධන පිළිබඳ තනි ආයතන ලෙස අවශ්‍යතා හඳුනාගැනීමට අදහස් නොකෙරේ.

3. සැලැස්මෙහි මෙම කොටසෙහි යෝජනා කර ඇති සියලු උපායමාර්ගික ව්‍යාපෘති , සංවර්ධන සැලැස්මෙහි 01 වන පරිච්ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළදී ප්‍රදේශයට සේවය සැලසෙනු ඇත. මෙම කාල සීමාව ඉක්මවා යන තත්ත්වයන් තුළදී සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කළ යුතුව ඇත.

5.3 වර්තමාන පසුබිම

2050 වනවිට අගනගරයෙහි සමස්ත ජනගහනය 1520000 ලෙස ප්‍රක්ෂේපනය කර ඇති අතර එය වර්තමාන ජනගහන මෙන් දෙගුණයක් බව පෙනීයයි.එමෙන්ම 2050 සංචරණ ජනගහනය දැවත්මන් සංචරණ ජනගහන මෙන් දෙගුණයක් වන අතර එම ප්‍රමාණය 2500000 ලෙස ගණනය කර ඇත. මෙම කරුණු මත පෙනීයනුයේ පවතින ප්‍රවාහන පහසුකම් මත අනාගත ගමනාගමන උත්පාදනය මෙම ප්‍රදේශයට විශාල ප්‍රශ්නයකට හේතු විය හැකි බවයි.



රූපය 5.1: කොළඹ නුදුරු ගමන් වේගය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අගනගරයෙහි විවිධ කලාපයන්හි වර්තමාන ගමනාගමන උත්පාදනය

උපකල්පිතයන් පදනම් වන මූලාශ්‍ර Eric, J, 2011. Basics of ITE Trip Generation and its Role in Calculating Transportation Impact Fees. Innovation for better mobility. මත පදනම්ව ගණනය කර ඇත.

ITERIS

Two Independent Impact Fee Studies

Type of Land Use[2]	ITE Code	Daily Trip Generation Rate[3]	Pass-by Percentage[4]	Discounted Impact Fee[5]
General Office (per 1,000 sf)				
< 50,000 sf	710	15.65	0%	$2,204
50,000 – 100,000 sf	710	14.25	0%	$2,006
100,001 – 200,000 sf	710	12.15	0%	$1,711
> 200,000 sf	710	11.37	0%	$1,601
General Retail (per 1,000 sf)				
< 50,000 sf	820	86.56	48%	$6,337
50,000 – 100,000 sf	820	75.10	42%	$6,090
100,001 – 200,000 sf	820	58.92	35%	$5,417
> 200,000 sf	820	53.28	32%	$5,101
Industrial				
General Light Industrial (per 1,000 sf)[7]	110	6.97	0%	$ 981
General Heavy Industrial (per 1,000 sf)[7]	120	1.5	0%	$ 211
Industrial Park (per 1,000 sf)[7]	130	6.96	0%	$ 980
Warehousing (per 1,000 sf)[7]	150	4.96	0%	$ 699
Mini-Warehouse (per 1,000 sf)[7]	151	2.5	0%	$ 352

Existing Traffic Generation based on Land use of the Capital City

කලාප	නේවාසික කාලපයේ ගමනාගමන උත්පාදනය	වාණිජ කාලපයේ ගමනාගමන උත්පාදනය	කාර්යාලීය කලාපයේ ගමනාගමන උත්පාදනය	කර්මාන්ත කලාපයේ ගමනාගමන උත්පාදනය	අනිකුත් කලාපයන්ගේ ගමනාගමන උත්පාදනය	කලාපයන්ගේ සමස්තගමනාගමන උත්පාදනය
අධි ගණත්ව නේවාසික කලාපය	51,162	10,022	309	465	798	62,756
පරිපාලන කලාපය	32,794	4,375	560	138	622	38,489
වාණිජ කලාපය	127,136	192,725	1,008	17,588	1,418	339,874
කාර්යාලීය කලාපය	32,441	30,326	482	2,902	465	66,616
මොරතුරු තාක්ෂණ කලාපයය	71,189	24,913	944	2,340	934	100,321
පරිවර්තන මිශ්‍ර සංවර්ධන කලාපය	60,353	9,530	64	2,824	318	73,089
පරිසර හිතක්මී ගබඩා තීරුව	26,886	10,885	–	7,184	253	45,209
කර්මාන්ත කලාපය	40,456	4,603	122	15,202	429	60,813
නේවාසික කලාපය	71,283	7,865	3,547	509	623	83,828
සමස්ත ප්‍රදේශය	**513,700**	**295,244**	**7,035**	**49,153**	**5,861**	**870,994**

වගුව 5.1 : ඉඩම් පරිහරණය මත පදනම් වූ රථවාහන උත්පාදනය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

5.4. ප්‍රක්ෂේපිත ගමනාගමන තත්වයන් 2050

අගනගර භූමි පරිභෝජන රටා මත පදනම්ව ප්‍රක්ෂේපිත ගමනාගමන උත්පාදන ගණනය

කලාප	වාණිජ කාලපයේ ගමනාගමන උත්පාදනය	කාර්යාලීය කලාපයේ ගමනාගමන උත්පාදනය	කර්මාන්ත කලාපයේ ගමනාගමන උත්පාදනය	අනිකුත් කලාපයන්ගේ ගමනාගමන උත්පාදනය	නේවාසික කාලපයේ ගමනාගමන උත්පාදනය	කලාපයන්ගේ සමස්තගමනාගමන උත්පාදනය
අධි ගණත්ව නේවාසික කලාපය	10,022	309	46	798	54,687	65,862
පරිපාලන කලාපය	43,755	3,260	14	1,244	73,255	121,527
වාණිජ කලාපය	192,725	1,008	1,759	1,418	199,750	396,659
කාර්යාලීය කලාපය	30,326	5,058	290	516	192,234	228,424
නොරතුරු තාක්ෂණ කලාපයය	124,563	1,888	234	4,672	137,209	268,566
පරිවර්තන මිශ්‍ර සංවර්ධන කලාපය	47,651	128	282	381	89,811	138,254
පරිසර හිතක්මි ගබඩා තීරුව	21,770	–	1,437	506	21,479	45,192
කර්මාන්ත කලාපය	5,754	153	3,040	528	135,972	145,447
නේවාසික කලාපය	9,045	3,547	51	717	306,071	319,430
සමස්ත ප්‍රදේශය	**485,610**	**15,350**	**7,154**	**10,780**	**1,210,467**	**1,729,361**

වගුව 5.2 : ඉඩම් පරිහරණය උත්පාදනය මත පදනම්ව පුරෝකථනය කරන ලද රථවාහන උත්පාදනය - 2050
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 5.2 : ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගයේ සියුක්ත සිතියම
මූලාශ්‍ර : බස්නාහිර පළාත් අංශය සහ පරිශ්‍රණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සංයුක්ත සිතියම ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම	**දත්ත මූලාශ්‍රය** නාගරික සංවර්ධන අධිකාරිය	**සැකසුම :** බස්නාහිර පළාත් අංශය හා පරිශ්‍රණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය	නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018

5.5. උපායමාර්ගික මැදිහත්වීම්

ප්‍රවාහන අංශයේ ඉහත ඉලක්ක කිරීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් තුනක් පහත දැක්වේ.

උපාය මාර්ගික මැදිහත්වීම 01 : දැනට පවතින හඳුනාගත් මාර්ග පුළුල් කිරීම හා තෙත්බිම් සමඟ බැඳුණු නව අභ්‍යන්තර සම්බන්ධතා හඳුන්වා දීම.

උපාය මාර්ගික මැදිහත්වීම් 02 : පවත්නා ප්‍රවාහන මධ්‍යයන් සමඟ සුසංයෝග කරමින් නව ප්‍රවාහන මධ්‍යයන් හඳුන්වා දීම.

උපායමාර්ගික මැදිහත්වීම 03 : සියලු ප්‍රවාහන මධ්‍යයන් සම්බන්ධ කිරීම සඳහා බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන හඳුනවා දීම.

උපාය මාර්ගික මැදිහත්වීම 1 : දැනට පවතින හඳුනාගත් මාර්ග පුළුල් කිරීම හා තෙත්බිම් හා බැදුණු නව අභ්‍යන්තර සම්බන්ධතා හඳුන්වා දීම.

අගනගර සංවර්ධන සැලසුමේ හඳුනාගන ඇති පරිදි තෝරාගත් මාර්ග වල සේවා සැපයීම වර්ධනය කරගැනීමත්, මාර්ග තදබදය අවමකර ගැනීමත් ප්‍රධාන අරමුණ වන අතර ඒ සඳහා ක්‍රියාකාරිත්වය අනුව ආකාර හතරකින් යුත් මාර්ග පද්ධතියක් අගනගර සංවර්ධන සැලසුමතුළිනේයෝජනා කර ඇත. එම ආකාර හතර පහත දක්වා ඇත.

P1 - *ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග*
P2 - *උප ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග*
P3 - *අන්තර් නාගරික ක්‍රියාකාරී මාර්ග*
P4 - *පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග*
P5/P6 - *තෙත්බිම් මාර්ග*

P1 – ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග

මීටර් 30 ක් පළල සහිත අගනගරයට ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග තුනක් යෝජනා කර ඇත.

- *හයිලෙවල් මාර්ගය*
- *ලෝ ලෙවල් මාර්ගය*
- *නව නුවර මාර්ගය*

උපරිම යෝජනා ප්‍රමාණයක් ඉහල නැංවීම සඳහාත් ඒ අවට සජීවී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ත් ප්‍රධාන වශයෙන් මෙවැනි මාර්ග යෝජනා කිරීමේ අරමුණ වේ. මේ සම්බන්ධයෙන් ගත් කල, මෙම ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග තුන ඉහළම යටිතල පහසුකම් ඝනත්වයකින් යුක්ත වන අතර, ඉදිරි වසර දහය තුළ මෙම ප්‍රදේශයේ විශාලතම සංවර්ධන කටයුතු ආකර්ෂණය කර ගනිමින් ප්‍රධාන කොරිඩෝව සකස් කරනු ඇත.



නාගරික ක්‍රියාකාරී මහාමාර්ග (P1 මාර්ග)
ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 5.3 : අගනගරයේ පී 1 මාර්ගයේ මාර්ග වාහපිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

05 පරිච්ඡේදය
පහසුකම් කළමනාකරණ උපායමාර්ගය

උපායමාර්ගික මැදිහත්වීම්

උපාය මාර්ගික මැදිහත්වීම 1 : දැනට පවතින ඉඳුනාගත් මාර්ග පුළුල් කිරීම හා හෙත්බිමි හා බැදුණු නව අභ්‍යන්තර සම්බන්ධතා ඉඳුන්වා දීම.



රූපය 5.2: පී 1 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය හරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 5.3: පී 1 මාර්ග කාණ්ඩයේ සහ සැහැල්ලු දුම්රිය මාර්ගයේ නිර්දේශිත සාමාන්‍ය හරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

P2 – උප ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග

ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග එකිනෙකට සම්බන්ධ කරමින් අගනගර කලාපයේ ප්‍රවාහන ජාලය සවිමත් කිරීම සඳහා උප ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග ජාලය යෝජනා වී ඇත. ඒ මඟින් අගනගර මධ්‍ය කලාපය, වාණිජ කලාපය වැනි කලාප තුළ අන්තර් සම්බන්ධතාව වර්ධනය කිරීමට යෝජනා වී ඇති අතර එමඟින් දැලිසක් ආකාරයට ප්‍රවාහන මාර්ග සම්බන්ධ කිරීමට හැකියාවක් ලැබී ඇත.



රූපය 5.4: පී 2 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය හරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සිතියම 5.4 : අගනගරයෙහි පී 2 නාගරික මාර්ග ව්‍යාප්තිය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශීලන හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



උපප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග (P2 මාර්ග) ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම	**දත්ත මූලාශ්‍රය** නාගරික සංවර්ධන අධිකාරිය	**සැකසුම :** බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

P3 – අන්තර් නාගරික ක්‍රියාකාරී මාර්ග

උප ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග සම්බන්ධ කිරීම සඳහා අන්තර් නාගරික ක්‍රියාකාරී මාර්ග සැලසුම් කර ඇති අතර ඉතා කුඩා මට්ටමේ නාගරික කලාප තුළ ජනනය වන්න වූ මාර්ග තදබදය අවම කරගැනීම සඳහා මෙම ආකාරයේ මාර්ග භාවිතකිරීමේ හැකියාවක් ඇත.



රූපය 5.5: පී 3 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය ඝරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

P4 – පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග

P1, P2, P3, P5, P6 යන මාර්ග වර්ගීකරණයට අයත් නොවන පළාත් පාලන ආයතන වලට අයත් වන මාර්ග මෙම කාණ්ඩයට අයත් වේ. මෙම මාර්ග මීටර් 7ක අවම පළලකින් යුතුවන සේ සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.



රූපය 5.6: පී 4 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය ඝරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 5.5 : අගනගරයෙහි පී 3 කාණ්ඩයෙහි මාර්ග ව්‍යාප්තිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

P5 & P6 – තෙත්බිම් මාර්ග

යෝජිත තෙත්බිම් මාර්ගයන්හි ප්‍රධාන අරමුණ වනුවේ නගරය තුළ පිහිටා ඇති තෙත්බිම්, ප්‍රවාහන ජාලය වෙතට නිරාවරණය කිරීමයි. එවැනි තෙත් බිම් අභිමුඛ සංවර්ධනයේදී තෙත්බිම් අසලින් ගමන් කල හැකිවන පරිදි හා වාහන ධාවනය කර හැකි අයුරින් තෙත්බිම් නිරාවරණය මඟින් අනවසර ඉදිකිරීම් අවම කරගැනීම ප්‍රධාන අරමුණ වේ. අගනගර සංවර්ධන කලාපය තුළ දැනට පවතින තෙත්බිම්තුළින්30% ප්‍රමාණයක් විවෘත කිරීමට මෙම උපාය මාර්ගයතුළින්අපේක්ෂා කෙරේ.එම තෙත්බිම් මර්ගන් වර්ග පහත පරිදි වේ.

- *පටු තෙත්බිම් මාර්ග. (මංතීරු 1කින් යුත්)*
- *ප්‍රධාන තෙත්බිම් මාර්ග. (මංතීරු 2කින් යුත්)*



රූපය 5.7: පී 5 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය හරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 5.8: පී 6 මාර්ග කාණ්ඩයේ නිර්දේශිත සාමාන්‍ය හරස්කඩ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 5.6 : අගනගරයෙහි පී 5, පී 6 කාණ්ඩයෙහි මාර්ග ව්‍යාප්තිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 2 : පවත්නා ප්‍රවාහන මධ්‍ය සමඟ සුසංයෝග කරමින් නව ප්‍රවාහන මධ්‍ය හඳුන්වා දීම.

නගරය තුළට පැමිණෙන රථ වාහන ධාරිතාවය පාලනය කිරීම සඳහා දැනට පවතින මාර්ගයන් පළල් කිරීම ම විසඳුමක් නොවන බව ස්ට්‍රඩා මොඩලය (STRDA Model) විශ්ලේෂණයෙන් පැහැදිලි වූ අතර නව මාර්ග සම්බන්ධතා අවකාශීය සංකලන මට්ටම් වල වෙනස්කම් මංසන්ධි වල සහ කොරිඩෝවන්හි භූමි පරිභෝජන රටා ගමනාගමන රටා වෙනස් කිරීමට හේතුව වේ. එමනිසා විශේෂ මංසන්ධි සඳහා ඇදෙන පුද්ගලික වාහන අඩු කරගැනීම සඳහා නව ප්‍රවාහන මධ්‍ය න් හඳුන්වා දීම අත්‍යවශ්‍යවේ. ඒ අනුව පහත ව්‍යාපෘතීන් අගනගර සංවර්ධන සැලසුම තුළ යෝජනා කරනු ලැබේ.

- *සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවය*
- *කනුමතින් දිවෙන අධිවේගී මාර්ගය*
- *විදුලි දුම්රිය ප්‍රවාහන සේවය*
- *ජල ප්‍රවාහන සේවය.*

සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවය (LRT) :

කොළඹ දිස්ත්‍රික්කය තුළ මාර්ග තදබදය අවම කිරීම අරමුණු කරගනිමින් ජපන් අන්තර්ජාතික සහයෝගිතා ආයතනය (JICA) හා බස්නාහිර හා මහ නගර අමාත්‍යාංශය සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවා ව්‍යාපෘති දෙකක් සම්බන්ධව කටයුතු කරනු ලබයි.එම ව්‍යාපෘති වලින් ආවරණය වන ප්‍රදේශ පහත පරිදිවේ.

- *JICA ආයතන මඟින් සිදු කෙරෙන මාලඹේ සිට පිටකොටුව දක්වා හා මාලඹේ සිට කඩුවෙල දක්වා වූ සැහැල්ලු දුම්රිය ප්‍රවාහන සේවා ව්‍යාපෘතිය.*
- *බස්නාහිර හා මහ නගර අමාත්‍යාංශය මඟින් යෝජිත හුණුපිටියේ සිට කොට්ටාව දක්වා වූ සැහැල්ලු දුම්රිය ප්‍රවාහනසේවා ව්‍යාපෘතිය.*

ඉහත ව්‍යාපෘති මඟින් බලාපොරොත්තු වන්නා වූ ප්‍රතිඵල පහත සඳහන් වේ.

වර්ගීකරණය	දිග	දිනකදී ගමන් කරන මඟින් සංඛ්‍යාව		PPHPFD
		මඟින් ප්‍රමාණය	මඟින් ප්‍රමාණය / කිලෝමීටර්	
මහ නගර අමාත්‍යාංශය	23.2	456,262	19,666	10477
JICA	15.7	498,000	31,720	19800

වගුව 5.3 : දෛනික මඟීන් ප්‍රරෝකථනය
මූලාශ්‍රය : young&cecb 2018

නව ප්‍රවාහන යෝජනා මඟින් නිසි පරිදි මාර්ග තදබදය අවම වනු ඇතැයි අපේක්ෂා කරන අතර හඳුනාගත් ස්ථානය තුළ සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ නමුත් මෙම සියලු යෝජනා තවමත් ප්‍රථමික අවධියේ පවතී.

සිතියම 5.7 : සැහැල්ලු දුම්රිය පද්ධතිය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



යෝජිත බස්නාහිර පළාත් සැහැල්ලු දුම්රිය සේවය

ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය :
මහානගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය හා JICA ව්‍යාපෘතිය , 2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

බස් ශ්‍රීඝ්‍රතා සංක්‍රාන්තික සේවය :

සැහැල්ලු දුම්රිය සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවුන හොත් එම ව්‍යාපෘතිය ට විකල්ප මාර්ගයක් ලෙස බස් ශ්‍රීඝ්‍රතා සංක්‍රාන්තික සේවයක් ඉහත සඳහන් කල ධාවන මර්ගයන් සඳහාම හඳුන්වා දීමට මෙම සැලැසුම හරහා යෝජනා කර ඇත.

කණු මතින් දිවෙන අධිවේගී මාර්ග :

මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කණු මතින් දිවෙන් අධිවේගී මාර්ගයක් නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා යෝජනා කර ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් කොළඹ නගරය හා එහා බැඳුන අනිකුත් උප නගර අතර ශක්තිමත් සම්බන්ධතාවයක් පවත්වාගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. මහ නගර ව්‍යාපෘතිය ට අනුව කොස්වත්ත, මාලඹේ සහ රාජගිරිය යන නගරවල පිවිසුම් ස්ථාන පිහිටු වීමට යෝජනා වී ඇත. (වික්‍රමසේකර, 2016).

අදියර 01 - NKM සිට රාජගිරිය දක්වා	
සමස්ත දිග	6.9 km
මාර්ග අනතියේ දිග	3.6 km
රථවාහන ගමන්කරන මංතීරුවේ පළල	25.4 km
රථවාහන ගමන්කරන මංතීරු ප්‍රමාණය	4 km
මංතීරුවක පළල	3.5 km

Phase II: Rajagiriya to Athurugiriya	
සමස්ත දිග	10.4 km
රථවාහන ගමන්කරන මංතීරුවේ පළල	25.4 km
රථවාහන ගමන්කරන මංතීරු ප්‍රමාණය	4 km
මංතීරුවක පළල	3.5 km

වගුව 5.4 : කණු මත දිවෙන අධිවේගී මාර්ගයේ විස්තර
මූලාශ්‍රය : www.mohsl.gov.lk/web/images/stories/project

විදුලි දුම්රිය ව්‍යාපෘතිය :

ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් කැළණිවැලි දුම්රිය මාර්ගය කිලෝමීටර 60 ක දුර ප්‍රමාණයක් විද්‍යුතන කිරීමට කටයුතු කර ඇත.



සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතිය
ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
සහ JICA විසින් සපයනලදී , 2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිශේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 5.8 : කඩු මග දිගෙන නාගරික අධිවේගී මාර්ගය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 3 : සියලු ප්‍රවාහන මධ්‍යයන් සම්බන්ධ කිරීම සඳහා බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන ඇදුනවා දීම.

බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණ වන්නේ විවිධ ප්‍රවාහණ මාදිලි ඒකාබද්ධ කිරීමෙන් ප්‍රවාහන ජාලය සංවර්ධනය සඳහා උපරිම දායකත්වය ලබා ගැනීමයි. ඒ අනුව, පහත ප්‍රදේශවල බහුවිධහුවමාරු ප්‍රවාහන මධ්‍යස්ථාන පිහිටවීමට යෝජනා කර ඇත.

- කොට්ටාව
- කොස්වත්ත
- කඩුවෙල

කොට්ටාවා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය

මහා කොළඹ නාගරික බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘති යේ නගර සංවර්ධ උපාය මාර්ගය විසින් කොට්ටාවා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය පර්චස් 1874 ක භූමි ප්‍රමාණයකින් ආරම්භ කරන ලදී. පිටත රවුම් අධිවේගී මාර්ගයෙන් සහ කැළණි වැලි දුම්රිය මාර්ගයෙන් යෝජිත උතුරු-දකුණු කනුමතින් දිවෙන දුම්රිය මාර්ග ව්‍යාපෘතිය වෙත පැමිණෙන බස් රථ සම්බන්ධ කරයි. මෙමඟින් මඟීන්ට පහසුකම් සැලසෙන අතර ප්‍රදේශයේ සංවර්ධනය ඉහළ නංවනු ඇත.

අංකය	භූමි පරිහරණය	ප්‍රමාණය
1	කර්මාන්ත	88.5
2	කර්මාන්ත	162.6
3	රථවාහන ගාල්කර තබා පිටත්විය හැකි ස්ථාන	120.2
4	බස්රථ නවත්වන පර්යන්ත තවදුරටත් ව්‍යාප්ත කිරීම	49.1
5	බස්රථ නවත්වන පර්යන්ත හා පොදු අවකාශ	168.5
6	වාණිජ භාවිතයන්	227.4
7	වාණිජ භාවිතයන්	181.6
8	වාණිජ භාවිතයන්	131.9
9	විවේක කටයුතු සඳහා වෙන්කරන ලද ස්ථාන	57.7
10	මිශ්‍ර භාවිතයන්	232.5
11	මිශ්‍ර භාවිතයන්	420.7
12	දුම්රිය නැවතුම් පොළ	34.0

වගුව 5.5 : මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානයේ ඉඩම් පරිහරණ සංයුතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සිතියම 5.9 : අගනගරයෙහි බහු ප්‍රවාහන මධ්‍යස්ථානවල ස්ථාන

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන
අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිසරීක්ෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



රූපය 5.9: මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

කොස්වත්ත බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානය

කොස්වත්ත බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානය තුළ තුන් ආකාරයකින් යුක්ත වූ ප්‍රවාහන මාධ්‍යයන් සම්බන්ධ කිරීමට යෝජනා කර ඇති අතර එම මාධ්‍යයන් ලෙස මහා මාර්ග, සැහැල්ලු දුම්රිය මාර්ග, කණු මතින් දිවෙන මහා මාර්ග දැක්විය හැක. තවද කොස්වත්ත මංසන්ධිය අවටින් අක්කර 6 කින් යුත් භූමි ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.



රූපය 5.10: කොස්වත්ත බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන ස්ථානය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

කඩුවෙල බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානය

කඩුවෙල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, අධිවේගී මාර්ගය ආසන්නයේ පිහිටා තිබීම සහ මාලඹේ සිට කඩුවෙල දක්වා යෝජිත සැහැල්ලු දුම්රිය සේවය සඳහා වඩා සුදුසු බව හඳුනාගෙන ඇත.



රූපය 5.11: කඩුවෙල බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන ස්ථානය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

5.6 ප්‍රවාහන උපායමාර්ගික සැලසුමේ මාර්ග පළල් කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඇතිවෙන්නා වූ බලපෑම්

1. පොදු ප්‍රවාහන සේවාවන් භාවිත කරන මඟින් සංඛ්‍යාව 2035



සිතියම 5.10 : 2035 දී පොදු ප්‍රවාහන මඟී පරිමාව
මූලාශ්‍රය : කොළඹ ප්‍රධාන සැලැස්ම - නාගරික සංවර්ධන අධිකාරිය

STRDA මොඩලය මගින් සිදුකල විස්තරාත්මක අධ්‍යනයට අනුව මාර්ග පුළුල් කිරීමේ යෝජනා අනාගතයේදී ක්‍රියාවට නැන්වීමතුළින්හයිලෙවල් හා නව නුවර මාර්ගය තුළ අධික භාවිතයක් පැවතිය හැකි මාර්ග ලෙස පෙන්නුම් කරනු ලබයි. එමෙන්ම Com Trans ව්‍යාපෘති යේ දත්ත අනුවද මෙම ප්‍රදේශයේ අධික මාර්ග තදබදයක් ඇති මාර්ගය ලෙස නව නුවර මාර්ගය හඳුනාගෙන ඇත.කෙසේ වෙතත් මෙම අධ්‍යනය මගින් වසර 2035 වනවිට හයිලෙවල් මාර්ගය දෙසට වාහන තදබදය සංචලනය වීමේ ප්‍රවනතාවක් ඇතිවන බවට පෙන්නුම් කරයි. එම නිසාම අගනගර සංවර්ධන සැලසුම තුළ විශේෂයෙන් වාණිජ තිරයතුළ ක්‍රමානුකූල පොදු ප්‍රවාහන සේවයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය මතුව පවතී.

2. 2035 දී පරිමා ධාරිතා අනුපාතය හා රථවාහන ප්‍රමාණය

V / c අනුපාතය, සන්තෘප්තියේ ප්‍රමාණය ලෙසද හැඳින්වේ, වාහන ඉල්ලුමට සරිලන පරිදි මංසන්ධියක ඇති ප්‍රමාණවත් බව නිරූපණය කරයි. V / c අනුපාතය 0.85 ට වඩා අඩුවෙන් පෙන්නුම් කරන්නේ ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවත් වාහන සැලකිය යුතු පෝලිම් හා ප්‍රමාදයන් අත්විඳිය නොහැකි බවත්ය. V / c අනුපාතය 1.0 ට ළඟා වන විට, ගමනාගමන ප්‍රවාහය අස්ථාවර විය හැකි අතර ප්‍රමාද සහ පෝලිම් තත්වයන් ඇතිවිය හැකිය. ඉල්ලුම ධාරිතාව ඉක්මවා ගිය පසු (v / c අනුපාතය 1.0 ට වඩා වැඩි), ගමනාගමන ප්‍රවාහය අස්ථායි වන අතර අධික ප්‍රමාදයක් සහ පෝලිම් බලාපොරොත්තු වේ. මෙම තත්වයන් යටතේ, වාහනවලට මංසන්ධිය හරහා ගමන් කිරීමට තනි චක්‍රයකට වඩා අවශ්‍ය විය හැකිය (එය චක්‍රීය අසමත්වීමක් ලෙස හැඳින්වේ). සැලසුම් අරමුණු සඳහා, සාමාන්‍යයෙන් වර්ෂයේ උපරිම පැය සඳහා (සාමාන්‍යයෙන් අවුරුදු 20 ක් ඉක්මවා) 0.85 සහ 0.95 අතර v / c අනුපාතය භාවිතා වේ. පුළුල් වීදි හරස් මාර්ග හා සම්බන්ධ පදිකයින්ට ඍණාත්මක බලපෑම්, වේගවත් වීමේ හැකියාව, ඉඩම් පරිහරණ බලපෑම් සහ පිරිවැය හේතුවෙන් මංසන්ධියක් සඳහා අධික ලෙස සැලසුම් කිරීම වළක්වා ගත යුතුය (Transportation, 2004, STRDA මොඩලයේ V / c අනුපාතයේ ප්‍රක්ෂේපනයට අනුව පැහැදිලි වනුයේ නව මාර්ග වැඩිදියුණු කිරීම් සමඟ වුවද මාර්ග වලින් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් මාර්ගවල ධාරිතාව ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින් මාර්ග පුළුල් කිරීමට සමාන්තරව ප්‍රදේශයේ පොදු ප්‍රවාහන ක්‍රමය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ

No.	KPIs	2020	2020_rv	2035	2035_rv
1	Pax-km (bn. pax-kms /year)	50.8	51.0	67.8	67.5
2	Pax-hr (bn. pax-hr /year)	2.23	2.26	3.55	3.41
3	VOT (bn. Rs. /year)	496	505	825	799
4	Veh-km (bn. veh.-km /year)	15.88	15.95	19.12	19.02
5	VOC (bn. Rs. /year)	593	599	801	792
6	වේගය (km/h)	22.8	22.5	19.1	19.8
7	S (bn. Rs. /year)	1,089	1,104	1,625	1,591
8	ප්‍රවාහන ඝුම්මරුව සඳහා එතුල් වන්න වූ මඟින් ප්‍රමාණය (mn.)	0.73	0.73	0.73	0.73
9	CO2 විමෝචනය (mn. ton/year)	3.14	3.16	4.12	4.08
10	CO2 විමෝචනය (bn. Rs. /year)	7.7	7.8	10.1	10.0
11	අනතුරු නැතිවීම (bn. Rs. /year)	9.2	9.3	11.1	11.0
මුළු වියදම (bn. Rs. /year)		**1,110**	**1,125**	**1,651**	**1,617**

වගුව 5.6 : 2035 දී පොදු ප්‍රවාහන මගී පරිමාව
මූලාශ්‍රය : අගනගර සැලැස්මේ මාර්ග පුළුල් කිරීමේ යෝජනා වල KPI දර්ශකය - 2018



සිතියම 5.11 : පරිමා ධාරිතා අනුපාතය සහ ගමනාගමන පරිමාව - 2035
මූලාශ්‍රය : කොළඹ ප්‍රධාන සැලැස්ම - නාගරික සංවර්ධන අධිකාරිය

3. මාර්ග පුළුල් කිරීම හා අවකාශීය සංකලනය

මාර්ග පුළුල් කිරීමේ හා නව මාර්ග සංවර්ධනය තුළින් පමණක්ම රථ වාහන තදබදය පූර්ණ වශයෙන් අඩිරූ වුවද, අගනගරය සඳහා වූ යෝජිත අවකාශීයිය ව්‍යුහය යථාර්තයක් බවට පත් කරගැනීමට එමඟින් හැකි වේ. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම, යෝජිත මංසන්ධි හා කොරිඩෝර සංවර්ධනයට ඍජුවම බලපාන බවට දැනට පවතින හා අනාගතයේ පැවතීමට අපේක්ෂා කරන අවකාශීය සංකලන අගයන් විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වේ.

මංසන්ධි සඳහා වූ ප්‍රමුඛත පිළිවෙල	මංසන්ධි	දැනට පවතින අවකාශීය සංකලනය	අනාගතයේ පැවතීමට අපේක්ෂා කරන අවකාශීය සංකලනය
පළමු	කොස්වත්ත - බත්තරමුල්ල	2 -2.5	2.5-3.7
	කොට්ටාව - මාකුඹුර		
දෙවන	මහරගම	2 -2.5	2.5-3.7
	නුගේගොඩ		
	රාජගිරිය		
තෙවන	කඩුවෙල	1.2-1.5	2-2.5
	මාලඹේ	2 -2.5	2.5-3.7
	කොටිකාවත්ත අංගොඩ		
	තලවතුගොඩ	2-2.5	2-2.5
සිවුවන	අතුරුගිරිය	2-2.5	2.5-3.7
	කොරතොට	1.2-1.5	1.2-1.5

වගුව 5.7 : පවත්නා සහ අපේක්ෂිත අවකශීය සාකල්‍යන අගයන් අතර වෙනස්කම්
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

යෝජිත සංවර්ධනය අපේක්ෂා කරන කොරිඩෝරයේ අවකාශීය සංකලන අගය a 2-2.5 සිට 2.5-3.7 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරයි. අනෙක් ප්‍රදේශයවල අවකාශීය සංකලන අගය 1.2-1.5 සිට -0.1-0.9 දක්වා සංයුතිය අඩු කිරීම අපේක්ෂා කරයි.



සිතියම 5.12 : අවකාශීය සාකලනය අගයන් මට්ටම - 2018

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අවකාශීය අනුකලනය - 2018
අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 5.13 : අවකාශීය සාකල්‍යතා අගයන්හි අපේක්ෂිත මට්ටම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ජීවනය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



අවකාශීය අනුකලනයේ අපේක්ෂිත මට්ටම
අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරීක්ෂණ හා පුහුණු අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

4. මාර්ග පුළුල් කිරීම සහ ඉඩම් වටිනාකම විචල්‍ය වීම

වෙනස්වන අනුකලන සංකලන මට්ටම්, තෝරාගත් ප්‍රදේශවල ඉඩම් වටිනාකම සහ 2030 වන විට ප්‍රදේශයේ ප්‍රමුඛතා මංසන්ධි, ඝනත්වයන් සහ කලාප ළඟා කර ගැනීමට සහාය වනු ඇත. පවත්නා හා යෝජිත ඉඩම් වටිනාකම් සිතියම් වලට අනුව, වත්මන් අඩු ඝනත්ව සහ මධ්‍යස්ථ ඝනත්ව ප්‍රදේශ වල ඉඩම් වටිනාකම වැඩි අගයක් ලබා ගනී. එසේම මෙම අභිප්‍රේරණය මගින් තෝරාගත් ප්‍රදේශවල තීව්‍ර වූ නේවාසික හා වාණිජ සංවර්ධනය දිරිමත් කරනු ඇත.

රාජගිරිය සහ නුගෙගොඩ අගනගරයේ ඉහළ වෙළඳපල වාණිජ ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මෙම මධ්‍යස්ථාන දෙකෙහි ඉහළ ඉඩම් වටිනාකම් ඉහළ මට්ටමේ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රවණතාවක් ඇත. කොටිකාවත්ත - අංගොඩ, මාලඹේ සහ කඩුවෙල, හඳුනාගත් කොරිඩෝ තුනක් නව ස්වභාවයකින් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. අඩු ඉඩම් වටිනාකම් සහිත අතුරුගිරියා සහ කොරතොට වැනි පර්යන්ත ප්‍රදේශ අගනගරයේ අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව නේවාසික සංවර්ධනය දිරිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.



සිතියම 5.14 : ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගයෙන් බලපෑමකින් තොරව ඉඩම් වටිනාකමෙහි ව්‍යාප්තිය - 2018
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 5.15 : ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගයේ සම්පූර්ණ බලපෑම සමඟ ඉඩම් වටිනාකමෙහි ව්‍යාප්තිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සැලසුම් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ප්‍රවාහන සංවර්ධන උපායමාර්ගයේ බලපෑම මත ඉඩම් වටිනාකමහි ව්‍යාප්තිය අගනගර සංවර්ධන සැලැස්ම	දත්ත මූලාශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය	සැකසුම : බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සැලසුම් අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



06

ජනාවාස උපායමාර්ගික සැලසුම

06 පරිච්ඡේදය
ජනාවාස උපායමාර්ගික සැලසුම

හැඳින්වීම

අරමුණු හා පරමාර්ථ

ප්‍රවේශය

ජනාවාස උපාය මාර්ගයෙහි විෂය පථය

6.1. හැඳින්වීම

ජනාවාස සැලැස්ම සඳහා පදනම් වී ඇත්තේ, නේවාසික ජනගහනයේ අනාගත වර්ධනයේ අවකාශීය ව්‍යාප්තියයි. එමඟින් විශේෂිත භූගෝලීය ප්‍රදේශයක් තුළ නිශ්චිත කාලසීමාවක් ඇතුළත වාසය කරන ප්‍රතික්ෂේපිත සහ ඇස්තමේන්තුගත ජනගහනය පදනම් කොටගෙන භූමි පරිහරණ රටාවට අත්‍යවශ්‍ය අංග ඇතුළත් කරමින් සැලසුම් කිරීම, භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මඟින් නේවාසික කලාපවල සංවර්ධනය විධිමත් කිරීම සඳහා පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

6.1.1. අරමුණු හා පරමාර්ථ

සමෘද්ධිමත්, මනා කාර්යක්ෂම හා ඵලදායී නාගරික පද්ධතියක් සහ සුහුරු නාගරික පහසුකම් තුළින් අගනගර ප්‍රදේශය ප්‍රවර්ධනය කිරීම අගනගර සැලැස්මෙහි ජනාවාස උපාය මාර්ගයෙහි මූලික අරමුණ වේ.

6.1.2. ප්‍රවේශය

මංසන්ධි හා මංමාවත්වලට නුදුරින් පිහිටි සංවර්ධනය නොවූ, සංවර්ධනය සඳහා සුදුසු භූමි ප්‍රගතිශීලි ආකාරයෙන් සංවර්ධනය කිරීම සහ පොදු ප්‍රවාහන මාර්ග සංවර්ධනය සඳහා මූලිකත්වය ලබාදීම මඟින් සමස්තසැලසුම් ප්‍රදේශයෙහිම මංසන්ධි හා මංමාවත් සංවර්ධනය සිදුකළ යුතුය. භූමි පරිහරණය කලාපීකරණය ප්‍රවර්ධනය කිරීම තුළින් තිරසාර සංවර්ධනයකින් යුතු සංයුක්ත, ජීවී, පදික හිතකාමී ජනාවාස හා හඳුනාගත් සෞඛ්‍ය හිතකාමී වාණිජ මංසන්ධි සංවර්ධනය කිරීම මඟින් මෙම ප්‍රවේශය තහවුරු කරගත හැකිය.

6.2. ජනාවාස උපාය මාර්ගයෙහි විෂය පථය

සැලසුම් රාමුව ආවරණය කරන උපාය මාර්ගවල පහත දැ ඇතුළත්ය :

- *ජනාවාස ප්‍රවර්ධන කලාපයන්හි නේවාසික පොකුරු සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම සහ අඩු පහසුකම් සහිත ජනාවාස කළමනාකරණය යන පුළුල් මැදිහත්වීම් දෙකකින් අගනගර සංවර්ධන සැලැස්මෙහි (2019 – 2030) ජනාවාස සංවර්ධන උපාය මාර්ගය සමන්විත වේ. මෙම මැදිහත් වීම් 2017 ජාතික නිවාස ප්‍රතිපත්තියට අනුකූලව සම්පාදනය කර ඇත.*

- *මෙම සැලැස්ම දැනට පවතින සමාජ ආර්ථික වාතාවරණය, තාක්ෂණයේ දියුණුව සහ ප්‍රක්ෂේපිත සමාජ ජනගහන තත්ත්වයන් ආදියෙහි පවතින තොරතුරු මත පදනම් වී ඇත. ඕනෑම අනපේක්ෂිත හා පෙර නොවූ විරූ සිදුවීම් හෝ තත්ත්වයන් කාලෝචිත මැදිහත්වීම්කින් විසඳිය යුතුය.*

- *අගනගර සංවර්ධන සැලැස්මෙහි මෙම කොටසෙහි යෝජනා කර ඇති සියලු උපාය මාර්ග ව්‍යාපෘති, සැලසුම් ප්‍රදේශය සඳහා පරිච්ඡේද අංක 01 හි සඳහන් කාලවකවානුවලට අනුකූලව භාරදීමට අපේක්ෂා කෙරේ. මෙම කාලසීමාව ඉක්මවා යන තත්ත්වයක් අගනගර සංවර්ධන සැලැස්ම කාලීනව යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.*

සිතියම 6.1 : ජනාවාස උපායමාර්ගික සැලැස්මේ සංයුක්ත සිතියම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරවේදය හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සංයුක්ත සිතියම
ජනාවාස සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිසරවේදය හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

6.3. ජනාවාස සංවර්ධනයෙහි උපාය මාර්ගික මැදිහත්වීම

ජනාවාස උපාය මාර්ගය ප්‍රධාන අංශ 02 ක් මත රඳා පවතී.

1. ජනාවාස පොකුරු සංවර්ධනය
2. අඩු පහසුකම් සහිත ජනාවාස කළමනාකරණය

උපාය මාර්ගික මැදිහත්වීම 1 : ජනාවාස පොකුරු සංවර්ධනය

අගනගර සංවර්ධන සැලැස්මෙහි සමස්තබල ප්‍රදේශයම මිශ්‍ර සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා පහසුකම් සපයයි. ඒ අනුව,පහත පරිදි ප්‍රධාන නේවාසික භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පොකුරු තුනක් හඳුනාගෙන ඇත.

අ. අධි ඝනත්ව පොකුර - *I*
ආ. අධි ඝනත්ව පොකුර - *II*
ඇ. අඩු ඝනත්ව පොකුර

අධි ඝනත්ව පොකුර 1

පොකුර 01 : අධි ඝනත්ව පොකුර 1

භෞතික පරිසරයේ අපේක්ෂිත ස්වරූපය

යෝජිත අගනගර වියුහයෙහි ඇතුලු නගරයෙහි කොටසක් අධි ඝනත්ව පොකුරු I සඳහා වෙන්කර ඇත. එහි මූලික අරමුණ, මධ්‍යම ඝනත්ව නේවාසික කලාපයක් තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ආකර්ශණීය ආකාරයෙන් පහසුකම් සැපයීම වේ. මෙම සැලැස්ම මඟින් නෙත්බිමි විවෘත කිරීම තුළින් ප්‍රදේශයට අලංකරණයක් එක් කිරීමටද අපේක්ෂා කෙරේ.

මෙහි මැදිහත්වීමට ප්‍රධාන අරමුණු තුනකට වර්ගීකරණය කළ හැකිය. එනම්, ***යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පාරිසරික වැඩිදියුණු කිරීම සහ ධනවත් ප්‍රජාවකට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.***

භෞතික සීමාවන්

උතුරින් ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මාර්ගය
දකුණින් උඩහමුල්ල දුම්රිය මාර්ගය
නැගෙනහිරින් අරය කිලෝමීටර් 1.5 ක් වන විශේෂිත පාර්ලිමේන්තු කලාපය
බටහිරින් කෝට්ටේ වගුරු බිම

අපේක්ෂිත සංවර්ධනය සඳහා වන භෞතික ප්‍රමිතීන්

නිවාස ඝනත්වය : වර්ෂ 2030 සඳහා හෙක්ටයාර 01 කට නිවාස සංඛ්‍යාව 15 කි.
ජනගහන ඝනත්වය : වර්ෂ 2030 සඳහා හෙක්ටයාර 01 කට ජනගහනය පුද්ගලයින් 63 කි.



සිතියම 6.2 : අධි ඝනත්ව පොකුරු I - ජනාවාස උපායමාර්ගික සැලැස්ම
මූලාශ්‍ර : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අධි ඝනත්ව පොකුරු I ජනාවාස සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම	දත්ත මූලාශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය	සැකසුම : බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය	නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018

මාර්ග සංවර්ධනය :

උපායමාර්ග ව්‍යාපෘති 1 : ශ්‍රී ජයවර්ධනපුර මාවත සිට බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගය දක්වා ප්‍රධාන සම්බන්ධතාවය ඇති කිරීම.

මෙම මාර්ගයෙහි මූලික අරමුණ වන්නේ, අධි ඝනත්ව පොකුරු I ප්‍රදේශය සඳහා ප්‍රධාන සම්බන්ධතා මාර්ගයක් වශයෙන් පහසුකම් සැපයීමයි. මෙම මාර්ගය මඟින් පරිපාලන පොකුරු ප්‍රදේශය හා අධි ඝනත්ව නේවාසික පොකුරු I ප්‍රදේශය අතර ප්‍රධාන සම්බන්ධතා මාර්ගයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සම්බන්ධතා මාර්ගය සංවර්ධනය කිරීම මූලික වශයෙන් පහත මාර්ග සම්බන්ධ කරගනිමින් සිදුකරනු ලබයි. එනම්, ශ්‍රී ජයවර්ධනපුර මාවත, පන්නිපිටිය බත්තරමුල්ල මාර්ගයට සම්බන්ධ කිරීම සිදුවන්නේ, කෝට්ටේ පාර (B120), පරණ කොට්ටාව පාර (B291), තලපත්පිටිය පාර (B530) සහ නව රෝහල් පාර සම්බන්ධ කිරීම තුළිනි. මෙම මාර්ගයෙහි සමස්තදිග කිලෝමීටර් 8.8 ක් පමණ වන අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ රෙගුලාසිවලට අනුකූලව මාර්ගයේ හඳුනාගත් ප්‍රදේශයන්හි වාහන නැවැත්වීම සඳහා පහසුකම් සැපයීම සිදුකිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම මාර්ගය දෙපස පදික හිතකාමී අයුරින් සංවර්ධනය කිරීමටද අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 2 : පවතින පාගොඩ මාර්ගය නුගේගොඩ සිට තලවතුගොඩ දක්වා වැඩිදියුණු කිරීම.

මෙහි මූලික අරමුණ වන්නේ, මතුවෙමින් පවතින ඉල්ලුම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම මඟින් ආකර්ශණීය සංවර්ධනයක් අපේක්ෂා කිරීමයි. මෙම මාර්ගයේ සමස්තදිග කිලෝමීටර් 6.4 ක් පමණ වන අතර, මංතීරු හතරක් සහිත මාර්ගයක් වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.



රූපය 6.1: යෝජිත නව මාර්ග සබඳතා පිටපත
මූලාශ්‍රය : Google Earth, 2018

නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය :

උපායමාර්ග ව්‍යාපෘති 3 : පිටකෝට්ටේ මංසන්ධිය හා ඇඹුල්දෙණිය මංසන්ධිය වැඩිදියුණු කිරීම

පිටකෝට්ටේ සහ ඇඹුල්දෙණිය මංසන්ධිය මූලික සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කරමින් නේවාසික ප්‍රජාව සඳහා පහසුකම් සැපයීම මෙහි මූලික අරමුණයි. පිටකෝට්ටේ මංසන්ධියේ සිරිකොතට යාබදව පවතින අක්කර 0.40 ක පමණ ප්‍රදේශයක සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සහ මීටර් 500 ක් දක්වා මංසන්ධියෙහි මුහුණත පෙනුම නාගරික සැලසුම් සැලැස්ම හා ඒකාබද්ධව වැඩිදියුණු කිරීම මූලිකව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව හා එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, ඊට අවශ්‍ය අරමුදල් මහා භාණ්ඩාගාරය හරහා ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

සංරක්ෂණය :

උපායමාර්ග ව්‍යාපෘති 4 : කෝට්ටේ වගුරුබිම පරිසර හිතකාමී ස්වභාවික උද්‍යාන යක් ලෙස ප්‍රවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘති යේ මූලික අරමුණ කෝට්ටේ වගුරු බිමෙහි සෞන්දර්යාත්මක වටිනාකම ආරක්ෂා කරගනිමින් අධි ඝනත්ව නේවාසික පොකුරු - I කලාපය සඳහා නේවාසික ජනගහනය වඩාත් ආරක්ශණය කරගැනීමයි.

මෙහිදී, පරිසර හිතකාමී පාවෙන අවන්හලක්, පරිසර හිතකාමී ලැගුම්හලක්, කුරුල්ලන් නැරඹුම් කුළුණු සහ වගුර බිම හරහා ගමන් කළ හැකි පරිසර හිතකාමී පදික මංතීරු එක් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්මෙහි දෙවන අදියර (2031 – 2040) යටතේ නාගරික සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව එක්ව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 5 : මුන්වනායක උද්‍යාන මාර්ගය හා ශ්‍රී ජයවර්ධනපුර මාවත දක්වා දිගු කිරීම

කෝට්ටේ වගුරු බිමෙහි සෞන්දර්යාත්මක අගය සංරක්ෂණය කරගනිමින්, නව හරිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් නේවාසික ජනගහනය මෙම කලාපයට ආකර්ශණය කරගැනීම මෙහි මූලික අරමුණ වේ. එමෙන්ම මෙම හරිත මාර්ගය වගුරු බිමෙහි සිදුවන අනවසර ඉදිකිරීම් සඳහා උපාය මාර්ගික විසඳුමක්ද වනු ඇත. (රූපය 70 : කෝට්ටේ වගුරු බිමෙහි පවතින තත්ත්වය)

මෙම මාර්ගයෙහි සමස්තදිග ප්‍රමාණය කිලෝමීටර් 3.4 ක් පමණ වනඅ තර, එක් මංතීරු මාර්ගයක් වශයෙන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක සැලැස්මෙහි දෙවන අදියර (2031 – 2040) යටතේ සංවර්ධනය කිරීමට යෝජනා වී ඇත.





රූපය 6.2: කෝට්ටේ නෙත්බිම් හි වර්තමාන තත්වය
මූලාශ්‍රය : Google විදි දර්ශන - 2018





රූපය 6.3: යෝජිත නව මාර්ග සබඳතා පිටපත
මූලාශ්‍රය : www.midlandsinbusiness.com/2017/07

ව්‍යාපෘති වර්ගය	ව්‍යාපෘති කේතය	උපාය මාර්ගික ව්‍යාපෘතිය
මාර්ග වැඩිදියුණු කිරීම	SII-T-5	පවතින පාගොඩ මාර්ගය නුගේගොඩ සිට තලවතුගොඩ දක්වා වැඩිදියුණු කිරීම.
මාර්ග සංවර්ධනය	SII-T-5	ශ්‍රී ජයවර්ධනපුර මාවත සිට බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගය දක්වා ප්‍රධාන සම්බන්ධතා මාර්ගයක් ඇති කිරීම.
නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය	SIII-S6	පිටකෝට්ටේ මංසන්ධිය වැඩිදියුණු කිරීම.
සංරක්ෂණය	SII-W- 7	කෝට්ටේ නෙත්බිම පරිසර හිතකාමී ස්වභාවික උද්‍යාන යක් ලෙස ප්‍රවර්ධනය කිරීම. මුන්චනායක උද්‍යාන මාර්ගය ශ්‍රී ජයවර්ධනපුර මාවත දක්වා දිගු කිරීම.

වගුව 6.1 : නේවාසික සංවර්ධන පොකුරු I - උපාය මාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන අංශය, නා.සං.අ. - 2018

අධි ඝනත්ව පොකුරු II

පොකුර 02 : අධි ඝනත්ව පොකුර 2

භෞතික පරිසරයේ අපේක්ෂිත ස්වරූපය

යෝජිත අගනගර ව්‍යුහයෙහි පිටත නගරයෙහි කොටසක් අධි ඝනත්ව පොකුරු II ඝඳහා වෙන්කර ඇත. මෙම ප්‍රදේශයෙහි මූලික වශයෙන්ම බහු මහල් නේවාසික සංවර්ධනයක් අපේක්ෂා කරන අතරම, නෙත්බිම් විවෘත කිරීම නිසින් ලබාගත හැකි ස්ථානීය වාසිය සඳාධිපත්‍ය සංවර්ධනයන් සඳහා ලබාදීමට අපේක්ෂා කෙරේ. නවදුරටත් මෙම කලාපය යෝජිත ***පරිපාලන නගරයෙහි*** (Administrative City) ***සහ දැනුම නගරයෙහි*** (Knowledge City) සේවකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීමටද අපේක්ෂා කෙරේ.

භෞතික සීමාවන්

උතුරින් හෝකන්දර මාර්ගය
දකුණින් කැළණි වැලි දුම්රිය මාර්ගය
නැගෙනහිරින් පිටත වටරවුම් අධිවේගී මාර්ගය
බටහිරින් තලන්ගම වගුරු බිම සහ නෙත්බිම් ආසන්නයේ දිවෙන කොටිටාව - බත්තරමුල්ල මාර්ගය

අපේක්ෂිත සංවර්ධනය සඳහා වන භෞතික ප්‍රමිතීන්

නිවාස ඝනත්වය : වර්ෂ 2030 ඝඳහා හෙක්ටයාර 01 කට නිවාස සංඛ්‍යාව 15 කි.
ජනගහන ඝනත්වය : වර්ෂ 2030 ඝඳහා හෙක්ටයාර 01 කට ජනගහනය පුද්ගලයින් 46 කි.



සිතියම 6.3 : අධි සනත්ව පොකුරු II - ජනාවාස උපායමාර්ගික සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

මාර්ග සංවර්ධනය :

පවත්නා මාර්ග ජාලයෙහි පවතින සුවිශේෂී ස්වභාවය සහ සාමකාමී වාතාවරණය සංරක්ෂණයට සහයෝගය දක්වන නමුත්, දැනට පවතින මාර්ග, අවට ප්‍රදේශයන් සමඟ ශක්තිමත් ජාලකරණ අවස්ථාවන් ලබා නොදෙන බව පැහැදිලි වේ. එම නිසා මාර්ග වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් උපාය මාර්ගික මැදිහත්වීම පහත දැක්වේ.

උපායමාර්ග ව්‍යාපෘති 6 : පවත්නා කොට්ටාව - මාලඹේ මාර්ගය වැඩිදියුණු කිරීම.

යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් මතුවන ඉල්ලුමට අවශ්‍ය පහසුකම් සපයමින්, ආකර්ශණීය සංවර්ධනයක් සිදු කිරීම මෙහි මූලික අරමුණයි. මෙම මාර්ගය කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා දැනුම නගරය අතර ප්‍රධාන සම්බන්ධතා මාර්ගයක් වශයෙන් යෝජනා වේ. මෙම මාර්ගයෙහි සමස්තදිග ප්‍රමාණය කිලෝමීටර් 6.7 ක් පමණ වේ. මෙම මාර්ගය 2019 – 2030 දී ක්‍රියාත්මක උපාය මාර්ගයෙහි පළමු අදියරෙහිදී ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 7 : හෝකන්දර මාර්ගය කොස්කඳවිල මංසන්ධිය දක්වා වැඩිදියුණු කිරීම.

පරිපාලන නගරයෙහි පවතින නේවාසික සංවර්ධනය මෙම කලාපයට ආකර්ශණය කරගැනීම මෙහි මූලික අරමුණ වේ. මෙම මාර්ගය ඉඩම් පරිහරණ උපාය මාර්ගයෙහි මඟින් හඳුනාගත් ප්‍රධාන කොරිඩෝ අතෙන් එකී කොරිඩෝවට අයත් කොටසක් වන අතරම, පරිපාලන නගරය හා නේවාසික කලාපය සම්බන්ධ කරන ප්‍රධාන මාර්ගය වේ. මෙහි සමස්තදිග ප්‍රමාණය කිලෝමීටර් 3.9 ක් පමණ වන අතර, මෙම මාර්ගය මංතීරු හතරක් සහිතව සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන ව්‍යාපෘතිය 2019 – 2030 දී ක්‍රියාත්මක උපාය මාර්ගයෙහි පළමු අදියර යටතේ සංවර්ධනය කිරීමටද අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 8 : කළල්ගොඩ මාර්ගය වැඩිදියුණු කිරීම

යෝජිත පාරිපාලන නගර කලාපය හා අධි ඝනත්ව නේවාසික පොකුරු II කලාපය අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතිය සඳහා අරමුණු කර ඇත. මෙහි සමස්තදිග ප්‍රමාණය කිලෝමීටර 02 ක් පමණ වන අතර, මංතීරු 02 ක් සහිත ඉදිකිරීමට යෝජනා කර ඇත. මෙම මාර්ගයද ක්‍රියාත්මක උපාය මාර්ගයෙහි පළමු අදියර යටතේ වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත.

නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය :

උපායමාර්ග ව්‍යාපෘති 9 : හෝකන්දර නගර සංවර්ධනය

ඉඩම් භාවිතය පිළිබඳ උපාය මාර්ගයෙහි 04 වන ප්‍රමුඛතා නගරයක් ලෙස හෝකන්දර නගරය හඳුනාගෙන ඇත. ආයෝජකයන් දිරිගන්වමින් මෙම කලාපයේ නේවාසිකයින්හට පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘති යේ අරමුණු වේ. මෙම නගර සංවර්ධනය මඟින් කුඩා උද්‍යාන අවන්හල් සාප්පු සංකීර්ණ හෝකන්දර නගරය ඇතුළුව හෝකන්දර නගරයේ අක්කර 7.5 ක පමණ ප්‍රදේශයක් නැවත සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක උපාය මාර්ගයෙහි තෙවන අදියර (2019 – 2050) යටතේ මහරගම නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.

ජනාවාස සංවර්ධනයෙහි උපාය මාර්ගික මැදිහත්වීම

උපාය මාර්ගික මැදිහත්වීම 1 : ජනාවාස පොකුරු සංවර්ධනය

අධි ඝනත්ව පොකුරු II



1. Commercial Redevelopment (7.5 acre) with grocery stores, drug stores, beauty salons, restaurants, small clothing stores, fuel services and cinema halls along Hokandara-Kottawa Road and Wanaguru Mw
2. Upgrade Hokandara- Wanaguru Mw to sub Arterial road
3. Service Road for Commercial Area
4. Upgrade Hokandara-Kottawa Road to an Arterial road
5. Hokandara Community Park (1.1 acre)

රූපය 6.4: හෝකන්දර නගරයේ අපේක්ෂිත සංවර්ධනය
මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම මඟින් යෝජිත ගූගල් සිතියමෙහි දළ සටහන - 2018

ව්‍යාපෘති වර්ගය	ව්‍යාපෘති කේතය	උපාය මාර්ගික ව්‍යාපෘතිය
මාර්ග සංවර්ධනය	SI-T-5	පවන්නා කොට්ටාව - මාලඹේ මාර්ගය සංවර්ධනය කිරීම.
	SII-T-5	හෝකන්දර මාර්ගය කොස්කඳවිල මංසන්ධිය දක්වා සංවර්ධනය කිරීම.
	SII-T-7	කලල්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම.
නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය	SII-T-7	හෝකන්දර නගරය සංවර්ධනය.

වගුව 6.2 : නේවාසික සංවර්ධන පොකුරු II - උපාය මාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන අංශය, නා.සං.අ. - 2018

06 පරිච්ඡේදය
ජනාවාස උපායමාර්ගික සැලසුම

ජනාවාස සංවර්ධනයෙහි උපාය මාර්ගික මැදිහත්වීම

උපාය මාර්ගික මැදිහත්වීම 1 : ජනාවාස පොකුරු සංවර්ධනය

අඩු ඝනත්ව පොකුර

අඩු ඝනත්ව පොකුර

පොකුර 03 : අධි ඝනත්ව පොකුර

භෞතික පරිසරයේ අපේක්ෂිත ස්වරූපය

යෝජිත අගනගර ව්‍යුහයෙහි පර්යන්ත කලාපය ලෙස අඩු ඝනත්ව පොකුරු සැලැස්මට අයත් ප්‍රදේශය හඳුන්වාදිය හැක. නේවාසික ජනගහනයට අවම වශයෙන් විනාඩි 20 ක දුරක් ඇතුළත පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් අඩු ඝනත්ව නේවාසික පොකුරු ප්‍රදේශය සැලසුම් කර ඇත. එනම්, සැලැස්මෙහි එක් සේවා මධ්‍යස්ථානයක් කිලෝමීටර් 05 ක අරය තුළ ජීවත්වන නේවාසික ජනගහනයට අවශ්‍ය දෛනික අවශ්‍යතා සපයමින් සේවා සැපයීමට අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන සේවා මධ්‍යස්ථාන 02 ක්ද, දෛනික සේවා සපයන මධ්‍යස්ථාන 15 ක්ද හඳුන්වා දී ඇත.

භෞතික සීමාවන්

උතුරින් කැළණි ගඟ
බටහිරින් පිටත වටරවුම් අධිවේගී මාර්ගය
දකුණින් අලුත් පාර (A4 මාර්ගය)

අපේක්ෂිත සංවර්ධනය සඳහා වන භෞතික ප්‍රමිතීන්

නිවාස ඝනත්වය : වර්ෂ 2030 සඳහා හෙක්ටයාර 01 කට නිවාස සංඛ්‍යාව 13 කි.
ජනගහන ඝනත්වය : වර්ෂ 2030 සඳහා හෙක්ටයාර 01 කට ජනගහනය පුද්ගලයින් 50.

සිතියම 6.4 : අඩු ඝනත්ව පොකුරු ජනාවාස සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ සහ සංවර්ධන දිස්ත්‍රික්ක සාධාරණ සංවර්ධන අධිකාරිය - 2018



අඩු ඝනත්ව පොකුර
ජනාවාස සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා ප්‍රසුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජුනි මස 2018

ඒකකය	මංසන්ධි වර්ගය
අතුරුගිරිය	නේවාසික මංසන්ධි
වල්ගම හන්දිය බරුවල විද්‍යාල හන්දිය පරණ හන්දිය	සේවා මංසන්ධි
රුක්මල්ගම නව නගරය බොරලුගොඩ රුක්මලේ නැගෙනහිර B	සේවා මංසන්ධි
වදුරමුල්ල	සේවා මංසන්ධි
කොරනොට	නේවාසික මංසන්ධි
තුන්ඇඳඇඟේන හන්දිය	සේවා මංසන්ධි
ගනේවත්ත	
Pahala Bomiriiya B	
පහළ බෝමිරිය	
නවගමුව	
දැදිගමුව	
පෝරේ	
රණාල	

වගුව 6.3 : නේවාසික උපාය මාර්ගයෙහි මංසන්ධි සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන අංශය, නා.සං.අ. - 2018

සියලුම සේවා මංසන්ධි සැලසුම් කිරීම “The Great Urban Neighborhood” අයත් පහත සඳහන් මූලික අංග අටක් පදනම් කරගෙන සිදුකර ඇත. (මූලාශ්‍රය:http://sf-planning.org/eightelement.great- neighborhood)

1. **සාප්පු සවාරි යාම** – *නිවසේ සිට පහසුවෙන් ගමන් කළ හැකි සාප්පු හා සේවා.*
2. **ආරක්ෂිත වීදි** – *ආරක්ෂිත පාරිසරික හිතකාමී වීදි*
3. **පහසුවෙන් ගමන් කළ හැකි බව** – *පහසුවෙන් ප්‍රදේශය වටා ගමන් කිරීමේ විවිධ ක්‍රම*
4. **නිවාස තෝරාගැනීමේ හැකියාව** – *විවිධ වූ නිවාස වර්ග*
5. **රැස්වීමේ ස්ථාන** – *මිනිසාට පහසුවෙන් රැස්වීමේ සහ කතා කිරීමේ පහසුකම්*
6. **නාගරික සේවා** – *පදිංචිකරුවන් සඳහා අවශ්‍ය පොදු සේවාවන් රැසක්*
7. **විශේෂ චරිත ලක්ෂණ** – *එයටම ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ*
8. **මුළු ප්‍රදේශයෙන්ම එක් අංගයක්** – *උසස් නේවාසික කලාප මතින් උසස් නගර බිහිවේ*

මාර්ග සංවර්ධනය :

උපාය මාර්ග ව්‍යාපෘති 10 : කඩුවෙල - හෝමාගම මාර්ගය වෙලේ හන්දියේ සිට හෝමාගම දක්වා සංවර්ධනය කිරීම

අඩු ඝනත්ව පොකුරු ප්‍රදේශය හරහා දිවෙන ප්‍රධාන මාර්ගය කඩුවෙල - හෝමාගම මාර්ගයයි. එම නිසා ප්‍රධාන උපාය මාර්ගික මැදිහත්වීමක් ලෙස කඩුවෙල - හෝමාගම මාර්ගය වෙලේ හන්දියේ සිට හෝමාගම දක්වා කිලෝමීටර් 10 ක දුරක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙමඟින් සියලු පහසුකම් සහිත ආකර්ශණීය නේවාසික වටපිටාවකින් සමන්විත සංවර්ධනයන් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

නේවාසික මංසන්ධි සංවර්ධනය :

උපාය මාර්ග ව්‍යාපෘති 11 : අතුරුගිරිය නේවාසික මංසන්ධි සංවර්ධනය

අගනගර සංවර්ධන සැලසුමට අනුව අතුරුගිරිය හතරවැනි ප්‍රමුඛතා නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, එය අඩු ඝනත්ව පර්යන්ත පොකුරු කලාපයේ ප්‍රධාන සේවා මධ්‍යස්ථානය ලෙස අවශ්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. එමඟින් අතුරුගිරිය ප්‍රදේශය තුළට නේවාසික ජලගහනය වඩ වඩාත් ආකර්ශණය කරගැනීමට මෙම සංවර්ධන ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ.

එපමණක් නොව වර්තමානයේ පවතින වාතාවරණයට අනුව වානිජ ක්‍රියාකාරකම් බොහෝමයක් ප්‍රධාන මාර්ගය ඔස්සේ රේඛීය ලෙස සංවර්ධනය කර ඇත. දැනට පවතින මාර්ග ජාලයේ ස්වභාවය හා මෙම ප්‍රවණතාවය මත අතුරුගිරිය නගරය මධ්‍යයේ රථවාහන තදබදයක් නිර්මාණය වී ඇත. මගී ජනතාව සඳහා වඩා හොඳ ප්‍රවාහන සේවාවන් සැපයීම සඳහා පොදු හා පෞද්ගලික අංශයන් මඟින් සපයනු ලැබුවද, මාර්ගය දෙපස රථවාහන ගාල් කිරීම, පටු මාර්ග ජාලය, මිනිසුන් සඳහා ආරක්ෂිත ප්‍රවේශයක් නොමැතිවීම නගර මධ්‍යයේ පවතින අධික තදබදයට නොමැතිවීම නගර මධ්‍යයේ පවතින අධික තදබදයට හේතුවයි.

ඒ අනුව, පිටත රවුම් අධිවේගී මාර්ගයේ අතුරුගිරිය අන්තර් හුවමාරුව ආසන්නයේ පිහිටි අක්කර 07 ක පමණ ඉඩමක්, අතුරුගිරිය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් දැනටමත් හඳුනාගෙන ඇත. එම ව්‍යාපෘතිය පහත අංගයන්ගෙන් සමන්විත වන අතර, එමඟින් පොදු මහජනයාට ප්‍රසන්න හා පහසු පරිසරයක් නගරය තුළ නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

- *මිශ්‍ර සංවර්ධනය (අක්කර 01, රූඩ් 01, පර්චස් 09 ක පමණ බිම් ප්‍රමාණයක්)*
- *බස් නැවතුම්පල (අක්කර 01, රූඩ් 02, පර්චස් 20 ක පමණ බිම් ප්‍රමාණයක්)*
- *පොළ සංවර්ධනය (අක්කර 01 ක පමණ බිම් ප්‍රමාණයක්)*
- *කුඩා නාගරික උද්‍යාන ය (පර්චස් 10 ක පමණ බිම් ප්‍රමාණයක්)*
- *ජල රැඳවුම් ප්‍රදේශය (පර්චස් 90 ක පමණ බිම් ප්‍රමාණයක)*

මෙම නගර සංවර්ධන ව්‍යාපෘතිය , අතුරුගිරිය මංසන්ධි ව්‍යාපෘතිය ලෙස ජනාවාස සැලැස්ම සඳහා ඒකාබද්ධ කරගැනීමට අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 12 : කොරනොට නේවාසික මංසන්ධි සංවර්ධනය

අඩු ඝනත්ව පොකුරු මඟින් හඳුනාගෙන ඇති දෙවැනි නේවාසික මංසන්ධි ලෙස කොරතොට හඳුන්වාදිය හැකිය. එමෙන්ම කොරතොට හතරවැනි ප්‍රමුඛතා නගරයක් ලෙස අගනගර සංවර්ධන සැලැස්ම මඟින් හඳුන්වා දා ඇත. පවත්නා තත්ත්වය තුළ කොරතොට ප්‍රදේශය ආගමික හා කාර්මික කටයුතු සඳහා වැඩි ප්‍රසිද්ධියක් උසුලයි. එම නිසා, මෙම ප්‍රදේශයෙහි පවත්නා ප්‍රවණතාවයට පහසුකම් සැලසීම මඟින් කර්මාන්ත ආශ්‍රිත නේවාසික මංසන්ධි ලෙස සැලසුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නේවාසිකයන්ට අවශ්‍ය දෛනික සේවා පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම

උපායමාර්ග ව්‍යාපෘති 13 : තුන්ඇඳඝේන සේවා මංසන්ධිය සංවර්ධනය කිරීම

යෝජිත තුනඳෙහේන සේව මංසන්ධි තුන්ඇඳඝේන - කොරතොට මාර්ගයේ පිහිටා ඇත. එම මංසන්ධිය ප්‍රධාන මාර්ගයකට මුහුණලා නොමැති වුවද, අනෙකුත් මංසන්ධිවලට සාපේක්ෂව සංවර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. මෙහි පවතින මූලික අංග වන ප්‍රජා ශාලාව, ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය, පෙර පාසැලක් යන කුඩා කඩමණ්ඩියක් ලෙස දැනට හඳුනාගෙන ඇත. නේවාසික ජනයාගේ දෛනික අවශ්‍යතාවයක් සපුරාලීමට අවශ්‍ය ලෙස කුඩා වෙළඳසැල්, සේවා මධ්‍යස්ථාන හා රැස්වීමේ මධ්‍යස්ථාන නොමැතිවීම හා ආරක්ෂිත වීදි නොමැතිවීම මෙම මංසන්ධි සංවර්ධනයට මූලික පදනම වී ඇත.



රූපය 6.5 : තුන්ඇඳඝේන මංසන්ධියේ පවතින තත්ත්වය
මූලාශ්‍රය : ගූගල් වීදි දර්ශන, 2018

එම නිසා, තුන්ඇඳඝේන මංසන්ධිය නේවාසික ජනගහනයේ දෛනික අවශ්‍යතාවයක් වන විවේකය හා ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් සපයන මංසන්ධියක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව පිටත වටරවුම් මාර්ගයට යාබදව පවතින, අක්කර 20 ක පමණ තෙත්බිමක කොටසක් තුන්ඇඳඝේන තෙත්බිම් උද්‍යාන ය ලෙස සංවර්ධනය කිරීම මෙම මංසන්ධි සංවර්ධනයේ මූලික පියවරයි. මෙම ව්‍යාපෘතිය ට සමගාමීව ප්‍රදේශයේ ප්‍රධාන මංමාවත සංවර්ධනය කිරීම අගනගර සංවර්ධන සැලැස්මෙහි ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය මඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව පහත මාර්ගය සංවර්ධනය කිරීමට අපේක්ෂා කරයි.



රූපය 6.6 : තුන්ඇඳඟේන මංසන්ධිය සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් සිතියම - සැලසුම් කණ්ඩායම මඟින් යෝජිනා කරන ලදී

1. *රත්නායක මාවත, තුන්ඇඳඟේන මංසන්ධිය දක්වා දිගු කිරීම (කිලෝමීටර් 1.8)*
2. *තුන්ඇඳඟේන - කොරතොට මාර්ගය සංවර්ධනය (කිලෝමීටර 2.8)*
3. *තෙත්බිම් මාර්ග සංවර්ධනය*

තුන්ඇඳඟේන මංසන්ධි මධ්‍යයේ දැනට පවතින අක්කර 3.5 ක පමණ මාර්ගය දෙපස ප්‍රදේශය සුදුසු භූමි කළමනාකරණ උපාය මාර්ග යොදාගනිමින් ප්‍රදේශයේ ම දෛනික අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කුඩා වෙළඳපොලක්, ආරෝග්‍යශාලාවක්, සිල්ලර කඩමණ්ඩියක්, පර්යන්ත උපකරණ අලෙවි සැලක්, බේකරි නිෂ්පාදන අලෙවිසැලක් යන අංග එක් කරමින් නැවත සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

උපායමාර්ග ව්‍යාපෘති 14 : රුක්මල්ගම සේවා මංසන්ධිය සංවර්ධනය කිරීම

සේවා මංසන්ධිය සඳහා යෝජිත රුක්මල්ගම නව නගරය අතුරුගිරිය - කොට්ටාව මාර්ගයේ පිහිටා ඇත. එය කොට්ටාව නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 3.4 ක පමණ දුරකින් පිහිටා ඇත. වර්තමානයේ මෙම ප්‍රදේශය විවේකී ප්‍රදේශයක්, කුඩා පරිමාණයේ බස්රථ ප්‍රයාන්තයක්, කඩ සාප්පු කිහිපයක් හා කුඩා පරිමාණයේ සුපිරි වෙළඳසැලකින් සමන්විත වේ.

ඉහත රූප සටහන්වලට අනුව දැනට පවත්නා වාණිජ සේවාවන් ප්‍රදේශයේ ජනගහනයේ අවශ්‍යතාවයන් සපුරාලීමට ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ. නමුත් රුක්මල්ගම නව නගරයේ පදිංචිකරුවන්ට දිනපතා තම දෛනික අවශ්‍යතාවයන් සඳහා විනාඩි 20 ක් ඇතුළත කොට්ටාව නගර මධ්‍යයට පිවිසීමේ හැකියාව ඇත. එහෙයින්, මෙම මංසන්ධිය මහබෝ වැව කේන්ද්‍ර කරගනිමින් පොදු උද්‍යාන යක් ලෙස සංවර්ධනය කිරීමට හා ඊට සමගාමීව අතුරුගිරිය - කොට්ටාව මාර්ගයේ සිට මහබෝ වැව මහජන උද්‍යාන ය දක්වා හරිත පිවිසුම් මාර්ග දෙකක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, ප්‍රජා ශාලාවක් හා කුඩා ළමුන් සඳහා ක්‍රීඩා උද්‍යාන යක් මෙම ප්‍රදේශයේ ජනයාගේ දෛනික අවශ්‍යතාවයින් සපුරාලමින් සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.

අක්කර 0.10 ක පමණ ප්‍රදේශයක දැනට පවතින රුක්මල්ගම බස්නැවතුම කුඩා ප්‍රමාණයේ බස් නැවතුම්පලක් ලෙස සංවර්ධනය කිරීම දෙවන උපාය මාර්ගික මැදිහත්වීම වේ.



රූපය 6.7 : රුක්මල්ගම නව නගරයේ පවතින තත්ත්වය
මූලාශ්‍රය : ගූගල් වීදි දර්ශන - 2018



1. Green Access Road to Mahabowewa Park
2. Community Hall with Children Play Area

රූපය 6.8 : රුක්මල්ගම නව නගර මංසන්ධි සංවර්ධනය සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් වීදි දර්ශන - 2018

උපාය මාර්ග ව්‍යාපෘති 15 : නවගමුව පදිංචිකරුවන්ට අවශ්‍ය දෛනික පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

නවගමුව පරණ කොළඹ ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති උප නාගරික ප්‍රදේශයකි. එම ප්‍රදේශයේ පවතින ආගමික් නැඹුරුවාව පදනම් කරගනිමින් නවගමුව ප්‍රදේශය සංවර්ධනය වන ප්‍රවණතාවයක් අතීතයේ සිටම හඳුනාගත හැකි වේ. වර්තමානය වනවිට මෙම ප්‍රදේශයේ ප්‍රාදේශීය රෝහලක්, පොලිස් ස්ථානයක්, උප තැපැල් කාර්යාලයක්, ප්‍රාථමික විද්‍යාලයක් සහ වෙළඳ මධ්‍යස්ථාන දක්නට ලැබේ. කෙසේ නමුත්, ජනතාවට අවශ්‍ය පරිදි විවේකී ප්‍රදේශයක් නොමැති වීම මෙම ප්‍රදේශයේ පවත්නා දුර්වලතාවයකි.



රූපය 6.9 : නවගමුව ප්‍රදේශයේ පවතින තත්ත්වය
මූලාශ්‍රය : ගූගල් වීදි දර්ශන - 2018

මෙම ප්‍රදේශයේ දැනට පවත්නා පහසුකම් මත පදිංචිකරුවන්ට අවශ්‍ය දෛනික පහසුකම් සියල්ල සපයන සේවා මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගත හැකි වේ. එමනිසා, විවේකී පහසුකම් සහිත හරිත උද්‍යාන යක් මෙම ව්‍යාපෘතිය මැදිහත්වීම මඟින් යෝජනා කිරීම තුළින් මෙම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මෙම අරමුණ සඳහා කැළණි ගඟ ආසන්නයේ පවතින අක්කර 03 ක පමණ හිස් බිම් අවකාශයක් භාවනා උද්‍යාන යක් ලෙස යෝජනා කිරීමට අපේක්ෂා කෙරේ. මෙම යෝජිත බිම් ප්‍රදේශය කැළණි ගඟ ආසන්නයේ නවගමුව පහළ, මාපිටිගම මාර්ගයට යාබදව පිහිටා ඇති අතර, නව හරිත පිවිසුම් මාර්ගයක් පහත රූප සටහනේ පරිදි පරණ කොළඹ මාර්ගයේ සිට (කොළඹ - හංවැල්ල) සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.



1 Meditation park
2 Low Level Road Improvement

රූපය 6.10 : නවගමුව ප්‍රදේශය සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් සිතියම - සැලසුම් කණ්ඩායම මඟින් යෝජනා කරන ලදී

උපාය මාර්ග ව්‍යාපෘති 16 : දැදිගමුව පදිංචිකරුවන්ට අවශ්‍ය දෛනික පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

සංවර්ධනය සඳහා යෝජිත දැදිගමුව ප්‍රදේශය හබරකඩ - හෝමාගම මාර්ගයේ පිහිටා ඇත. මෙම ප්‍රදේශය කඩුවෙල නගර මධ්‍යයේ සිට කිලෝමීටර 9.34 ක පමණ දුරකින් පිහිටා ඇති අතරම, කොළඹ - හංවැල්ල ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර 2.8 ක පමණ දුරකින් පිහිටා ඇත.

වර්තමානයේ මෙම ප්‍රදේශයේ පාසලක් (දැදිගමුව විද්‍යාලය) සහ කුඩා කඩමණ්ඩි කිහිපයකින් සමන්විත වේ. (රූප සටහන් අංක 17) එමෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා කිහිපයකින් අවට ප්‍රදේශය තුළ පිහිටා තිබේ. දැදිගමුව ස්වභාවික රක්ෂිතය මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධානතම ස්වභාවික සම්පතක් වේ. කෙසේනමුත්, මෙම ප්‍රදේශය ආසන්නයේම ගල් වලවල් පිහාටි තිබීමද හඳුනාගත හැකි වේ.



රූපය 6.11 : නවගමුව ප්‍රදේශය සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් සිතියම - සැලසුම් කණ්ඩායම මඟින් යෝජනා කරන ලදී.

පවත්නා තත්ත්වයට අනුකූලව මෙම ප්‍රදේශය පළමු උපාය මාර්ගික මැදිහත්වීම ලෙස පාපැදි ධාවන මංතීරුවක් හා ඇවිදීමේ මංතීරුවක් ගල්වලට හා දැදිගමුව රක්ෂිතය මායිම් වන ආකාරයෙන් නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම උද්‍යාන ප්‍රදේශයට ප්‍රවිශ්ඨ වීම සඳහා ග්‍රාමීය මාර්ග හතරක් සංවර්ධනය කිරීමටද අපේක්ෂා කෙරේ. වර්තමාන රණාල මාර්ගය අන්තර් නාගරික ක්‍රියාකාරී මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට අගනගර සංවර්ධන සැලැස්මේ ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ගය මඟින් අපේක්ෂා කෙරේ.



රූපය 6.12 : දැදිගමුව සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් සිතියම - සැලසුම් කණ්ඩායම මඟින් යෝජනා කරන ලදී.

උපායමාර්ග ව්‍යාපෘති 17 : වල්ගම මංසන්ධිය පදිංචිකරුවන්ට අවශ්‍ය දෛනික පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

කොට්ටාව - අතුරුගිරිය මාර්ගය හා හෝමාගම - අතුරුගිරිය මාර්ගය එක් කරන මංසන්ධිය වල්ගල මංසන්ධියයි. එය අතුරුගිරිය නගරයට දළ වශයෙන් කිලෝමීටර 1.7 පමණ නුදුරින් සහ හෝමාගම නගරයට දළ වශයෙන් කිලෝමීටර 3.2 ක පමණ දුරින් පිහිටා ඇත. වෙනත් මංසන්ධි හා සැසඳීමේදී වල්ගම මංසන්ධියෙහි අවිධිමත් ලෙස සැකසුණු මූලික වාණිජ පහසුකම් දැකගත හැකිය.





රූපය 6.13 : වල්ගම මංසන්ධියේ පවතින තත්ත්වය
මූලාශ්‍රය : ගූගල් වීදි දර්ශණය - 2018

ඉහත රූප සටහන්වලට අනුකූලව ප්‍රදේශයට අවශ්‍ය තරම් ප්‍රමාණවත් වාණිජ හා පොදු සේවා නොමැති බව පැහැදිලි වේ. කෙසේවෙතත්, වල්ගම ප්‍රදේශයේ නේවාසික ජනගහනයට මිනිත්තු 20 ක් වැනි කෙටි කාලයක් තුළ අතුරුගිරිය නගරයට ප්‍රවේශ වීමේ හැකියාව පවතී. එමනිසා, මෙම වල්ගම මංසන්ධිය මහජනයාට අවශ්‍ය පොදු පහසුකම් සැපයිය හැකි උද්‍යාන යක් ලෙස පහසුකම් සපයමින්, සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.



රූපය 6.14 : වල්ගම හන්දිය සඳහා යෝජිත දළ සැලැස්ම
මූලාශ්‍රය : ගූගල් සිතියම - සැලසුම් කණ්ඩායම මඟින් යෝජනා කරන ලදී.

වල්ගම මංසන්ධිය ආසන්නයේ පිහිටි අක්කර 0.7 ක පහණ වගුරු බිම් ප්‍රදේශයක් මෙම උද්‍යාන ය සංවර්ධනය සඳහා යෝජනා කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති වර්ගය	ව්‍යාපෘති ක්ෂේත්‍රය	උපාය මාර්ගික ව්‍යාපෘතිය
මාර්ග සංවර්ධනය	S III–S-4	කඩුවෙල - හෝමාගම මාර්ගය හෝමාගම සිට වෙලේ ඉන්දිය දක්වා සංවර්ධනය කිරීම.
නේවාසික මංසන්ධි දියුණු කිරීම	S III-S-1	අතුරුගිරිය හා කොරතොට
සේව මංසන්ධි දියුණු කිරීම	SIII-S-3	සේවා මංසන්ධි 13ක් දියුණු කිරීම

වගුව 6.4 : නේවාසික සංවර්ධන පොකුරු IIII - උපාය මාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිරක්ෂණ හා සංවර්ධන අංශය, නා.සං.අ. - 2018

**Remaining ten convenient nodes will be detailed during the implementation stage*

උපායමාර්ගික මැදිහත්වීම 2 : අඩු පහසුකම් සහිත නිවාස කළමනාකරණය සඳහා උපාය මාර්ගික මැදිහත්වීම

අඩු පහසුකම් සහිත නිවාස කළමනාකරණ සැලැස්මෙහි මූලික අරමුණ අගනගර ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සහ අගනගර ප්‍රදේශය තුළ අපේක්ෂිත ස්වභාවය ඉස්මතු කරගැනීම වේ.

අඩු පහසුකම් සහිත නිවාස ගැටළු විසඳීම සඳහා අඩු පහසුකම් සහිත නිවාස කළමනාකරණ සැලැස්ම මඟින් පහත ප්‍රවේශයන් තුන යෝජනා කරයි.

1. *නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය*
2. *නැවත පදිංචිකිරීමේ ප්‍රවේශය*
3. *විශේෂ ව්‍යාපෘති ප්‍රවේශය*

නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය

සැලැස්මෙහි හඳුනාගත් ප්‍රදේශයන්හි අඩු පහසුකම් සහිත නිවාස කළමනාකරණය සඳහා නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය වඩාත් නම්‍යශීලි හා නව්‍ය විසඳුමක් ලෙස හඳුන්වාදිය හැකිය. නැවත පදිංචිකිරීමේ ප්‍රවේශය සඳහා අඩු පහසුකම් සහිත ජනාවාස හඳුනාගැනීමේ සඳහා ප්‍රධාන යාන්ත්‍රණය “ඉඩම් අයිතිය” වේ.

නැවත පදිංචිකිරීමේ ප්‍රවේශය

ඇළ රක්ෂිත හා අනවසර ඉඩම් තුළින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම මඟින් අගනගර ප්‍රදේශයේ ජනයාගේ ජීවන තත්ත්වය උසස් කිරීමට හා අගනගර ප්‍රදේශය තුළට අවශ්‍ය ස්වරූපය පවත්වාගෙන යාමට නැවත පදිංචි කිරීමේ ප්‍රවේශය මනා විසඳුමක් වේ.

විශේෂ ව්‍යාපෘති ප්‍රවේශය

ජාතික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති පදනම් කරගනිමින් විශේෂ ව්‍යාපෘති ප්‍රවේශය හඳුන්වා දෙනු ලබයි.

පහතින් හඳුනාගෙන ඇති අඩු පහසුකම් සහිත ජනාවාස කළමනාකරණය කිරීම සඳහා නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය, නැවත පදිංචිකිරීමේ ප්‍රවේශය හා විශේෂ ව්‍යාපෘති ප්‍රවේශය යොදාගෙන

	හඳුනාගත් ස්ථානය	ඉඩම් හිමිකම	නිවාස සංඛ්‍යාව	යෝජිත ප්‍රවේශය	යෝජිත බිම් ප්‍රදේශය
1	ඔබේසේකරපුර (අරුණෝදය මාවත)	ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මහනගර සභාව හා පුද්ගලික අංශය	668-700	විශේෂ ව්‍යාපෘති (නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය , නාගරික සංවර්ධන අධිකාරිය) සහ නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය	ඔබේසේකරපුර (අරුණෝදය මාවත) එම බිම් ප්‍රදේශයේ ම නැවත පදිංචි කිරීම
2	කිණ්ඩ ඇළ රක්ෂිතය	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	හඳුනාගත යුතුයි.	නැවත පදිංචි කිරීමේ ප්‍රවේශය	ඔබේසේකරපුර (අරුණෝදය මාවත)
3	බණ්ඩාරනායකපුර	පුද්ගලික අංශය	හඳුනාගත යුතුයි.	නැවත පදිංචි කිරීමේ ප්‍රවේශය හා නැවත සැලසුම් කිරීමේ ප්‍රවේශය	බණ්ඩාරනායකපුර (එම බිම් ප්‍රදේශයෙහිම නැවත පදිංචි කිරීම)
4	මාලිගාව පාර	නාගරික සංවර්ධන අධිකාරිය	60	නැවත පදිංචි කිරීමේ ප්‍රවේශය	බණ්ඩාරනායකපුර
5	බද්දගාන පාර	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	17	නැවත පදිංචි කිරීමේ ප්‍රවේශය	බණ්ඩාරනායකපුර
6	කිත්තම්පහුව ඇළ රක්ෂිතය (පෙරේරා මාවත)	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	7-10	නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය	ඔබේසේකරපුර (අරුණෝදය මාවත)
7	කැළණි වැලි දුම්රිය මාර්ග රක්ෂිතය	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	144	විශේෂ ව්‍යාපෘති (කැළණි වැලි දුම්රිය මාර්ගය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය)	කැළණි වැලි දුම්රිය මාර්ගය මඟින් යෝජිත ඉඩම්

වගුව 6.5 : ජනාවාස ව්‍යාපෘති
මූලාශ්‍රය : ග්‍රාම නිලධාරී දත්ත, ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ මහනගර සභාව සහ ක්ෂේත්‍ර සමීක්ෂණ තුළින් සැලසුම් කණ්ඩායමෙහි නිරීක්ෂණය

ජනාවාස උපාය මාර්ගයෙහි පොකුරු සංවර්ධන උපාය මාර්ගික මැදිහත්වීම ප්‍රධාන වශයෙන් අගනගර සංවර්ධන සැලැස්මෙහි ප්‍රධාන උපාය මාර්ග දෙකක් හා සෘජුව සම්බන්ධතාවයක් පවතියි. ජනාවාස අතර මනා ප්‍රවේශයක් ලබාදෙමින් දෛනික සේවා පහසුකම් සපයන සේවා මංසන්ධි සංවර්ධනය කිරීම සඳහා ජනාවාස උපාය මාර්ගය ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන උපාය මාර්ගය හා සෘජුව සම්බන්ධ වේ. එම නිසා යෝජිත මාර්ග බොහෝමයක් ජනාවාස උපාය මාර්ගයේ ප්‍රධාන අංග වේ. උදාහරණයක් ලෙස, අඩු ඝනත්ව පර්යන්ත පොකුරු කලාපය සංවර්ධනය කිරීම ප්‍රධාන වශයෙන්ම ප්‍රවාහන උපාය මාර්ගය මඟින් යෝජිත තෙත්බිම් උද්‍යාන ජනාවාස ප්‍රදේශයන්හි ජීවත් වන ජනයාගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහ එම ප්‍රදේශවල ඉඩම් වටිනාකම ඉහළ නැංවීමටද හේතු වේ.



සිතියම 6.5 : අඩු පහසුකම් සහිත නිවාස කළමනාකරණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

6.4. ජනාවාස සංවර්ධන උපාය මාර්ගයේ බලපෑම

- **පොකුරු සංවර්ධන සැලැස්ම සහ ජනගහන ඝනත්වය**

අ. අධි ඝනත්ව පොකුරු කලාප - I

ඇතුළු නගර සැලසුම් ප්‍රදේශයේ ජනගහන ඝනත්වය 2018 වර්ෂයේදී හෙක්ටයාර් 01 කට ජනගහනය 58 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, අධි ඝනත්ව පොකුරු කලාප I ප්‍රදේශයේ 2018 වර්ෂයේදී ජනගහන ඝනත්ව හෙක්ටයාර 01 කට ජනගහනය 63 ක් ලෙස හඳුනාගෙන ඇත.

එමෙන්ම ඇතුළු නගර සැලසුම් ප්‍රදේශයේ යෝජිත ජනගහන ඝනත්වය 2030 වර්ෂයේදී හෙක්ටයාර 01 කට ජනගහනය 98 ක් ලෙසද, අධි ඝනත්ව පොකුරු කලාප I ප්‍රදේශයේ 2018 වර්ෂයේදී ජනගහන ඝනත්වය හෙක්ටයාර 01 කට 70 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

පිටත නගර සැලසුම් ප්‍රදේශයේ ජනගහන ඝනත්වය 2018 වර්ෂයේදී හෙක්ටයාර 01 කට ජනගහනය 51 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, අධි ඝනත්ව පොකුරු කලාප II ප්‍රදේශයේ 2018 වර්ෂයේදී ජනගහන ඝනත්වය හෙක්ටයාර 01 කට ජනගහනය 46 ක් ලෙස හඳුනාගෙන ඇත.

එමෙන්ම පිටත නගර සැලසුම් ප්‍රදේශයේ යෝජිත ජනගහන ඝනත්වය 2030 වර්ෂයේදී හෙක්ටයාර 01 කට ජනගහනය 116 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, අධි ඝනත්ව පොකුරු කලාප II ප්‍රදේශයේ 2030 වර්ෂයේ යෝජිත ජනගහන ඝනත්වය හෙක්ටයාර 01 කට ජනගහනය 77 ලෙස ඇස්තමේන්තු කර ඇත.

ආ. අඩු ඝනත්ව පොකුරු කලාපය

අඩු ඝනත්ව පොකුරු කලාපයේ 2018 වර්ෂයේ ජනගහන ඝනත්වය හෙක්ටයාර 01 කට 33 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, 2030 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ජනගහනය හෙක්ටයාර 01 කට 49 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

ජනාවාස පොකුරු සංවර්ධනය කිරීම මගින් හා සේවා මධ්‍යස්ථාන 02 ක් සහ දෛනික සේවා සපයන සේවා මංසන්ධි 15 ක් සංවර්ධනය කිරීම තුළින් සැලසුම් ප්‍රදේශය තුළට නේවාසික ජනගහනය ආකර්ශණය කර ගැනීම අපේක්ෂා කෙරේ.

ප්‍රදේශය සඳහා අවශ්‍ය වාණිජ අවකාශයෙන් 24% ක් හෙක්ටයාර 4.98 පොකුරු සංවර්ධනය කිරීම තුළින් මෙම ප්‍රදේශයට අත්පත් වේ.

- **අඩු පහසුකම් සහිත ජනාවාස කළමනාකරණය**

ජනාවාස කළමනාකරණ සැලැස්ම මගින් හඳුනාගත් අඩු පහසුකම් සහිත ජනාවාස 100% ක් අගනගර ප්‍රදේශයේ තුළ කළමනාකරණය කිරීමට සැලසුම් කර ඇත.



07

ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

07 පරිච්ඡේදය
ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

හැදින්වීම

අරමුණු සහ පරමාර්ථ

ප්‍රවේශය

7.1. හැදින්වීම

නගරයක ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමෙහිලා අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස අවකාශ සැලසුම හඳුන්වා දිය හැකිය. ප්‍රධාන වශයෙන්, සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේ අවධියේදී අවකාශීය රටා සහ ආර්ථික ක්‍රියාකාරකම්හි ගතිකතාව සැලකිල්ලට ගනු ලැබේ. අගනගර සංවර්ධන සැලැස්මෙහි ගැටළු සහ විභවතා හඳුනාගැනීමේ අදියර තුළදී සැලසුම් ප්‍රදේශය සඳහා ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්මක අවශ්‍යතාව හඳුනාගනු ලැබීය.

7.1.1. අරමුණු සහ පරමාර්ථ

ඉහත සඳහන් කළ අවශ්‍යතාවයන් සලකා බැලීම සඳහා අගනගර සංවර්ධන සැලස්ම මඟින් පහත දැක්වෙන උපාය මාර්ගික අරමුණු හඳුන්වා දී ඇත.

උපායමාර්ගික අරමුණු — *"සුමට හා කාර්යක්ෂම නාගරික පද්ධති හා සුපිරි නාගරික පහසුකම් සහිත ස්ථානයක්"*

7.1.2. 173

මෑත වසරවලදී කාර්යක්ෂම ආර්ථික උපායමාර්ගයක් ලෙස ආර්ථික විද්‍යාඥයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර ජනප්‍රිය වී ඇති ආර්ථික සංවර්ධන ප්‍රවේශය වනුයේ "පොකුරු උපායමාර්ගික මැදිහත්වීම" යි. අගනර සංවර්ධන සැලැස්මේ අන්තර්ගත ආර්ථික සංවර්ධන උපායමාර්ගය සැකසීමේදී ද මෙම "පොකුරු උපායමාර්ගික ප්‍රවේශය" අන්තර්ගත කර ඇත. ඒ ආනුව, ආර්ථික සංවර්ධන උපායමාර්ගය මගින් සක්‍රීයව සංවර්ධනය වෙමින් එකිනෙකට තරගකාරීව සහ සහයෝගීව කටයුතු කරන පොකුරු ආර්ථික භූ ගෝලීය වශයෙන් සංකේන්ද්‍රනය වී ඇති ප්‍රදේශ හඳුනාගෙන ඇත.

අගනගර සංවර්ධන සැලැස්මෙන් අපේක්ෂිත සමස්ථ සංවර්ධනය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ ඒ අවට ප්‍රදේශ අවරණය කරමින් පොකුරු ආර්ථික සංවර්ධන ප්‍රවේශය අන්තර්ගත කරගනිමින් වාණිජ හා සිල්ලර වෙළඳ ප්‍රදේශයන් සහිත පොකුරු අවකාශයන් වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

7.2. ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලසුම් විෂය පථය

- මෙම ආර්ථික සංවර්ධනයන් උපාය මාර්ගික විෂය පථය මගින් වර්තමාන ගැටළු, අනාගත අපේක්ෂිත සංවර්ධනය, ප්‍රමුඛතාවන්, යෝජිත මංසන්ධි, කොරිඩෝ,සංවර්ධනය ආවරණය කරනු ලබයි

- සෘජු හා වක්‍ර රැකියා ජනනය, නව අගනගරයට ආර්ථික පදනමක්, ප්‍රවාහන සේවයේ, ඉඩම් පරිහරණයේ සහ අනෙකුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළත් වේ.

- සංවර්ධන සැළසුමෙහි මෙම පරිච්ඡේදයෙහි සඳහන් සියළුම උපායමාර්ගික ව්‍යාපෘති සැලසුම් ප්‍රදේශය සඳහා පළමුවන පරිච්ඡේදයෙහි සඳහන් නිශ්චිත කාලසීම ඇතුළත ලබාදීමට අපේක්ෂා කරනු ලබයි.එම කාලරාමුව ඔබ්බට ඇති වන අවස්ථා සමඟ ගනුදෙනු කිරීමට සංවර්ධන සැළසුම යාවත්කාලීන කිරීමට අවශ්‍ය වේ.

7.3. ප්‍රදේශය තුළ ප්‍රධාන ක්‍රියාකාරී ආර්ථික පොකුරු හඳුනා ගැනීම

ආසන්න වශයෙන් වර්ග කි.මී 165 පමණ වූ භූමී ප්‍රමාණයක් අගනගරය සඳහා සීමාංකනය කර ඇත. බස්නාහිර පළාතේ විශාල පරිපාලන සහ වාණිජ අවකාශයන් මීට අයත් වන අතර සක්‍රීය කාර්මික හා කෘෂිකාර්මික අවකාශයකින්ද සමන්විත වේ. අගනගර ප්‍රදේශයේ 2017 භූමී පරිභෝජන සිතියම මගින් ප්‍රාදේශීය පළාත් පාලන ආයතන හතරෙහි භූගෝලීය ප්‍රභේදනය නිරූපණය කර ඇත. ප්‍රධාන ස්වභාවික සම්පත් වන තෙත්බිම්, ජල මූලාශ්‍ර, ප්‍රදේශයේ පවතින සිල්ලර වෙළඳාම, කර්මාන්ත, සහ ගබඩා පහසුකම් වලට හානියක් නොවන ආකාරයෙන් පවතින බව හඳුනා ගෙන ඇත.

පළාත් පාලන ආයතන හතරෙහි ඇති සම්පත් පැතිකඩ වාර්තා අනුව සෑම පළාත් පාලන ආයතනයකම තම පාලන සීමාව තුළ පහත දක්වා ඇති විශේෂිත ආර්ථික නියාමන හඳුනාගෙන ඇත.



සිතියම 7.1 : ඉඩම් පරිහරණ සැලසුම් සිතියම - 2017

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

භූමි පරිහරණ රටාව - 2017

අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය

නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :

බස්නාහිර පළාත් අංශය හා පරිසරණ හා සුභසාධන අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය

ජූනි මස 2018

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව — කොටිකාවත්ත ප්‍රාදේශීය සභාව සීග්‍රයෙන් වර්ධනය වන පරිපාලනමය, වාණිජ සහ නේවාසික ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. එම ප්‍රදේශය එහි පවතින ගංගා හා තෙත්බිම් වලින් සමන්විත් ස්වභාවික භූගෝලීය ලක්ෂණය සඳහා ප්‍රසිද්ධියක් උසුලනු ලබයි. ලබා දී ඇති සංඛ්‍යාලේඛනවලට අනුව මුළු බිම් ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 17% ක් තෙත් බිම් හා ජල ප්‍රදේශ ආවරණය කරයි.

ප්‍රාදේශීය සභාව තුළ ආර්ථික කටයුතු සංයුතිය වෙළඳ හා සිල්ලර, ආයතනික, කාර්මික හා කෘෂිකාර්මික කටයුතු ඇතුළත් වේ. මෙම ආර්ථික ක්‍රියාකාරකම් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සමස්තභූමි ප්‍රමාණයේ ආවරණයට දක්වන දායකත්වය සමාන අගයක් ගැනේ (සාමාන්‍යයෙන් 1% - 2% කි). කෙසේ නමුත් කර්මාන්ත ගබඩා, සේවා සපයන්නන්, සිල්ලර වෙළඳාම, මෙම ප්‍රදේශයේ ප්‍රධානම ආර්ථික කාර්යයන් වේ. (කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 2015).

මහරගම නගර සභාව — මහරගම නගර සභා ප්‍රදේශයේ ආර්ථික නියාමනයන් ලෙස කාර්මික හා වාණිජ කටයුතු හඳුනාගත හැකි අතර මහරගම නගරසභා සම්පත් පැතිකඩ වාර්තාව අනුව, තොග හා සිල්ලර වෙළඳාම සහ ඇඟළුම් කර්මාන්තය ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික බලවේග ලෙස ක්‍රියා කරයි. ප්‍රදේශයේ ඉඩම් පරිහරණ සංයුතිය පිළිවෙලින් කෘෂිකාර්මික,වාණිජ, හා සිල්ලර, ආයතනික, සහ මධ්‍ය හා කුඩා පරිමාණ, කාර්මික සඳහා ප්‍රතිශතයන් පිළිවෙලින් 13.38%, 9.6%, 2%-3% හා 1% - 2% වශයෙන් වේ.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව — ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවෙහි ප්‍රධාන ආර්ථික නියාමන හඳුනා ගැනීම සඳහා ප්‍රධාන සාධක ලෙස ප්‍රදේශයේ භූමි පරිභෝජන සංයුතිය සහ ආර්ථික ක්‍රියාකාරකම්හි ක්‍රියාකාරිත්වය හඳුනාගත හැකිය. ඒ අනුව ප්‍රදේශයේ භූමි පරිභෝජන සංයුතිය සැළකීමේදී 8% ක් වාණිජ කටයුතු සඳහාත්,2% පරිපාලන කාර්යාලීය කටයුතු සඳහාත්, 1% ක් කර්මාන්ත කටයුතු සඳහාත්, කුඩා ප්‍රමාණයක් කෘෂිකර්මාන්ත කටයුතු සඳහාත් බෙදීගොස් ඇත.

කඩුවෙල මහනගර සභාව — ප්‍රදේශයේ සවිස්තරාත්මක භූමි පරිභෝජන සිතියම මත පදනම්ව සලකා බැලීමේදී පෙනීයන්නේ කඩුවෙලා මහා නගර සභා බල ප්‍රදේශයෙන් 8% ක ප්‍රමාණයක් වාණිජ කටයුතු මගින්ද, 4% ක ප්‍රමාණයක් පරිපාලන කටයුතු වලින්ද 2%ක ප්‍රමාණයක් කර්මාන්ත කටයුතු වලින්ද 3%ක ප්‍රමාණයක් කෘෂිකර්මාන්ත කටයුතු වලින්ද ආවරණය වන බවයි. නිරීක්ෂණ සහ වෙනත් සංඛ්‍යාලේඛනවලට අනුව කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ ආර්ථික වාණිජ සිල්ලර සේවා, පරිපාලන කාර්යාල සේවා සාර්ව හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත හා කෘෂිකර්මාන්ත යන ක්‍රියාකාරකම්වලින් ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබේ.

අගනගර සැලසුම්කරණ කලාපයේ ආර්ථික පරිසරය පිළිබඳ සිදුකරනු ලැබූ සවිස්තරාත්මක තක්සේරුවක් මඟින් නාගරික මංසන්ධි හා කොරිඩෝ නිශ්චිතව වර්ග කර, ප්‍රධාන නගරවල මංසන්ධි සහ කොරිඩෝවන්හි ආර්ථික තත්වයන් ස්ථානගත කිරීමද කරයි. අගනගර සැලසුම් කලාපය තුළ අනන්‍ය ලක්ෂණ සහිත නාගරික මංසන්ධි සහ කොරිඩෝර ඇසුරින් නිර්මාණය වූ ආර්ථික පරිසරයක් පවතින අතර එහි ලක්ෂණ මංසන්ධි සහ කොරිඩෝර ඔස්සේ ව්‍යාප්ත වී ඇත.



පොකුරු ආර්ථිකයන් හි ව්‍යාප්තිය

අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය

නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :

බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා මුහුණු අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

සිතියම 7.2 : සැලසුම් කරන ප්‍රදේශය තුළ හඳුනාගත් ආර්ථික සම්මිශ්‍රණය මෙසේයි

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

මෙම ප්‍රතිශතයන් මුළු භූමි භාවිතයෙන් හඳුනාගත් මංසන්ධි ඇතුළත භූමි ප්‍රමාණය නිරූපණය වේ. (නගර මධ්‍යයේ සිට කි.මී. 1.5ක අරයකින් යුතු සේවා වපසරියක් තුළ)

මංසන්ධි ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම්හි අවකාශ ව්‍යාප්තිය සැලසුම් ප්‍රදේශයේ සමස්තභූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස පහත පරිදි දැක්විය හැකිය.

පරිපාලන ආයතන සමූහය	*21%*
විද්‍යා හා තාක්ෂණ ආයතන සමූහය	*6%*
අමතරපන්නි සහ සිල්ලර වෙළඳ සමූහය	*14%*
සාම්ප්‍රදායික තොග අලෙවි ජාලය	*17%*
ආයතන සහ කාර්යාල සමූහය	*26%*
කර්මාන්ත හා ගබඩා සමූහය	*25%*

විශ්ලේෂණ නිගමන හා ද්විතීයික දත්ත තුළින් අනාවරණය වන පරිදි අගනගරයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් වශයෙන් සිල්ලර හා මහා පරිමාණ වෙළඳ ක්‍රියාකාරකම්, තවදුරටත් පරිපාලන හා කාර්යාලීය ආයෝජන , සාර්ව හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත, ගුදම් කලාපයේ ආයෝජන සහ යටිතල පහසුකම්, විද්‍යාත්මක හා තාක්ෂණික අධ්‍යාපනය සඳහා සිදු කරන ආයෝජනයන් ගැනිය හැක.

7.4. භූමි පරිභෝජන ප්‍රක්ෂේපණය

පවතින වාතාවරණය අනුව ඉදිරිය පුරෝකථනය කරමින් අගනගරය තුළ ආර්ථික අවකාශීය ව්‍යාප්තිය නිශ්චය කිරීම.

කලාප	යෝජිත නේවාසික අවකාශය (වර්ග මීටර්)	යෝජිත වාණිජ අවකාශය (වර්ග මීටර්)	යෝජිත කාර්යාල අවකාශය (වර්ග මීටර්)	යෝජිත කර්මාන්ත අවකාශය (වර්ග මීටර්)	යෝජිත අනිකුත අවකාශය (වර්ග මීටර්)	සංවර්ධනය කල හෙකි මුළු භූමි ප්‍රමාණය (වර්ග මීටර්)
අධි ඝනත්ව මිශ්‍රසංවර්ධන කලාපය	8,501,098	1,165,375	137,714	46,479	798,127	10,648,793
පරිපාලන කලාපය	10,988,286	2,708,084	1,086,605	13,754	621,760	15,418,489
වාණිජ කලාපය	29,962,436	18,700,920	1,289,259	466,473	510,217	50,929,305
කාර්යාල කලාපය	12,058,396	3,526,243	3,379,047	290,235	267,303	19,521,224
තොරතුරු තාක්ෂණික කලාපය	20,581,329	10,120,606	1,573,615	234,030	2,335,953	34,845,534
පරිවර්තන කලාපය	24,562,858	749,912	42,783	282,415	244,566	25,882,535
කර්මාන්ත හීරුව	10,003,560	1,265,708	-	1,436,880	253,102	12,959,251
කර්මාන්ත කලාපය	6,223,220	334,541	50,868	3,040,452	263,983	9,913,064
නේවාසික කලාපය	11,496,719	685,918	101,831	1182257	383,432	13,850,158
මුළු අවකාශය	**134,377,903**	**39,257,307**	**7,661,723**	**6,992,974**	**5,678,445**	**193,968,353**

වගුව 7.1 : 2050 තුළ යෝජිත අවකාශීය පැතිරීම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ සහ සංවර්ධන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

07 පරිච්ඡේදය
ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

ආර්ථික සංවර්ධන උපායමාර්ගය සඳහා උපාය මාර්ගික මැදිහත් වීම්

ප්‍රධාන ආර්ථික සංවර්ධන උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1: මංසන්ධි සහ වෙළඳ කොරිඩෝ සංවර්ධන

7.5. ආර්ථික සංවර්ධන උපායමාර්ගය සඳහා උපාය මාර්ගික මැදිහත් වීම්

අගනගර සැලැස්මේ අන්තර්ගත දේශීය ආර්ථික සංවර්ධන උපාය මාර්ග ආර්ථික සංවර්ධන සැලැස්ම "ආර්ථික සංකේන්ද්‍රණය හරහා ලාභ වැඩිකිරීම" මඟින් මෙහෙයවනු ලැබේ. පහසුකම් ඉහළ නැංවීම හා ආර්ථික ක්‍රියාකාරකම් පිහිටීමේ භූමේය් වාසිය මත පොකුරු ආර්ථික වාසි වැඩි දියුණු කිරීමෙහි අවශ්‍යතාවය අවධාරණය කරයි. ඒ අනුව උපායමාර්ගික ප්‍රවේශය ළඟා කර ගැනීමට උපකාරී වන උපාය මාර්ග 4 ක් ආර්ථික සැළැස්මේ ඇතුළත් වේ. එම උපායමාර්ග පහත පරිදි විස්තර කළ හැක.

1. *උපායමාර්ගික මැදිහත්වීම 1: මංසන්ධි සහ වෙළඳ කොරිඩෝ සංවර්ධන*
2. *උපායමාර්ගික මැදිහත්වීම 2: ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය*
3. *උපායමාර්ගික මැදිහත්වීම 3: කාර්මික සංවර්ධන උපාය මාර්ග*
4. *උපායමාර්ගික මැදිහත්වීම 4: විශේෂ ව්‍යාපෘති මඟින් පොකුරු ආර්ථික ප්‍රවර්ධනය*

7.6. ප්‍රධාන ආර්ථික සංවර්ධන උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1: මංසන්ධි සහ වෙළඳ කොරිඩෝ සංවර්ධන

උපාය මාර්ගික ව්‍යාපෘති 1 : වාණිජ මංසන්ධි වර්ගීකරණය

මංසන්ධියක් යනු ජාලයක් තුළ අන්තර් ඡේදනය වන/ සම්බන්ධතා ලක්ෂයකි. මෙම වාණිජ මංසන්ධි වර්ගීකරණය තර්කානුකූල විශ්ලේෂණය (Node –Place) භාවිතයෙන් සිදුකර ඇත. මංසන්ධි සංකල්පය විවිධ මට්ටම් වල ක්‍රියාකරන, නමුත් කෙටියෙන් මංසන්ධි අර්ථ දක්වා ඇත්තේ ප්‍රධාන නාගරික කේන්ද්‍රයන් ලෙසය. මෙම මාර්ගෝපදේශ සහ උපාය මාර්ග මංසන්ධි- ස්ථාන විශ්ලේෂණයේ දී හඳුනාගෙන ඇති පරිදි, මංසන්ධි වල ඇති මාර්ග වලට යාබදව ඇති දේපළ සඳහා අදාළ වේ.



සිතියම 7.3 : අගනගරයෙහි ආර්ථික මංසන්ධි වර්ගීකරණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 2 : වාණිජ කොරිඩෝ වර්ගීකරණය

වාණිජ කොරිඩෝ හා මංසන්ධි සංවර්ධන ව්‍යාපෘති යේ අරමුණ වන්නේ සැලසුම්ගත , ආර්ථික හා සැලසුම් මාර්ගෝපදේශනයක් හා නිවැරදි යොමුවක් අගනගරය තුළ පිහිටි කොරිඩෝවන් වෙත සැපයීමයි. අධි ඝනත්වයකින් යුතු මිශ්‍ර සිල්ලර, නේවාසික, පරිභෝජනයන් උප ප්‍රධාන ක්‍රියාකාරී මාර්ගයන්හි ස්ථාපනය කරමින් කොරිඩෝ ප්‍රමුඛ කරගත් ආර්ථිකයක් අගනගර සංවර්ධන සැළැස්ම මඟින් හඳුන්වා දී ඇත. මෙහිදී, අවකාශීය සංකලන අගයෙහි මට්ටම් මත පදනම්ව ප්‍රධාන මර්ගස්ථාන ක්‍රියාකාරී කිරීම සඳහා උප ප්‍රධාන මාර්ග සඳහා විවිධ වූ ආර්ථික ක්‍රියාකාරකම් හඳුන්වා දී ඇත. කොරිඩොවන් මඟින් මංසන්ධි සහ වැදගත් ක්‍රියාකාරී ස්ථාන අතර සම්බන්ධතාවයක් ඇති කරනු ලබන අතර එමඟින් එම ස්ථාන තිව්‍ර නේවාසික සංවර්ධන බවට පත්කිරීමට ද බලාපොරොතුවේ. සැලසුම්කණ්ඩායම මඟින් අවකාශීය සංකලන අගයෙහි මට්ටම්, කොරිඩොවන්හි වත්මන් සහ යෝජිත පරිභෝජන රටාවන් සැලකිලට ගනිමින් වීදි වර්ග හතරකින් සමන්විත වර්ගීකරණයක් අගනගර සංවර්ධන සැලැස්මෙහි කොරිඩෝ සංවර්ධන උපාය මාර්ගය හරහා හඳුන්වා දී ඇත. (වර්ගීකරණ මාර්ග තේරුම් ගැනීම සඳහා වන වෙළඳ කොරිඩෝ ලැයිස්තුවට අයත් ඇමුණුම බලන්න.)

1. *මහා වාණිජ වීදිය (නාගරික ක්‍රියාකාරී මහා මාර්ග)*
    - *මිශ්‍ර භාවිතයන් සහිත සිරස් ඝනත්වයෙන් යුතු ගොඩනැගිලි, සජීවී බිම් මහල් / වාණිජ අවකාශයන් / අඛණ්ඩ සිල්ලර වෙළඳාමේ සංවර්ධන*
    - *වීදි ඉදිරිපස සක්‍රීයභාවය - බිම් ක්‍රියාකාරිත්වය සහ මඟී ආපනශාලා*
2. *පොදු ප්‍රවාහනය. (විවිධ මධ්‍යයන්හි ගමනාගමන පහසුකම්)*
3. *වෙළඳ වීදි (ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග, තෙත්බිම් මාර්ග)*
    - *සක්‍රිය නිර්මාණශීලී ඉදිරිපස වීදි - බිම් ක්‍රියාකාරිත්වය සහ මඟී ආපනශාලා*
    - *ගස් වලින් අවරණය වූ විශාල පදික මංතීරු.*
4. *අසල්වැසි වීදි. (උප ප්‍රධාන නාගරික ක්‍රියාකාරී මාර්ග, තෙත්බිම් මාර්ග)*
    - *ඇවිදීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වීදි දෙපස ගස් සිටුවා ආවරණය කරමින් නිර්මාණය කිරීම.*
5. පහසු වීදිය
    - *මෙම වීදියේ පිහිටා ඇති සියලු වර්ගවල වාණිජ කටයුතු*



සිතියම 7.4 : අගනගරයෙහි වාණිජ වීදි වර්ගීකරණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

07 පරිච්ඡේදය
ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

ප්‍රධාන ආර්ථික සංවර්ධන උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ග මැදිහත්වීම 2 : ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

උපායමාර්ග මැදිහත්වීම 3 : කර්මාන්ත සංවර්ධනය

උපායමාර්ග මැදිහත්වීම 2 : ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

යටිතල පහසුකම් ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතාවයකි. එම යටිතල පහසුකම්, නිශ්පාදන, භාණ්ඩ හා සේවා සෘජුවම නිපදවීමට මැදිහත් නොවන නමුත් බාහිර ආර්ථිකයන් නිර්මාණය කිරීමෙන් ප්‍රාථමික, ද්විතියික හා තෘතීක ආර්ථික ක්‍රියාකාරකම් පහසු කරයි. ඕනෑම රටක ආර්ථික සංවර්ධනයේ මට්ටම රඳා පවතින්නේ යටිතල පහසුකම් සංවර්ධනය මත බව පිළිගත් කරුණකි. උපාය මාර්ගයන් හරහා සැලසුම් කණ්ඩායම ප්‍රධාන භෞතික යටිතල පහසුකම් සංරචකයන් අවධාරණය කරමින් විවිධ යටිතල පහසුකම් සපයයි. මෙම උපායමාර්ග අගනගර සංවර්ධන සැලැස්ම යටතේ ඇති අනෙකුත් උපායමාර්ගයන් සමඟ සම්බන්ධ වේ.

1. *සම්බන්ධිත මාර්ග ජාල පද්ධතිය*
2. *විකල්ප ප්‍රවාහන මධ්‍ය න් නිර්මාණය කිරීම*
3. *බහු ප්‍රවාහන මධ්‍යස්ථාන සංවර්ධනය*
4. *විදුලි සංදේශ සහ වෙනත් යටිතල පහසුකම්*
5. *පාරිසරික අංගයන් උපරිම ලෙස භාවිතා කිරීම*
6. *තොරතුරු තාක්ෂණ අධ්‍යාපන හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය*
   උපායමාර්ගික මැදිහත්වීම කර්මාන්ත සංවර්ධන සැලැස්ම

උපායමාර්ග මැදිහත්වීම 3 : කර්මාන්ත සංවර්ධනය

කාර්මික සංවර්ධන මැදිහත් වීමේ අවශ්‍යතාවයන් වන්නේ අගනගර සීමාවේ කාර්මික අවකාශයන් පැහැදිලිව හඳුනා ගැනීමයි. කාර්මික කලාපයන් ප්‍රවර්ධනය කිරීම හා මඟ පෙන්වීම සඳහා විශේෂ කර්මාන්ත කලාප හඳුනාගෙන විශේෂ රෙගුලාසි සකස් කර ඇත. ඒ අනුව අඹතලේ සහ සේදවත්ත යන ප්‍රදේශවල ගබඩා පහසුකම් ප්‍රවර්ධනය කරනු ලබන අතර කොරතොට නගරය මිශ්‍ර කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සකස් කෙරේ. විශේෂයෙන්ම ගෘහ ආශ්‍රිත කර්මාන්තය නියාමනය කිරීම සඳහා විශේෂ මාර්ගෝපදේශ රෙගුලාසි සකස් කර ඇත. මීට සමගාමීව,සැලසුම් සීමාව තුළ කාර්යක්ෂම කාර්මික පොකුරු ආර්ථිකයක් සාදා ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘති හඳුන්වා දෙනු ලැබේ.

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
බාහිර කවය - ගංඟා ආශ්‍රිත ගබඩා නීරු සංවර්ධන ව්‍යාපෘතිය SIII-E-9	සේදවත්ත - අඹතලේ කොරිඩෝ නීරය (කි.මී 1.5)	කැළණි ගඟ ආශ්‍රිතව පවත්නා ගබඩා කර්මාන්තය නැවත ව්‍යාප්ත කිරීම, සහ කොළඹ වාණිජ නගර සංවර්ධන සැලැස්ම (CCCP) මඟින් යෝජනා කරන ලද ජලාශ්‍රිත කොරිඩෝ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අබණ්ඩව ක්‍රියාත්මක කිරීමත් සමඟ කැළණි ගඟේ දර්ශනීය අලංකාරය වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින්ද පියවර ගැනීම.	වර්ග අඩි 1,263,885

වගුව 7.2 : උපායමාර්ගික ව්‍යාපෘතිය 1
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.5 : ව්‍යාපෘති 1 - ගංගා පාදක ගබඩා සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.1 : ව්‍යාපෘති 1 - ගංගා පාදක ගබඩා තීරු සැලසුම් සැකැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපාය මාර්ගික මැදිහත් වීම 4 : ව්‍යාපෘති මඟින් පොකුරු අවකාශ සහිත ආර්ථික ප්‍රවර්ධනය නැංවීම

ආර්ථික සංවර්ධන රටා සහ පොකුරු වීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අගනගරයේ ප්‍රධාන ආර්ථික වර්ධන නියාමනයන් සහ ප්‍රධාන පොකුරු ආර්ථිකයන් යෝග්‍යතා විශ්ලේෂණය මඟින් විශ්ලේෂණය කර ඇත. ආර්ථික සංවර්ධන උපාය මාර්ගය විශේෂ ව්‍යාපෘති මඟින්,වාණිජ ක්‍රියාකාරකම්හි අන්තර් සම්බන්ධතාවයන්ගේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහාත් හඳුනාගත් පොකුරු ආර්ථිකයන්ගේ ප්‍රවර්ධනය සඳහා අනිකුත් ආර්ථික උපායමාර්ගික හා යටිතල පහසුකම් සමඟ එක්ව කටයුතු කරයි.



සිතියම 7.6 : හඳුනාගත් ව්‍යාපෘති සමඟ ආර්ථික සංවර්ධන උපායමාර්ගයේ සංයුක්ත සිතියම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 1 : පිටත නගරය - කාර්යාල පොකුරු සංවර්ධනය

ව්‍යාපෘති යේ නම , ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටඟන්)
කාර්යාල පොකුරු සංවර්ධනය SI-E-1	කොටිකාවත්ත	නගර මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය බහුපාර්ශ්වීය කාර්යාලීය ආයතනයකි	කාර්යාල සහ ආයතන අවකාශය = වර්ග අඩි 440,000 සිල්ලර වාණිජ ආර්ථික අවකාශය = වර්ග අඩි 190,000

වගුව 7.3 : උපායමාර්ගික ව්‍යාපෘතිය 2
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.2 : ව්‍යාපෘති 2 - කාර්යාල පොකුරු සැලසුම් සැකැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.7 : ව්‍යාපෘති 2 - කාර්යාල පොකුරු සැලසුම් සැකැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 2 : පිටත නගරය – විශේෂ මිශ්‍ර සංවර්ධන කලාපය

ව්‍යාපෘති යේ නම , ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
විශේෂ මිශ්‍ර සංවර්ධන කලාපය SI-E-3	රාජගිරිය මඟී මංසන්ධිය - වැලිකඩ ප්ලාසා	මෙම වැලිකඩ ප්ලාසා ප්‍රදේශය පුනර්ජනය කරන ව්‍යාපෘතිය තුළ මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් වේ.	වාණිජ සහ සිල්ලර වෙළඳ සංවර්ධනය = වර්ග අඩි 800,000. නේවාසික අවකාශය = වර්ග අඩි 200,000

වගුව 7.4 : උපායමාර්ගික ව්‍යාපෘතිය 3
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.3 : ව්‍යාපෘති 3 - පිටත නගර විශේෂ මිශ්‍ර සංවර්ධන පිරිසැලසුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.8 : ව්‍යාපෘති 3 - පිටත නගර විශේෂ මිශ්‍ර සංවර්ධන පිරිසැලසුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 3 : නුගේගොඩ වෙළඳ සංකීර්ණ පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්වභාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
නුගේගොඩ වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය SII-E-7	නුගේගොඩ වෙළඳ සංකීර්ණ	නුගේගොඩ වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් වේ	කාර්යාල සහ ආයතන අවකාශය = වර්ග අඩි 100,000 වාණිජ සහ සිල්ලර වෙළඳ සංවර්ධනය = වර්ග අඩි 120,000 නේවාසික අවකාශය = වර්ග අඩි 97,000

වගුව 7.5 : උපායමාර්ගික ව්‍යාපෘතිය 4
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.4 : ව්‍යාපෘති 4 - නුගෙගෝඩා සුපිරි වෙළඳපල ප්‍රදේශ සැලසුම් සැකැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.9 : ව්‍යාපෘති 4 - නුගේගොඩ සුපිරි වෙළඳපල ප්‍රදේශ සැලසුම් සකසීම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංගය සහ පරිසරය සහ සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

සුපිරි වෙළඳ සංකීර්ණය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය -නුගේගොඩ
ආර්ථික සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංගය හා පරිසරය හා මූලික අංගය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 4 : විශ්ව විද්‍යාල ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
විශ්ව විද්‍යාල ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය SII -E-8	ශ්‍රී ජයවර්ධනයපුර විශ්ව විද්‍යාල මාසිම	මෙම විශ්ව විද්‍යාල ප්‍රදේශය පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය ට කරුණු 3ක් අන්තර්ගත වන අතර ඒවානම් වාණිජ පුනර්ජනනය , ප්‍රවේශය මාර්ග වැඩිදියුණු කිරීම සහ සැලසුම් රාමුව	වාණිජ සහ සිල්ලර වෙළඳ සංවර්ධනය = වර්ග අඩි : 1,800,000

වගුව 7.6: උපායමාර්ගික ව්‍යාපෘතිය 5
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.5 : ව්‍යාපෘති 5 - විශ්ව විද්‍යාල දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.10 : වැසෙකුඹු 5 - විශ්ව විද්‍යාල දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංගය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පිටත නගර සංවර්ධන ව්‍යාපෘතිය
ආර්ථික සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බස්නාහිර පළාත් අංගය හා පරිසරණ හා සුළුතු අංගය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 5 : රෙදිපිළි කර්මාන්ත කලාප සංවර්ධනය

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
රෙදිපිළි කර්මාන්ත කලාප සංවර්ධනය විවෘත අවකාශ සංවර්ධනය දුම්රිය ස්ථානය පුනර්ජනන ව්‍යාපෘතිය SI-E-2 (බස්නාහිර පළාත් අංශය සමඟ ඒකාබද්ධ වී ක්‍රියාත්මක වේ)	පමුණුව, මහරගම මහරගම නගර මධ්‍යය මහරගම දුම්රිය ස්ථානය	Facilitate area for wholesale and retail development	Commercial & Retail Space Development : 2000 Other Service area Development (Sq.ft) : 2000

වගුව 7.7 : උපායමාර්ගික ව්‍යාපෘතිය 6
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 7.6 : ව්‍යාපෘති 6 - පමුණුව රෙදිපිළි උද්‍යාන සංවර්ධන සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.11 : ව්‍යාපෘති 6 - පමුණුව රෙදිපිළි උද්‍යාන සංවර්ධන සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 6 : රෙදිපිළි කර්මාන්ත කලාප සංවර්ධනය

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය SIII-E-10 (බස්නාහිර පළාත් අංශය සමඟ ඒකාබද්ධ වී ක්‍රියාත්මක වේ)	මාලඹේ	තොරතුරු තාක්ෂණය සහ උසස් අධ්‍යාපනික කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය කිරීමට විධිවිධාන සැලැස්වීම	වාණිජ සහ සිල්ලර වෙළඳ සංවර්ධනය = වර්ග අඩි : 1,900,000 පාසැල් සහ උසස් අධ්‍යාපනන අවකාශය හා නේවාසික අවකාශය

වගුව 7.8 : උපායමාර්ගික ව්‍යාපෘතිය 7
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 7.7 : ව්‍යාපෘති 7 - දැනුම නගර සැලසුම් සැකැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය - මාලබේ
ආර්ථික සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය

සැකසුම :
බහුනාශිර සළාත් අංශය හා පරිශේෂණ හා මුහුණු අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

සිතියම 7.12 : ව්‍යාපෘති 7 - දැනුම් නගර සැලසුම්

මූලාශ්‍රය : බහුනාශිර පළාත් අංශය සහ පරිශේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 7 : කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්භාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටඟන්)
කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතිය SII-E-4 (බස්නාහිර පළාත් අංශය සමඟ ඒකාබද්ධ වී ක්‍රියාත්මක වේ)	කොට්ටාව නගර මධ්‍ය මහරගම නගර මධ්‍ය	මෙම මිශ්‍ර සංවර්ධනය වාණිජ හා නේවාසික අවකාශ සමඟින් බස් නැවතුම්පළ යළි ස්ථානගත කිරීම අයත් වේ	මාකුඹුර සංවර්ධන ව්‍යාපෘති යේ වර්ග භූමි ගණයට ඇතුළත් කර ඇත

වගුව 7.9 : උපායමාර්ගික ව්‍යාපෘතිය 8
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.8 : ව්‍යාපෘති 8 - කොට්ටාවා නගර සංවර්ධන සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.13 : ව්‍යාපෘති 8 - කොට්ටාවා නගර සංවර්ධන සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ව්‍යාපෘති යේ නම, ව්‍යාපෘති කේත අංකය	ස්ථානය	සංවර්ධනයේ ස්වභාවය	අපේක්ෂිත භූමි ප්‍රමාණයේ (පියසටහන්)
ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘය SI-T-2	මාකුඹුර,කොට්ටාව	මිශ්‍ර සංවර්ධන ක්‍රියාකාරකම් සමඟ විවිධ ප්‍රවාහන මධ්‍ය හඳුන්වාදීම	කාර්යාල සහ ආයතන අවකාශය = වර්ග අඩි : 200,000 වාණිජ සහ සිල්ලර වෙළඳ සංවර්ධනය = වර්ග අඩි : 800,000 නේවාසික අවකාශය = වර්ග අඩි 200,000 (Foot Print)

වගුව 7.10 : උපායමාර්ගික ව්‍යාපෘතිය 9
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018





රූපය 7.9 : මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 7.14 : මාකුඹුර බහුවිධ ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථාන සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික විශේෂ ව්‍යපෘති 8 : මාකුඹුර සංකේන්ද්‍රිත ප්‍රවාහන මූලික සංවර්ධනය

7.7. ආර්ථික සංවර්ධන උපායමාර්ගික ව්‍යාපෘති වල බලපෑම

ඉහත ව්‍යාපෘති වල ආර්ථික කාර්ය සාධන බලපෑම නිර්ණායක දෙකක් මත පදනම්ව සිදු කරන ලදී;

1. *අමතර, ව්‍යාපෘති හරහා වාණිජ අවකාශය එකතු කිරීම.*
   (පවතින තත්වය නිර්ණය කරන ක්‍රමය මගින් නිරූපනය කරන අමතරව එක්

උපායමාර්ගික ව්‍යාපෘති හරහා එකතු කළ මුළු ඉඩ ප්‍රමාණය	එකතුවන මුළු බිම් ප්‍රමාණය	සමස්ත දළ රැකියා උත්පාදනය
එකතු කළ වාණිජ හා සිල්ලර වර්ග අඩි	27 මිලියන	50,160 (20%)
මුළු එකතු කළ ආයතනය වර්ග අඩි	4.2 මිලියන	3,901 (10%)
සම්පූර්ණ කරන ලද පුද්ගලික කාර්යාල වර්ග අඩි	1 මිලියන	1,548 (50%)
මුළු පුනර්ජනනීය කර්මාන්ත ගබඩාව වර්ග අඩි	1.2 මිලියන	445 (20%)
එකතු කළ නේවාසික වර්ග අඩි	1.3 මිලියන	

වගුව 7.11 : ව්‍යාපෘති මගින් අගනගරය සඳහා එකතු කරන ලද අවකාශීය ප්‍රමාණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

කරන ලද අවකාශය තුළ මෙම අවකාශය නිරූපනය නොවේ)

2. *රජයේ මැදිහත්වීම තුළින් අතිරේක රැකියා උත්පාදනය*

- *ව්‍යාපෘති හරහා සමස්ත ඍජු දළ රැකියා උත්පාදනය = 56,054*
- *මුළු ශ්‍රම බලකා සහභාගීත්වය = 36.24% (2016)*
- *ස්වාභාවික වර්ධන වේගය L.F.P = 44.6% (2030)*
- *සමස්ත ශ්‍රම බලකා සහභාගීත්ව ව්‍යාප්තිය = 50.86% (2030)*
  (සැලසුම් ප්‍රදේශය)

08

පරිපාලන උපායමාර්ගික සැලසුම

08 පරිච්ඡේදය
පරිපාලන
උපායමාර්ගික සැලසුම

හැඳින්වීම

ඉලක්ක හා අරමුණු

ප්‍රවේශය

පරිපාලන සංවර්ධන
උපායමාර්ගයේ විෂය පථය

8.1. හැඳින්වීම

8.1.1. ඉලක්ක හා අරමුණු

ශ්‍රී ලංකාවේ යෝජිත අගනගර ප්‍රදේශයෙහි පවත්නා තත්ත්වය සලකා බලන විට, හෙක්ටයාර 170 ක භූමි ප්‍රදේශයක් තුළ ජාතික මට්ටමේ ආයතන (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන) 99 කට හා රජයේ සේවකයන් 26,000 කට පමණ පහසුකම් සලසයි.

යෝජිත අගනගර සැලැස්ම මඟින් තෙත් බිම්තුළින්ආවරණය වූ යෝජිත පරිපාලන දිස්ත්‍රික්කයට ජාතික මට්ටමේ ආයතන විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනු ඇත. ජන හා සංඛ්‍යාලේඛන දත්ත (2017) අනුව කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන 266 ක් ඇති අතර එයින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන 214 ක් යෝජිත පරිපාලන නගරය තුළ නැවත පදිංචි කිරීමට සුදුසු ලෙස හඳුනාගෙන තිබේ.

8.1.2. ප්‍රවේශය

ඒ අනුව, මෙම සැලැස්මෙහි ප්‍රධාන අරමුණු වන්නේ,

1. පරිපාලන කටයුතුවලට වැඩි ඉඩක් ලබා දීම මඟින් අගනගරයේ අනන්‍ය ලක්ෂණ වැඩි දියුණු කිරීම සමඟ පරිපාලන කාර්යයන් පිළිබඳ හැඟීමක් ජනිත කිරීම.
2. පොකුරු කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමෙන් කාර්යක්ෂම හා සුමට පරිපාලන පහසුකම් සැපයීම.

8.2. පරිපාලන සංවර්ධන උපායමාර්ගයේ විෂය පථය

- *සංවර්ධන සැලැස්මෙහි මෙම කොටසෙහි යෝජනා කර ඇති සියලු උපාය මාර්ගික ව්‍යාපෘති ,සංවර්ධන සැලැස්මෙහි 1 පරිච්ඡේදයේ නිශ්චිත කාල සීමාව තුළ සැලසුම් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මෙම කාලසීමාව ඉක්මවා යන කරුණු සංවර්ධන සැලැස්ම කාලීනව යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.*

- *මෙම උපායමාර්ගය මඟින් අග නගර සංවර්ධන සැලැස්මෙහි සඳහන් පරිදි පරිපාලන දිස්ත්‍රික්කයට ජාතික මට්ටමේ පරිපාලන ආයතන පහසුකම් සැලසීම සහ පහසුකම් සැලසීම අරමුණු කොට ඇත.*

- *මෙම සැලස්ම අපේක්ෂිත කළ හැකි සමාජ ආර්ථික, යටිතල පහසුකම්, තාක්ෂණයේ දියුණුව සහ පවතින දත්ත මත ප්‍රක්ෂේපිත සමාජ ජන තත්ත්වය සලකිලට ගෙන ඇත. කිසියම් අනපේක්ෂිත හා පෙර නොවූ විරූ සිදුවීම් හෝ කොන්දේසි කාලෝචිත මැදිහත්වීම් සමඟ විසඳිය යුතුය.*

8.3. පරිපාලන කටයුතු සංවර්ධනය සඳහා උපායමාර්ගික මැදිහත්වීම්

මෙම උපාය මාර්ගය අදියර දෙකකින් සමන්විත වේ.

1. 01 පොකුර - පරිපාලන ප්‍රදේශය ප්‍රතිසංවිධානය කිරීම
2. 02 පොකුර - නගර සංවර්ධනය හා මාර්ග වැඩිදියුණු කිරීම



රූපය 8.1 : පරිපාලන සංවර්ධන උපාය මාර්ග සංකල්පය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 8.1 : පරිපාලන පොකුරු සංවර්ධන උපායමාර්ගයේ සංයුක්ත සිතියම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශීලන හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

පරිපාලන නගර සැලැස්ම
පරිපාලන සංවර්ධන උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා මුහුණු අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

පරිපාලන කටයුතු සංවර්ධනය සඳහා උපායමාර්ගික මැදිහත්වීම්

උපායමාර්ගික මැදිහත්වීම 1 : පරිපාලන ප්‍රදේශය පුනර්ජනනය සඳහා උපායමාර්ගික මැදිහත්වීම (පොකුරු 01)

උපායමාර්ගික මැදිහත්වීම 2 : නගර සංවර්ධන හා මාර්ග වැඩි දියුණු කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම

උපායමාර්ගික මැදිහත්වීම 1 : පරිපාලන ප්‍රදේශය පුනර්ජනනය සඳහා උපායමාර්ගික මැදිහත්වීම (පොකුරු 01)

ජාතික මට්ටමේ වැදගත්කමක් සහිත පරිපාලන ආයතනවල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ඉඩම් වෙන් කිරීම මඟින් 01 පොකුර ප්‍රදේශය නැවත සකස් කිරීමට යෝජනා කරයි. එසේ කිරීම සඳහා පහත සඳහන් නිර්ණායක සැලකේ.

1. *පවත්නා පරිපාලන ආයතනවල පිහිටීම*
2. *පවත්නා මාර්ග ජාලය*
3. *යෝජිත මාර්ග සහ ප්‍රවාහන ව්‍යපෘති (පොල්දූව මාර්ග ව්‍යපෘතිය, යෝජිත සැහැල්ලු දුම්රිය පද්ධතිය, යෝජිත සැහැල්ලු දුම්රිය සඳහා නැවතුම් ස්ථාන සහ නාගරික අධිවේගී මාර්ගය)*

පරිපාලන පොකුරු 01 සංවර්ධනය සඳහා අක්කර 70 ක පමණ ප්‍රදේශයක් පරිපාලන කටයුතු සඳහා යෝජනා කරයි. මෙම භූමි ප්‍රමාණයෙන් අක්කර 18 ක් සෙත්සිරිපාය පළමු අදියර, 2 වන අදියර, සුහුරුපාය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ යෝජිත සෙත්සිරිපාය අදියර 3 ගොඩනැගිලි සංකීර්ණය යනාදියෙන් සමන්විත වේ. තවද, පොකුර 01 ප්‍රදේශයේ හරිත අවකාශී වැඩි කිරීමට යෝජනා කරන අතර දියත උයන විස්තීරණය කිරීමේ ව්‍යපෘතිය ද මෙම සැලසුමට අන්තර්ගත කරගනු ලැබේ.

උපායමාර්ගික මැදිහත්වීම 2 : නගර සංවර්ධන හා මාර්ග වැඩි දියුණු කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම

වර්තමානයේ පරිපාලන ආයතන බත්තරමුල්ලේ සහ පැලවත්ත ප්‍රදේශය පුරා පැතිරි තිබේ. මෙම උපායමාර්ගය මඟින් බත්තරමුල්ලේ සිට තලවතුගොඩ දක්වා පරිපාලන ආයතන ස්ථාපිත කිරීම දිරිමත් කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රධාන වශයෙන් පොකුරු 02 ප්‍රදේශයේ පරිපාලන කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැපයීමට මෙම සංවර්ධනය අරමුණු කර ඇත. පොකුරු 02 ප්‍රධාන වශයෙන් පහත සඳහන් ලෙස කොටස් තුනක් සමන්විත වේ.

1. *කොස්වත්ත නගර සංවර්ධනය*
2. *තලවතුගොඩ නගර සංවර්ධනය*
3. *පොකුරු 02 ප්‍රදේශය තුළ මාර්ග වැඩිදියුණු කිරීම*

8.4. පරිපාලන නගර සංවර්ධනය සඳහා උපායමාර්ගික ව්‍යපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1 : පරිපාලන ප්‍රදේශය පුනර්ජනනය සඳහා උපායමාර්ගික මැදිහත්වීම (පොකුරු 01)

උපායමාර්ගික ව්‍යාපෘති 1 : පොකුරු 1 ප්‍රදේශය නැවත සැලසුම් කිරීම



රූපය 8.2: පරිපාලක සැලැස්ම පොකුරු 1 සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 2 : නාගරික අවකාශයන් සහ විනෝදාත්මක උද්‍යාන සඳහා ඉඩම් පරිවර්තනය කිරීම

පරිපාලන ආයතන පිහිටා ඇති ගොඩනැගිලි ආසන්නයේ පිහිටි ඉඩම් නාගරික ස්ථාන හා හරිත අවකාශයෙන් යුතු උද්‍යාන බවට පත්කිරීමටත්, ඒ තුළින් නිලධාරීන්ට හා සාමාන්‍ය ජනතාවට සුව පහසුව සලසා දීමටත් යෝජනා කෙරේ. තවද, දියත උයන විස්තීරණය කිරීමේ ව්‍යාපෘතිය මෙම සැලසුමට අන්තර්ගත කරගන්නා අතර ආසන්නයෙන් ගලා බසිනා ඇළ මාර්ගය පුනර්ජීවනය කර දියත උයන සිට කොස්වත්ත නගරය දෙසට ආකර්ෂණීය භූ දර්ශනයක් නිර්මාණය කිරීමට යෝජනා කෙරේ.



රූපය 8.3: පොකුරු I - පරිපාලන ප්‍රදේශ පුනර්ජනන ව්‍යාපෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 8.4: පොකුරු I - පරිපාලන නගරය තුළ අපේක්ෂිත නාගරික ස්වරූපය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 2 : නගර සංවර්ධනය හා මාර්ග වැඩිදියුණු කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීම (පොකුරු 02)

උපායමාර්ගික ව්‍යාපෘති 1 : කොස්වත්ත නගර සංවර්ධනය

අගනගර ප්‍රදේශය තුළ පවතින නගර ප්‍රමුඛතා පිළිවෙලට සැකසූ විට කොස්වත්ත නගරය එහි ප්‍රමුඛතම නගරයක් වේ. එම නිසා අපේක්ෂිත ප්‍රතිරූපය ළඟා කරගනිමින් දැවැන්ත සංවර්ධනයක් කොස්වත්ත නගරය තුළ ඇතිකිරීමට අපේක්ෂා කෙරේ. තවද, අගනගරයේ පරිපාලන කොට්ඨාශය ට ප්‍රවේශයක් වීම හේතුවෙන් කොස්වත්ත යෝජිත සංක්‍රාන්ති මංසන්ධියක් ලෙස හඳුන්වාදිය හැක.මේ නිසා, මෙම සැලසුම කොස්වත්ත නගරය කෙරෙහි විශේෂ අවදානයක් යොමු කර තිබෙන බව අවධාරණය කළ යුතුය. ඒ අනුව, යෝජිත පරිපාලන අවකාශයේ අපේක්ෂිත භාවිතයන් සපුරා ගැනීම සඳහා පහත සඳහන් ව්‍යපෘතින් හඳුන්වා දී තිබේ.

1. මාර්ග සහ ප්‍රවාහන ජාල සංවර්ධනය
2. විශේෂ ප්‍රවේශ මාර්ග
3. බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය
4. මිශ්‍ර සංවර්ධන ප්‍රදේශ
5. ඇළ ප්‍රතිසංස්කරණය
6. රඳවා ගැනීමේ පොකුණ
7. පදික මංතීරු වැඩිදියුණු කිරීම

Sub-Project 1 : Road and Transport Network Development of Koswatta Town

මෙම නගරය පරිපාලන භාවිතයන් සඳහා හඳුනා ගත් පළමු පෙළ ප්‍රමුඛ නගරයක් බැවින් මාර්ග අතර සම්බන්ධතාවය හා ප්‍රවේශය වැඩි කිරීම අත්‍යවශය වේ. එම නිසා කොස්වත්ත නගරයට පහත පරිදි ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමට යෝජනා කර තිබේ.

මාර්ග සංවර්ධන ප්‍රවර්ධන උපාය මාර්ගය මඟින් නාගරික ක්‍රියාකාරී මහා මාර්ගයක් (ප්‍ර 1) ලෙස හඳුනාගෙන ඇති කොළඹ හා කඩුවෙල හරහා වෙනත් ප්‍රදේශයන් සමඟ සම්බන්ද වන නව නුවර පාර කොස්වත්ත නගරය හරහා ගමන් කිරීම තුළින් වර්තමානයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කැළණිය, කොළොන්නාව හා කලපළුවාව මාර්ගය (මංතීරු හතරක්

ලෙස යෝජිත) ද කොස්වත්ත නගරය සමඟ සම්බන්ද වේ. තවද රොබට් ගුණවර්ධන මාවත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත හා පයිප්ප පාර කොස්වත්තට යාබදව පිහිටා ඇත.

නව කැළණි පාලම සිට අතුරුගිරිය හන්දිය උස් වූ අධිවේගී මාර්ගය (කිලෝ මීටර් 17.3) ද මාලඹේ සිට කොළඹ දක්වා (කිලෝමීටර් 21.3) ද හුණුපිටිය සිට මාකුඹුර දක්වා ඉදිකිරීමට යෝජිත සැහැල්ලු දුම්රිය ගමනාගමනය මාර්ගය ද කොස්වත්ත හන්දිය හරහා ගමන් කිරීමට යෝජිතය. එ අනුව අනාගතයේදී කොස්වත්ත ප්‍රවාහන මධ්‍ය ත්‍රිත්වයකින් සමන්විත ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් වනු ඇත.

1.2 : විශේෂ ප්‍රවේශ මාර්ග

කොස්වත්ත විශේෂ පිවිසුම් ද්වාර ලෙස පිළිගනු ලැබේ. එහිදී භූ දර්ශනයේ ධූරාවලිය වෙනස් කිරීම මඟින් අභිමානනීය ප්‍රවේශයක් ඇතිකිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, ධූරාවලියේ පළමු අත්දැකීම කොස්වත්ත සිට මාලඹේ දක්වා නව නුවර මාර්ගයෙන් ද දෙවන අත්දැකීම කොස්වත්ත සිට නව අකුරේගොඩ මාර්ගය දක්වා ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගයෙන් ද ලබා දෙනු ඇත.

1.3 : බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය

පර්ෂද 2 කලාපය සඳහා යෝජිත කොස්වත්ත බහු ආදර්ශ ආකෘතිය ප්‍රධාන කොස්වත්ත නගරය සඳහා යෝජිත ප්‍රධාන සංරචකයක් වේ. යෝජිත පළමු පෙළේ නගරයක් වන කොස්වත්ත ත්‍රිත්ව ප්‍රවාහන මධ්‍ය න්ගෙන් සමන්විත බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය හේතුවෙන් පරිපාලන දිස්ත්‍රික්කයෙහි මධ්‍ය ලක්ෂ්‍ය ලෙස ද කටයුතු කරනු ලැබේ.

ත්‍රිත්ව ප්‍රවාහන මධ්‍ය (මහා මාර්ග, සැහැල්ලු දුම්රිය මාර්ග හා අධිවේගී මාර්ගය) යන මධ්‍ය න් තුනම කොස්වත්ත නගරය හරහා ගමන් කිරීමට යෝජිත බැවින් කොස්වත්ත නගරය ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස හඳුනා ගත හැක. එ හේතුවෙන් කොස්වත්ත නගරය බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය තැනීමට සුදුසු තැනක් ලෙස හඳුනා ගැනේ. මෙය පොකුරු 01 සහ පොකුරු 02 හි පරිපාලන කටයුතු සඳහා පහසුකම් සපයන අතර බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය ආශ්‍රිතව ඇළ මාර්ග පුනර්ජනනීය කිරීම හා භූ දර්ශනය හා පදික මංතීරු වැඩි දියුණු කිරීමටත් යෝජිතය.

කොස්වත්ත නගරයට ආසන්නයේ පිහිටා ඇති අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අත්කර ගැනීමට යෝජිත ඉඩමක් බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජනා කෙරේ. එම නිසා ආදර්ශක මධ්‍යස්ථානය සඳහා අතිරේක ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය නොවේ. තවද , යෝජිත ස්ථානය කොස්වත්ත හන්දියට ආසන්නයේ පිහිටා තිබුණද, අනෙකුත් ක්‍රියාකාරකම් වලට බාධා නොකරනු ඇත.



රූපය 8.5 : යෝජිත කොස්වත්ත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිවේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උප ව්‍යාපෘති 4 : මිශ්‍ර සංවර්ධන ප්‍රදේශය

කොස්වත්ත නගරයේ ඉඩම්වල ප්‍රශස්ත වටිනාකම ලබා ගැනීම සඳහා ඉඩම් ප්‍රති ව්‍යුහගත කිරීම සමඟ මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා දැනට පවත්නා ඩිපෝ ඉඩම (අක්කර 6 පමණ) යෝජනා කරන අතර එ තුළින් කොස්වත්තට තවදුරටත් සංවර්ධනය ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

උප ව්‍යාපෘති 5 : ඇළ ප්‍රතිසංස්කරණය / ජලය රඳවා තැබීමේ පොකුණ / ඇවිදීමේ මාර්ග වැඩිදියුණු කිරීම

මෙය දර්ශනීය දසුනක් සහිත පොදු භූමියක් බවට පත්කිරීමට යෝජනා කරන බැවින් විවෘත එළිමහන් ස්ථාන සහ ඇවිදින මාර්ග වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වේ. එබැවින් යෝජිත රඳවා තැබීමේ පොකුණ හා ඇළ ප්‍රතිසංස්කරණ භූමියට යාබදව ඇවිදීමේ මාර්ග යෝජනා කරනු ලැබේ. යෝජිත බහු විධ ප්‍රවාහන මධ්‍ය ස්ථානයට යාබදව දැකිය හැකි කැබලි කැඩුණු තෙත් බිම් භාවිතා කිරීමෙන් රඳවා තැබීමේ පොකුණක් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.

තවද, දියත උයන සිට කොස්වත්ත හන්දිය දක්වා (කිලෝමීටර 2 ක් පමණ) දුරක් ඇළ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර ඇති අතර පරිපාලන පොකුරු 1 හා 2 සඳහා දර්ශනීය දර්ශනයක් ලබා දෙනු ඇත.එමෙන්ම ඇතුළු නගරයේ යෝජිත ඇළ මාර්ගය ඔස්සේ සහ අභ්‍යන්තර නගර උද්‍යාන ය ඔස්සේ ඇවිදින මාර්ගයක් සංවර්ධනය කිරීමට යෝජිතය.



රූපය 8.6 : කොස්වත්ත නගර සංවර්ධන ව්‍යාපෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 8.7 : කොස්වත්ත නගර සංවර්ධන ව්‍යාපෘති පිරිසැලසුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 2 : තලවතුගොඩ නගර සංවර්ධනය

තලවතුගොඩ නගරය යෝජිත තෙවන ප්‍රමුඛ නගරයක් වන අතර එය අගනගර උද්‍යාන යට සීමා වී ඇත. තවද තලවතුගොඩ අභ්‍යන්තර නගරයට ඇතුළත්වීම සඳහා වන සංක්‍රමණික ලක්ෂයක් ලෙස ද ක්‍රියා කිරීමට යෝජිතය. තලවතුගොඩ නගරය කොස්වත්ත නගරයට සමාන ලෙස සංවර්ධනය කිරීමට යෝජිත නොවනු ඇත. ප්‍රදේශය භාවිතා කරන්නන් හට වෙනස් අත්දැකීමක් ඇති කිරීම සඳහා විවෘත අවකාශයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වයි.

තලවතුගොඩ නගර සංවර්ධනය පහත සඳහන් උප ව්‍යාපෘති වලින් සමන්විත වේ;

උප ව්‍යාපෘති 1 : පරිපාලන ප්‍රදේශය සංවර්ධනය

යෝජිත පරිපාලන පොකුරු අතරින් දෙවැනි පොකුරේ පිහිටා ඇති දෙවැනි නගරය ලෙස තලවතුගොඩ හැඳින්විය හැක. එබැවින්, තලවතුගොඩ නගර ම යාබද අක්කර 03 ක භූමි ප්‍රදේශයක් ඉඩම් ප්‍රතිසංස්කරණය ඇතුළුව පරිපාලන කටයුතු සමඟ සංවර්ධනය කිරීමට යෝජිතය.

උප ව්‍යාපෘති 2 : විනෝදාත්මක ප්‍රදේශ සංවර්ධනය

අගනුවර නාගරික උද්‍යාන යේ කොටසක් තලවතුගොඩ හන්දියේ කේන්ද්‍රස්ථානයේ පිහිටා ඇත. එබැවින්, ඉඩම් ප්‍රතිව්‍යුහගත කර සහිතව විනෝදාත්මක ප්‍රදේශයක් ලෙස අක්කර 2 ක ප්‍රදේශයක් සංවර්ධනය කිරීම සඳහා යෝජනා කෙරේ.



රූපය 8.8 : තලවතුගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 8.9: තලවතුගොඩ නගර සංවර්ධන ව්‍යාපෘති පිරිසැලසුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 3 : පොකුරු 02 ක් සඳහා මාර්ග වැඩිදියුණු කිරීම

යෝජිත පරිපාලන ආයතන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීමට පොකුරු 2 ප්‍රදේශයට මාර්ග හතරක් යෝජනා කෙරේ.

1. *ගණහෙන සිට හෝකන්දර දක්වා මංතීරු හතරකින් යුතුව මාර්ගය සංවර්ධනය කිරීම*

   පළමු අදියර : *ගණහෙන සිට රොබට් ගුණවර්ධන මාවතේ සිට ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය දක්වා මාර්ගය මංතීරු හතරකින් යුතුව සංවර්ධනය කිරීම (0.39km)*
   දෙවන අදියර : *ආරක්ෂක අමාත්‍යාංශය ගොඩනැගිල්ල සිට හෝකන්දර දක්වා මාර්ගයේ මංතීරු හතරකින් යුතුව සංවර්ධනය කිරීම (1.2km)*

2. *තලංගම වැවට හා තෙත් බිමට යාබදව කොස්වත්ත සිට හෝකන්දර දක්වා අර්ධ වෘත්තාකාර හැඩයකින් යුතුව මංතීරු හතරක මාර්ගයක් ඉදි කිරීම*

3. *හෝකන්දර පාර මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම*

4. *ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම*



සිතියම 8.2 : පොකුරු II සඳහා මාර්ග වැඩිදියුණු කිරීම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

පොකුර	ක්‍රමෝපාය ව්‍යපෘති කේතය	ව්‍යපෘතියේ නම
පොකුර 1	SI-A-1	පොකුර 1කලාපය නවීකරණය කිරීම
	SI-A-2	නාගරික ස්ථාන සහ විනෝදාස්වාද උද්‍යාන සඳහා ඉඩම් පරිවර්තනය කිරීම
පොකුර 2	SII-A4	කොස්වත්ත නගර සංවර්ධන ව්‍යාපෘතිය
	SII-A-5	තලවතුගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය
	SI-A-6	පොකුර 2 ප්‍රදේශය සඳහා මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

වගුව 8.1 : පරිපාලන පොකුරු සංවර්ධන උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

8.5. පරිපාලන නගර සංවර්ධන උපාය මාර්ගයේ බලපෑම

- *අගනගර සැලසුම්කරණ ප්‍රදේශයේ පවත්නා තත්ත්වය සැලකිල්ලට ගත් විට, මෙම ප්‍රදේශය තුළ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය කාර්යාල 99 ක් පිහිටා ඇති අතර ජාතික මට්ටමේ ආයතන 214 ක් කොළඹ නගර සීමාවෙන් ඉවත් කිරීමට සුදුසු ලෙස හඳුනා ගෙන ඇත. අවසාන වශයෙන්, මෙම සැලසුම්කරණ ප්‍රදේශය මධ්‍යම රාජ්‍ය ආයතන 165 ක් සහ අර්ධ රාජ්‍ය ආයතන 148 ක් සඳහා පහසුකම් සපයනු ඇත.*

- *යෝජිත පරිපාලන ප්‍රදේශයෙහි දැනට පවතින පරිපාලන පිලිබඳ සැලකිල්ලට ගත් විට, භූමි පරිහරණයන් 3.2% ක් දැනට පරිපාලන ආයතනය විසින් ආවරණය කරනු ලැබේ. පිහිටුවීමට යෝජිත රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය කාර්යාල හේතුවෙන් භූමි පරිහරණයට 3.4% අලුතෙන් එක්වන අතර ඒ හේතුවෙන් සමස්ත භූමි පරිහරණයෙන් 6.6% ප්‍රදේශයක් පරිපාලන කටයුතු සඳහා යොදා ගැනේ.*

- *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දත්ත අනුව, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින් 26,000 ක් සහ යෝජිත කාර්යාලීය ඉඩ පහසුකම් සහිතව වැඩ කිරීමට හැකියාවක් ඇති අතර, යෝජිත පරිපාලන ප්‍රදේශය සඳහා සේවකයින් 37,000 ක අතිරේක සංඛ්‍යාවක්ද රැකියා සඳහා මෙම ප්‍රදේශයට පැමිණෙනු ඇත. කරනු ලැබේ. එබැවින්, මෙම උපාය මාර්ගය තුළින් ආසන්න වශයෙන් රජයේ සේවකයින් 63,000 කට පහසුකම් සැලසෙනු ඇත.*

- *ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර 650,000 ක ප්‍රමාණයක් තුළ පැතිරී පවත්නා ආයතන අගනගරයට ගෙන එන බැවින් කොළඹ නගර සභාවේ එම ප්‍රදේශය කොළඹ ආර්ථික කටයුතු සඳහා යොදා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසේ.*



09

නෙත්බිම් සංවර්ධන උපායමාර්ගය

9.1. හැදින්වීම

9.1.1. ඉලක්ක හා අරමුණු

නාගරික තෙත්බිම්, නගරයක් තුළ ජීවත වීමට සුදුසු වටපිටාවක් ඇති කිරීමට ඉතා වටිනා මෙහෙයක් සිදු කරනු ලබයි. ගංවතුර අවධානම අඩු කිරීම, පානීය ජලය ලබාගැනීම, අපද්‍රව්‍ය පෙරීම, නාගරික හරිත ප්‍රදේශයන් බිහි කිරීම, වාතය පිරිසිදු කිරීම, විවිධ ජීව විද්‍යාත්මක කියකරකම් හා විවධ වූ ජීවීන් සඳහා ජීවත් වීමට යෝග්‍යය වූ පරිසරයක් සැලසීම ඒ අතරින් ප්‍රධානතම කාර්යන් ලෙස හඳුනාගත හැක. උදාහරණයක් ලෙස (රණසිංහ 2018) කොළඹ තෙත් බිම් මඟින්, වැසි ජලයෙන් 39% ක් ස්වභාවික ජල රැඳවුම් ලෙස ක්‍රියාත්මක වන අතර එමඟින් තෙත්බිම් ස්වභාවික ගංවතුර බාධකයක් ලෙස ක්‍රියත්මක වනු ලබයි. එමෙන්ම කාබන්ඩයොක්සයිඩ් ඉවත් කිරීම මඟින් දේශගුණික විපත් අවම කිරීම සඳහා ද තෙත්බිම් උපකාරී වේ. කොළඹ නගරය තෙත් බිම් නගරයක් ලෙස රැම්සා සම්මුතිය මඟින් හඳුනා ගෙන ඇති අතර ,කොළඹ තෙත් බිම් ජාලය සඳහා බැද්දගාන, දියසාරු, හීන් ඇළ, කොළොන්නාව, කෝට්ටේ, මාදින්නාගොඩ, මුල්ලේරියාව සහ තලංගම ආශ්‍රිත තෙත් බිම් අයත්වේ. කෙසේ වෙතත්, වර්තමානයේ සමාජය තුළ මෙම තෙත් බිම් ආරක්ෂා කිරීම පිළිබඳ අවම සැලකිල්ලක් දක්නට ඇත. එබැවින් තෙත්බිම් සංරක්ෂණය පිළිඹඳ විද්‍යාත්මක භාවිතයකින් අගනගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව, ශ්‍රී ලාංකීය අගනගරය තුළ තෙත්බිම් පද්ධතින් සංරක්ෂණය කිරීම සඳහා තෙත්බිම් සංරක්ෂණය පිළිඹඳ උපාය මාර්ගික සැලසුමක් හඳුන්වා දෙනු ලබයි. තවද එම සැලසුමතුළින්ස්වාභාවික සම්පත් අහිමි වීම වැළැක්වීම සඳහාත්, ආපදා වළක්වා ගැනීමත්, සැලසුම්කරණ ප්‍රදේශයෙහි දිගු කාලීන පාරිසරික ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා පද්ධතියක් ලෙස එක්ව ගෙන එය ආරක්ෂා කර ගැනීමට සැලසුම සකස් කර ඇත.

අගනගර කලාපය තුළ පවතින්න වූ ප්‍රධානතම ස්වාධාවික අංගයක් ලෙස කැළණි ගග හඳුනාගත හැකි අතර පරිසරයේ ස්වභාවික සැලසුම වෙනස් වීම නිසා ප්‍රදේශය තුළ පවතින්නා වූ ගංවතුර තත්වයන්ට ද මෙය ප්‍රධානතම හේතුවක් ලෙස සැලකිය හැක. වැසි කාලය තුළ ගංඟා වලින් පිට වන වැඩි ජලය ගලායාම සඳහා ස්වභාවික තෙත් බිම්පැවතුනිද, අවිධිමත් හා පාලනය නොකරන ලද සංවර්ධනයන් නගරය පුරා පැතිර ඇති නිසා ස්වභාවික තෙත්බිම් පද්ධතිය විනාශ වීමෙන් ප්‍රදේශය තුළ ගංවතුර ඇතිවීමට. අගනගර කලාපය තුළ සීග්‍රයෙන් සිදුවන්නා වූ අනවසර ඉදිකිරීම් දිනෙන් දින වැඩිවීම සඳහා හේතු සාධක ලෙස කොළඹ වාණිජ නගරයට ඉතා ආසන්නව පිහිටීමත් නමුත් එම ප්‍රදේශ තුළ ඉඩම් මිල අඩුවීමත් සැලකිය හැක. එමෙන්ම සංවර්ධනය සඳහා වූ ඉඩම් හිඟකම නිසාම තෙත්බිම් අනවසරයෙන් අත්පත් කරගැනීම හා එහි සෘජු හා වක්‍ර ප්‍රතිඵලයන් ලෙස ජල මාර්ග විනාශත් වීම සිදුවිය හැක. එහි බලපෑමක් වශයෙන් ස්වාභාවික ජලාපවාහන පද්ධතිය අකර්මන්‍ය වී ඇති අතර ගංවතුර අවධානම ඉහළ ගොස්ඇත. එම නිසා ප්‍රදේශයේ යෝජනා අවස්ථා දිනෙන් අඩුවෙමින් පවති. එබැවින් තිරසාර පාරිසරික උපාය මාර්ගයේ අභිප්‍රාය වී ඇත්තේ නීල හරිත ජාලයක් ලෙස අගනගර කලාපය තුළ තෙත්බිම් දාමය මෙන්ම අනිකුත් ජලජ හා හරිත පද්ධතීන් සංරක්ෂණය කිරීමය.

9.1.2. ප්‍රවේශය

අගනගර සංවර්ධන සැලසුම තුළ ප්‍රධාන වශයෙන් අන්තර්ගත වන්න වූ ඉලක්කයක් වන තෙත්බිම් තුළින් නගරය සංවර්ධනය කිරීම ප්‍රමුඛ වන අතර, ප්‍රදේශය පුරා පවතින තෙත්බිම් පද්ධතිය ඒ සඳහා වූ ප්‍රධාන විභවතාවක් ලෙස දක්වාලිය හැක. අගනගරය සඳහා වූ තෙත්බිම් සංවර්ධන සැලසුමේ අන්තර්ගත ප්‍රධාන අරමුණු තුන මඟින් ස්වභාවික පරිසර පද්ධතිය නාගරික පුනර්ජීවනය සඳහා අනාගතයේදී යොදාගැනීමට කටුතු කර ඇත. ඒ සඳහා,

- *2030 වන විට පාරිසරික ස්ථාවරත්වය සඳහා 100% තෙත් බිම් පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම.*
- *2030 වන විට තෙත් බිම් ධූරාවලියක් හඳුන්වා දීම.*
- *නාගරික ප්‍රදේශ සඳහා අවශ්‍ය වන්න වූ විවෘත අවකාශය සපුරා ගැනීම සඳහා 100% තෙත්බිම් පරිසර පද්ධතිය නිරාවරණය කිරීම හා ඒ තුළින් දේපළ වටිනාකම ඉහල නැංවීම.*

9.2. විෂය පථය

- *මෙම උපායමාර්ගය තුළින් අගනගර කලාපය තුළ පිහිටි සියළුම තෙත්බිම් ආවරණය වන පරිදි සැලසුම් සකස් කර ඇත.*
- *තෙත්බිම් ලක්ෂණයන්, අගනගර සැලසුම් ප්‍රදේශය පුරා ජනනය වන පරිදි තිරසාර තෙත්බිම් උපාය මාර්ගය හඳුන්වා දී ඇත.*
- *සංවර්ධන සැලැස්මෙහි තෙත්බිම් උපායමාර්ගය තුළින් යෝජනා කර ඇති සියලු උපායමාර්ගික ව්‍යාපෘති නිශ්චිත කාල සීමාවක් තුළ සැලසුම් ක්‍රියාවට නැංවීම අපේක්ෂා කරන අතර සංවර්ධන සැලැස්මෙහි 1 වන පරිච්ඡේදයේ නිශ්චිතවම එය දක්වා ඇත. මෙම කාල සීමාව ඉක්මවා යන තත්ත්වයන් මතු වූ විට සංවර්ධන සැලැස්ම කාලීනව යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව ඇත.*
- *මෙම උපායමාර්ගය ප්‍රාග්ධන නගර සංවර්ධන සැලැස්මේ අරමුණු හා යෝජනා සමඟ එකඟතාවයකට පැමිණ එකඟ වන ඕනෑම අදාළ රාජ්‍ය හෝ පෞද්ගලික පාර්ශවයක් විසින් සිදු කරනු ලබන ඕනෑම යෝජනාවක්, සැලැස්මක්, ව්‍යාපෘතිය ක් හෝ මැදිහත්වීමක් ඇතුළත් කිරීමට ප්‍රතිපාදන සපයයි.*

9.3. තෙත්බිම් කළමනාකරණය සඳහා වූ උපායමාර්ගික මැදිහත් වීම.

දෙආකාරයකින් වූ තෙත්බිම් කළමනාකරණය සඳහා වූ උපායමාර්ගික මැදිහත් වීම් පහත දැක්වේ.

1. *හරිත ජාල (තෙත් බිම් හා අනිකුත් හරිත කලාප) කළමනාකරණය සඳහා උපායමාර්ගික මැදිහත්වීම.*
2. *නීල ජාල (ජල පද්ධතින්) කළමනාකරණය සඳහා උපායමාර්ගික මැදිහත්වීම.*

උපායමාර්ගික මැදිහත්වීම 1 : *හරිත ජාල කළමනාකරණය*

හරිත ජාල (තෙත් බිම් හා අනිකුත් හරිත කලාප) කළමනාකරණය කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ තෙත්බිම් දාම තුළින් අගනගරය අවට පරිසරය ප්‍රබෝධවත් කිරීමය. තවද එමඟින් ගංවතුර තුරන් කිරීම සහ අනාගත පරම්පරාවන් සඳහා තෙත්බිම සංරක්ෂණය කිරීම සඳහා මඟපාදනු ලැබේ. ක්‍රියාකාරී පරිසරය සඳහා තෙත් බිම් විවෘත කිරීම සිදුකිරීම සඳහා ත්‍රිත්ව ක්‍රමෝපායන් පහත විස්තර කෙරේ. ඒවා නම්,

උපාය මාර්ගික ව්‍යාපෘති 1 : *තෙත්බිම් වර්ගීකරණ.*
උපාය මාර්ගික ව්‍යාපෘති 2 : *උද්‍යාන නිර්මාණය කිරීම.*
උපාය මාර්ගික ව්‍යාපෘති 3: *හරිත සංරක්ෂණ කලාප හඳුන්වාදීම.*

උපායමාර්ගික මැදිහත්වීම 2 : *නීල ජාල (ජල පද්ධතින්) කළමනාකරණය සඳහා උපායමාර්ගික මැදිහත්වීම*

ප්‍රදේශයේ ගංවතුර තර්ජනය අවම කිරීම සඳහා ද ජල කලාප ආරක්ෂා කිරීමට ද නීල ජාල (ජල පද්ධතින්) කළමනාකරණ උපාය මාර්ගික මැදිහත් වීම තෙත්බිම් උපායමාර්ගය තුළ දක්වා ඇත. ඒ අනුව ප්‍රධාන උපායමාර්ගික ව්‍යායාපෘති තුනක් හඳුන්වා දෙනු ලැබේ. ප්‍රථමයෙන් කැළණි ගඟ ඔස්සේ පාරිසරික සංවේදී කලාපයක් යෝජනා කිරීම සිදුකරනු ලැබේ. දෙවැන්න නම් දැනට පවතින ජල මාර්ග හා හරිත කලාප එකිනෙකට සම්බන්ධ කර ගනිමින් විස්තිරණ වූ ජලභිමුක නගරයක් ඇතිකර ගැනීමයි. තෙවන උපායමාර්ගික ව්‍යාපෘතිය වන්නේ ජලය ආශ්‍රිත යටිතල පහසුකම් ජාලයක් සංවර්ධනය කිරීමයි.

උපාය මාර්ගික ව්‍යාපෘති 1 : *සංරක්ෂණය කල යුතු පාරිසරික සංවේදී කලාපයක් හඳුනා ගැනීම.*
උපාය මාර්ගික ව්‍යාපෘති 2 : *ජල පද්ධතින් ජාලයක් ලෙස සංවර්ධනය කිරීම.*
උපාය මාර්ගික ව්‍යාපෘති 3 : *ජල පද්ධතින් ජාලයක් ලෙස සංවර්ධනය කිරීම.*

සිතියම 9.1 : හෙක්ටම්මි නුළුම්ගාමරණ උපාය මාර්ගයේ සංයුක්ත සිතියම

මූලාශ්‍ය : බස්නාහිර පළාත් අංශය සහ පරිසේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සංයුක්ත සිතියම

නෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය

නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :

බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018

9.4. තෙත්බිම් කළමනාකරණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1 : හරිත ජාල කළමනාකරණය

උපායමාර්ගික ව්‍යාපෘති 1 : තෙත්බිම් වර්ගීකරණය

තෙත්බිම් වර්ගීකරණයේ කිරීමේ අරමුණ වනුයේ තෙත්බිම් හා ඒ අවට සංවර්ධනය කිරීමේදී එක් එක් තෙත්බිම් සඳහා සුවිශේෂිත්වයක් හා අනන්‍යතාවයක් ඒ තුළට අන්තර්ගත කිරීමට හැකි වන පරිදි සැලසුම් කිරීමයි. අගනගර මධ්‍ය කලාපය තුළ පිහිටා ඇති මුළු තෙත්බිම ජාලය මධ්‍ය ගත ප්‍රධාන තෙත්බිම් කලාපය ලෙස වර්ගීකරණය කර ඇත. මේ හරහා අගනගර මධ්‍ය කලාපය තුළ ගංවතුර උවදුර අවම කිරීමට අපේක්ෂා කෙරේ.

ඇතුළු නගර කලාපය අනිකුත් කලාප තුළින් වෙන් කිරීමට යොදාගන්නා තෙත්බිම් ජාලය විශේෂ තෙත්බිම් පවුරු ජාලය ලෙස නම් කර ඇති අතර එම තෙත්බිම් අගනගර මධ්‍ය කලාපය පවුරක් ලෙස ක්‍රියාකිරීම සිදු කරනු ලැබේ

පිටත නගරය තෙත්බිම් වර්ග තුනකට අයත් වන අතර අගනගර සැලසුම් කලාපයේ උතුරු මායිමේ පිහිටා ඇති තෙත්බිම්, ආපදා කළමනාකරණ තෙත්බිම් ජාලය ලෙස නම් කරනු ලැබේ. ප්‍රදේශයේ පවතින ජල රඳවා තැබීමේ අවශ්‍යතාවය පුර්ණය කිරීම සඳහා, විශේෂයෙන් වැසි සහිත කාල වලදී ජල රැඳවුම් ප්‍රදේශයක් ලෙසද මෙම කලාපය භාවිතා කෙරේ. අගනගර පිටත කලාපයේ පවතින සංචාරක ප්‍රවර්ධන තෙත්බිම ජාලය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සිදු කිරීම සඳහා උපකාරී කරගත හැකිවන අයුරින් නිර්මාණය කිරීමට යෝජනා කර ඇත. පිටත අගනගර සැලසුම් කලාපයේ කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනයන සඳහා ඉවහල් වන පරිදි කෘෂිකාර්මික ප්‍රවර්ධන තෙත්බිම් ජාලය හඳුන්වා දී ඇත. අගනගර සැලසුම තුළ පිහිටියා වූ පර්යන්ත කලාපය තුළ නාගරික නේවාසික කලාපය සැලසුම් කර ඇති අතර එම භාවිතයන්ට අනුගත වෙමින් නාගරික ජනයාගේ එදිනෙදා අවශ්‍යතා සපුරාලීමට ඉවහල් වන පරිදි සාමාන්‍ය තෙත්බිම් ජාලය යෝජනා කර ඇත. විශේෂයන් එමගින් කුඹුරු ප්‍රදේශ සංරක්ෂනයද සිදු කරනු ලැබේ.



සිතියම 9.2 : හරිත ජාල කළමනාකරණයේ සංයුක්ත සිතියම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



යෝජිත නව ජල සම්බන්ධතා මාර්ග

තෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
මෙගාපොලිස් සැළසුම් ව්‍යාපෘතිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 9.3 : අගනගරයේ තෙත්බිම් වර්ගීකරණය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘති 2 : තෙත්බිම් උද්‍යාන

තෙත්බිම් සංරක්ෂණය පිළිබඳ දෙවන උපාය මාර්ගය වන්නේ උද්‍යාන නිර්මාණය කිරීමේ ව්‍යාපෘතියයි. මෙම උපාය මාර්ගික ව්‍යාපෘතිය මඟින් තෙත්බිම් සංරක්ෂණය කිරීම හා සැලසුම් කලාපය සඳහා අන්තර්ගත විය යුතු වූ විවෘත අවකාශ පරිපූර්ණ කිරීම ද සිදුවනු ලැබේ. ඒ අනුව අගනගර සැලසුම් කලාපය තුළ උද්‍යාන මට්ටම හතරකින් යුක්ත ධුරාවලියක් මත පදනම්ව සැලසුම් කර ඇති අතර, ක්‍රමක් ක්‍රමයෙන් අගනගර මධ්‍ය කලාපයට පිවිසෙත්ම එම ප්‍රදේශය අගනුවර යන හැඟීම් උද්දීපනය වන අයුරින් එම ධුරාවලිය නිර්මාණය කර ඇත.

අගනගර මධ්‍ය කලාප උද්‍යාන — අගනගර මධ්‍ය කලාපය තුළ පිහිට වීමට බලාපොරොත්තු වන්නා වූ මෙම උද්‍යාන වර්ගය බැද්දගාන තෙත්බිම, කුරුළු උද්‍යාන ය තෙත්බිම හා පාර්ලිමේන්තු පාර තෙත්බිම් අන්තර්ගත වන අතර වර්ග කිලෝමීටර 2.94 ක භූමියක් පුරා විසිර පවතී. මෙලෙස උද්‍යාන නිර්මාණය කිරීම ප්‍රදේශයේ පවතින ගංවතුර අවධානම අඩුකිරීමට ඉවහල් වේ.



රූපය 9.1 : අගනගර මධ්‍ය කලාප උද්‍යාන රූපය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ඇතුළත නගර උද්‍යානය — තලංගම තෙත්බිම , කෝට්ටේ තෙත්බිම සහ දියත උයන තෙත්බිම සඳහා ඇතුළත නගර උද්‍යාන තුනක් යෝජනා කර ඇති අතර එහි මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 2.96 කි.



රූපය 9.2 : අගනගර ඇතුළත නගර උද්‍යානය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

පිටත නගර උද්‍යානය — කොළොන්නාව, මාදින්නාගොඩ, තලංගම, මාලඹේ, මුල්ලේරියාව සහ කැළණි ය තුළ පිහිටි තෙත්බිම් සඳහා පිටත නගර උද්‍යාන යෝජනා කරනු ලැබේ. විශේෂයෙන් තලාංගම තෙත්බිම් ආශ්‍රිතව සංචාරක කලාපයක් සඳහා යෝග්‍යවන්නාවූ උද්‍යාන යක්ද මාලඹේ, මුල්ලේරියාව ආශ්‍රිතව කාර්යාල කලාපය සඳහා උපකාර වන්නා වූ උද්‍යාන යන්ද, කැළණි මුල්ල ආශ්‍රිතව පවතින තෙත්බිම් ගංවතුර උවදුර අවම කිරීම සඳහා නව සැලසුම මඟින් යෝජනා කර ඇති අතර විශේෂයෙන් ගම්පහ නගරයේ සිට අගනගර කලාපයට පිවිසෙන පුද්ගලයෙක් සඳහා ක්‍රමක්‍රමයෙන් අගනගරයක් වෙන පිවිසන හැඟීම තීව්‍ර වන අයුරින් අගනගර ප්‍රවේශ ද්වාර සඳහා ද උද්‍යාන නිර්මාණය කිරීමටද සැලසුම් කර ඇත.



රූපය 9.3 : පිටත නගර උද්‍යානය - මාලඹේ තෙත්බිම් පද්ධතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 9.4 : පිටත නගර උද්‍යානය - කැළණිමුල්ල තෙත්බිම් පද්ධතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

පර්යන්ත උද්‍යානය — පදිංචිකරුවන්ට සහ අමුත්තන්ට ප්‍රයෝජනවත් වන අයුරින් ත්‍රාසජනක උද්‍යාන යක් ලෙස වර්ග කිලෝ මීටර 3.22 ප්‍රමාණයක් සංවර්ධනය කිරීම.



රූපය 9.5 : අගනගර පර්යන්ත උද්‍යානය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 9.4 : අගනගරයේ යෝජිත තෙත්බිම් උද්‍යාන
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

තෙත්බිම් වර්ගීකරණය
තෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

උපායමාර්ගික මැදිහත්වීම 2 : නීල ජාල කළමනාකරණය

උපායමාර්ගික ව්‍යාපෘති 1 : රක්ෂිත ප්‍රදේශ ඔඳුන්වා දීම

මෙම උපායමාර්ගික මැදිහත් වීම තුළින් කැළණි ගඟේ සිට මීටර 100 රක්ෂිත ප්‍රදේශයක් ඔඳුන්වා දෙන අතර දැල වශයෙන් වර්ග කිලෝමීටර 5.4ක ප්‍රමාණයක් හා දුරින් කිලෝමීටර 25ක ප්‍රමාණයක් ඒ සඳහා ඔඳුනාගෙන ඇත. ඉඩම් සංවර්ධන ආඥාපනතට අනුව ජල සංරක්ෂිත ප්‍රදේශ සඳහා වෙන්කර ඇති ප්‍රමාණයන් මෙම සැලසුමටද අන්තර්ගත කර ඇත.

ගඟේ පළල (මීටර)	රක්ෂිත ප්‍රදේශ පළල (මීටර)
4.6 ට අඩු	ගන් ඉයුරින් එක පසක සිට මීටර 20 දක්වා.
4.6 – 15.2	ගන් ඉයුරින් එක පසක සිට මීටර 40 දක්වා.
15.2 ට වඩා වැඩි	ගන් ඉයුරින් එක පසක සිට මීටර 60 දක්වා.

වගුව 9.1 : ඉඩම් සංවර්ධන පනතට අනුව ගංගා ඇළ මාර්ගයන්ගේ පළලට අනුව තිබය යුතු රක්ෂිතය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් ආශ්‍රය සභ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය

කැළණි ගඟ මීටර් 15.2 ට වඩා වැඩි පළලකින් යුක්තවේ. කැළණි ගඟේ සිට මීටර 60 ක් දක්වා කලාපය තුළ කිසිදු ඉදිකිරීමක් සඳහා ඉඩලබා නොදෙන අතර, ඉතිරි මීටර 40 කින් යුක්තවන රක්ෂිත ප්‍රදේශය තුළ පාරිසරික යෝග්‍ය තාවය සලකා බලා විශේෂ රෙගුලාසි පාදක කොටගෙන ඉදිකිරීම් සිදුකිරීමට බලාපොරොත්තු වනු ලැබේ. යෝජිත භූ දර්ශන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමෙන් ජල මාර්ග අවට භූමි දර්ශනය ක්‍රමවත් වන අතර ජල අභිමුඛ කලාප තුළ විශේෂයෙන් කැළණි ගඟ ආශ්‍රිතව සිදු කරන අනවසර ඉදිකිරීම් අවම කර ගැනීමේ හැකියාවක්ද පවතිනු ලැබේ. එමෙන්ම කැළණි ගඟ දෙපසට විශේෂ අවධානයක් ලබාදෙමින් ගම්පහ ප්‍රදේශය පසුකරමින් අගනගර කලාපයට පිවිසේන්නෙක් හට එම කලාපය තුළ වූ සුවිශේෂිත්වය දැනෙන අයුරින් උද්‍යාන නිර්මාණය කිරීමට සැලසුම් කර ඇත.



රූපය 9.6 : කැළණි ගංගා රක්ෂිතයේ අපේක්ෂිත රූපය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් ආශ්‍රය සභ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 9.5 : යෝජිත නව ජල පාර සම්බන්ධතාවය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශීලන හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

තෙත්බිම් උද්‍යාන සංවර්ධනය

තෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



සිතියම 9.6 : කැළණි ගඟේ යෝජිත රක්ෂිත ප්‍රදේශය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 2 : නීල ජාල (ජල පද්ධතින්) කළමනාකරණය සඳහා උපායමාර්ගික මැදිහත්වීම

ජල මාර්ගයේ ජලය ගලන්න වූ දිශානතිය පැහැදිලි කිරීමේ විශ්ලේෂණයට අනුව, ජල මාර්ග පද්ධතියේ නිසියාකාරව සම්බන්ධ නොවූ ස්ථාන කිලෝමීටර 7 ක ප්‍රමාණයක් හඳුනාගත හැකි වූ අතර ක්‍රමානුකූලව නිල හරිත පද්ධතියක් වැඩි දියුණු කිරීම සඳහා මෙම උපායමාර්ගය යෝජනා කරනු ලැබේ. තවද, ගංවතුර අවධානම අවම කිරීමට හා අගනගර කලාපයේ ප්‍රතිරූපය වැඩිදියුණු කළ හැකි ප්‍රසන්න ස්වාභාවික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

උපායමාර්ගික ව්‍යාපෘතිය 3 : ජලය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

කිලෝමීටර 14 ක දුරකින් යුත් ජල ගමනා ගමන ව්‍යාපෘතිය අගනගර කලාපයේ ප්‍රවාහන සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් වන්න වූ ව්‍යාපෘතියක් වේ. ප්‍රදේශයේ ඇළ මාර්ග සංරක්ෂණය කිරීම සඳහා ද මෙම උපාය මාර්ගය ධනාත්මකව බලපාන අතර වැල්ලවත්ත සිට බත්තරමුල්ල හරහා වැල්ලවත්ත ඇළ සහ දියවන්නා ඔය හරහා සම්බන්ධ කර ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව යෝජනා කර ඇති ජල මගී ප්‍රවාහන සේවාව මෙය සමඟ සම්බන්ධ කිරීමට අනාගතයේ සැලසුම් කර ඇත. තවද නාගරික සංවර්ධන අධිකාරිය බත්තරමුල්ලේ සිට කැළණි ගඟ දක්වා, මාලඹේ සිට තලංගම වැව දක්වා මගී ප්‍රවාහන සඳහා කුඩා පරිමාණයේ ඇළ මාර්ග පද්ධතියක් යෝජනා කර තිබෙන අතර මෙය විශාල වශයෙන් සිදු කෙරෙන මගී ප්‍රවාහන සේවයක් සඳහා යෝග්‍ය නොවෙන අතර එම ප්‍රදේශය විනෝද කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු යොදා ඇත. කොටිකාවත්ත ප්‍රදේශය තුළ ද අගනගර කලාපයට අනුගත වූ භූ දර්ශනයක් ගොඩ නැඟීම සඳහා ඇළ මාර්ග සංවර්ධනය යොදාගත් හැක.





රූපය 9.7 : කොටිකාවත්ත ප්‍රදේශයේ යෝජිත ඇළ දෙපස අපේක්ෂිත දියුණුව
මූලාශ්‍රය : www.midlandsinbusiness.com/2017/07/residents

සිතියම 9.7 : යෝජිත නව ජල පාර සම්බන්ධතාවය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරවේදන සහ සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



කැලණි ගඟේ යෝජිත රක්ෂිත ප්‍රදේශය
තෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිසරවේදන හා පුනුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018



සිතියම 9.8 : අගනගර සැලැස්මේ ඇළ මාර්ග වැඩි දියුණු කිරීම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපාය මාර්ගය	ව්‍යපෘති කේතය	ව්‍යපෘති නම
ඖරින ජාල කළමනාකරණය	SI-W-1	තලංගම නෙත්බිම ආශ්‍රිත උද්‍යාන ව්‍යාපෘතිය
	SI-W-2	අගනගර උද්‍යාන ව්‍යාපෘතිය
	SI-W-3	ජාල මාර්ග ජාල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය
	SI-W-4	කොලොන්නාව සංචාරක ප්‍රවර්ධන නෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය
	SII-W- 6	දියත උයන උද්‍යාන ව්‍යාපෘතිය
	SII-W- 7	පරිසර ඖතකාමී ස්වභාවික උද්‍යාන ව්‍යාපෘතිය
	SII-W-8	මෙගොඩ කැළණිය තත්බිම් උද්‍යාන ආශ්‍රිත ව්‍යාපෘතිය
	SII-W-9	කඩුවෙල නෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය
	SIII-W-12	මාලඹේ නෙත්බිම් ආශ්‍රිත උද්‍යාන ව්‍යාපෘතිය
	SIII-W-13	තලංගැන ඖරින ගමනාගමන තිරය ආශ්‍රිත ව්‍යාපෘතීන්
නීල ජාල සැලැස්ම	SII-W- 5	කැළණි ගඟ සංරක්ෂන ප්‍රදේශ පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය
	SII-W-10	ජල සම්බන්ධතා වල අන්තර් සම්බන්ධතාවය අන්තර් සම්බන්ධතා ඇති කිරීමේ ව්‍යාපෘතිය
	SIII-W-14	කැළණි පාලම නැවත නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
	SII-W-11	ජලාශ්‍රිත මඟී ගමනාගමන ව්‍යාපෘතිය (වැල්ලවත්ත සිට බන්තරමුල්ල) - SLLRDC

වගුව 9.2 : නෙත්බිම් කළමනාකරණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

9.5. නෙත්බිම් කළමණාකරණ උපායමාර්ගයේ බලපෑම

නෙත්බිම් කළමනාකරණ සැලසුමේ ප්‍රධාන අභිමතාර්ථය වනුයේ හරිත සහ නීල සංරචක මඟින් සංරක්ෂණය කිරීම මඟින් ගංවතුර අවධානම අවම කිරීම, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, විවෘත අවකාශීය ඉල්ලුම සැපයීම සහ ප්‍රදේශයේ ඉඩම් වෙළඳපොළ වැඩිදියුණු කිරීමය. නෙත්බිම් පද්ධතියෙන් 100% ක් සංරක්ෂණය කිරීම සඳහා මුල් පියවර තබන අතර හඳුනාගත් ජලාශවල අවශ පරිදි ජල රවුම් ධාරිතාව පවත්වා ගැනීමට මෙම යෝජනාවට හැකියාව ඇත.

සැලසුම තුළින් සලකා බැලීම් :

අගනගර කලාපයේ මුළු නෙත්බිම් ප්‍රමාණය : 33,467,890sqm2

මහා කොළඹ සැලසුම් කලාපය තුළ පවතින නෙත්බිම් ප්‍රමාණය : 19,091,336sqm2 (57.04%)

අගනගර සැලසුම තුළට අන්තර්ගත නොවන නමුත් මහ කොළඹ සැලසුමට අන්තර්ගත වන නෙත්බිම් ප්‍රමාණය : 14,376,554sqm2 (42.9%)

මහ කොළඹ සැලසුම් ප්‍රදේශයේ පවතින නෙත්බිම් 30.42 %වැසි ජලය රඳවා තැබීමේ ධාරිතාවයකින් යුක්ත වේ.

09 පරිච්ඡේදය
තෙත්බිම් සංවර්ධන උපායමාර්ගය

තෙත්බිම් කළමණාකරණ උපායමාර්ගයේ බලපෑම



රූපය 9.8 : අගනගරයේ ජල පෝෂක ප්‍රදේශ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය -2018

ජල රැඳවුම් කලාප	තෙත්බිම් ප්‍රමාණය	ජල රැඳවුම් ධාරිතාවය
කලාප 1	15560000	25
කලාප 2	2590000	3
කලාප 3	1400000	2
කලාප 4	1170000	1.5
කලාප 5	1164000	1.5
කලාප6	680000	1
කලාප 7	9690000	13
කලාප 8	440000	1
කලාප 9	8440000	11
මුළු ප්‍රමාණය	**41,134,000**	**55**

වගුව 9.3 : අගනගරයේ ජල පෝෂක රඳවා ගැනීමේ ධාරිතාව
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි විශ්ලේෂණයට අනුව, මහකොළඹ සැලසුම් ප්‍රදේශයේ පිහිට ඇති තෙත්බිම් විනාශ වීම තුළින් කොළඹ නගරයට වසරකට අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.3% ප්‍රමාණයක් අඩුවන බවට ගණනය කර ඇත.



රූපය 9.9 : ගංවතුරෙන් අපේක්ෂිත වාර්ෂික අලාභය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

එමෙන්ම අගනගර සැලසුම් ප්‍රදේශය තුළ පවතින තෙත්බිම් විනාශ වීම නිසා වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.94% අඩු වන අතර ප්‍රදේශයේ ජලය බැසයාම තෙත්බිම් ජාලය මුල්කොට තිබෙන්න වූ ජල රැඳවුම් කලාප තුළින් පහත පරිදි සිදුවේ.

ජල රැඳවුම් කලාප	මුළු බිම් ප්‍රමාණය	ජල බස්නා ප්‍රදේශය	ජල රැඳවුම් ධාරිතාවය %	ජල රැඳවුම් ධාරිතාවය	ජල බස්නා ප්‍රදේශය හැරුණ විට ඉතිරිවන ප්‍රදේශය
කලාප 1	79,950,533.59	5,190,563.78	20.73	1,076,003.87	4,114,559.91
කලාප 2	38,402,609.08	2,469,717.78	3.45	85,205.26	2,384,512.51
කලාප 3	13,359,593.11	818,735.19	1.86	15,228.47	803,506.71
කලාප 4	8,019,271.59	504,881.50	1.56	7,876.15	497,005.35
කලාප 5	9,118,129.74	625,182.42	1.55	9,690.33	615,492.10
කලාප 6	3,198,472.57	138,068.90	0.91	1,256.43	136,812.47
කලාප 7	1,563,162.43	138,068.90	12.93	17,852.31	120,216.59
කලාප 8	3,054,445.82	254,922.07	0.58	1,478.55	253,443.52
කලාප 9	6,519,974.75	549,895.40	11.26	61,918.22	487,977.18
මුළු ප්‍රදේශය	**163,186,192.69**	**10,690,035.95**	**54.89**	**5,867,760.73**	**9,413,526.36**

වගුව 9.4 : පවත්නා ඉඩම් පරිහරණය සමඟ අගනගරයේ ජල පෝෂක ප්‍රදේශයේ ජලය මතුපිට ගලායාමේ ශ්‍රිඝ්‍රතාවය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රමිතීන්ට අනුව, 100% විවෘත ඉඩ පහසුකම් අවශ්‍යතාවය සපුරාලීම සඳහා මිනිසුන් 100ක් සඳහා අවශ්‍ය විවෘත භූමි ප්‍රමාණය හෙක්ටයාර 1.4 වේ. අගනගර සැලසුම සඳහා එම ඉඩ ලබාගැනීම පහත පරිදි සැලසුම් කර ඇත.

කලාපය	ජනගහන	අවශ්‍යය විවෘත ඉඩකඩ (අක්කර)	විවෘත ඉඩ පහසුකම් (අක්කර)
අගනගර මධ්‍ය කලාපය	46617	160	930
ඇතුළත හා පිටත නගරය	644713	2231	5386
පර්යන්ත නගර කලාපය	202858	701	2311

වගුව 9.5 : අගනගරයෙහි විවෘත අවකාශ ඉල්ලුම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ඇමෙරිකානු සැලසුම සංගමය - 2018 ප්‍රමිතීන්ට අනුව එළිමහන් විනෝදාස්වාදක කටයුතු වලට වෙන්කල ඇති භූමි භාගය නගරයක් වෙසන පුද්ගලින් 100,000ක් පහත පරිදි දැක්විය හැක.

විනෝදාත්මක භාවිතයන්	ප්‍රදේශය (අක්කර)
සංරක්ෂණ කලාපයන්	700
1 විශාල උද්‍යානයක්	400
කුඩා උද්‍යාන 10ක්	250
ක්‍රීඩා පිට්ටනි 50	100
උද්‍යාන හා චතුරශ්‍ර	50
මුළු ප්‍රමාණය	**1500**

වගුව 9.6 : විනෝදාත්මක භාවිතයන්හි ප්‍රමිතීන්
මූලාශ්‍රය : www.planning.org/pas/reports/report194.htm

අගනගර මධ්‍ය කලාපය	ජන ගහනය	තිබිය යුතු භූමි ප්‍රමාණය	විවෘත අවකාශය සැපයීම
වතු ක්‍රියාකාරී විවෘත භූමි	46,617	350	
සෘජු ක්‍රියාකාරී භූමි		400	930
මුළු විවෘත භූමි ප්‍රමාණය		750	930
ඇතුළත හා පිටත නගරය	**ජනගහනය**	**තිබිය යුතු භූමි ප්‍රමාණය**	**විවෘත අවකාශය සැපයීම**
වතු ක්‍රියාකාරී විවෘත භූමි	644,713	4513	236,441
සෘජු ක්‍රියාකාරී භූමි		5158	68,839.75
මුළු විවෘත භූමි ප්‍රමාණය		9671	305,280.75
පර්යන්ත නගර කලාපය	**ජනගහනය**	**තිබිය යුතු භූමි ප්‍රමාණය**	**විවෘත අවකාශය සැපයීම**
වතු ක්‍රියාකාරී විවෘත භූමි	202,858	1430	86,352.9
සෘජු ක්‍රියාකාරී භූමි		1643	32,249.37
මුළු විවෘත භූමි ප්‍රමාණය		3043	118,602.27

වගුව 9.7 : අගනගරයෙහි විවෘත අවකාශ ඉල්ලුම
මූලාශ්‍රය : 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත

අගනගර කලාපය තුළ උද්‍යාන නිර්මාණය තුළින් ප්‍රදේශයේ ඉඩම් මිල වටිනාකම කෙරෙහි සෘජු බලපෑමක් ඇතිවනු ලැබේ. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමණාකරණ හා තක්සේරු අධ්‍යයන අංශය විසින් කරන ලද පරීක්ෂණ අනුව, දියත උයන ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලින් පසු ඉඩම්වල වටිනාකමෙන් 41% ක් නේවාසික භාවිතය සඳහා වැඩි වන අතර වාණිජ භාවිතය සඳහා 77% ඉඩම් වටිනාකම වැඩි වී ඇත. මෙම තත්ත්වය මත පදනම්ව, අගනගර නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත උද්‍යාන මඟින් කිලෝ මීටර් 81ක භූමි ප්‍රදේශයක් සඳහා එම ප්‍රතිඵලය අදාළ වන බව පැහැදිලි වේ.



රූපය 9.10 : නෙත්බිම් වැඩිදියුණු කිරීමත් සමඟ දේපල වටිනාකමෙහි වෙනස
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සිතියම 9.9 : හෙක්ටයාර් 1 ක් ඉක්මවන ඉඩම් සඳහා අගනගරයට යිදුවන බලපෑම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශ්‍රණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අභ්‍යන්තර ජල ප්‍රවාහන ජාලය
තෙත්බිම් කළමනාකරණය උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
මෙගාපොලිස් සැළසුම් ව්‍යාපෘතිය

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

හරිත ජාල සංරක්ෂණය තුළින් හරිත පද්ධතීන් ආරක්ෂා වන අතර එම බලපෑම් හැරුණු විට ජෛව විවිධත්වය පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම හා වායුගෝලයේ වායු අංශු සංයුතිය පවත්වා ගැනීමට ද සැලසුම් ප්‍රදේශය තුළ හැකිවනු ඇත. වඩාත්ම වැදගත් කරුණ වන්නේ යෝජිත ජල ප්‍රවාහන සේවාව මඟින් ප්‍රදේශයේ රථවාහන ජනනය අඩු කිරීමේ හැකියාවය.



10

නගර නිර්මාණ උපායමාර්ගය

10 පරිච්ඡේදය
නගර නිර්මාණ උපායමාර්ගය

හැදින්වීම

අරමුණු හා පරමාර්ථ

ප්‍රවේශය

10.1. හැදින්වීම

ගැටළු හඳුනා ගැනීමේ ක්‍රියා පටිපාටිය තුළින් අනන්‍ය වූ අගනගරයක අවශ්‍යතාවය හඳුනාගත් අතර පළමු උපායමාර්ගික අරමුණ වශයෙන් එය ශාක්ෂාත් කරගැනීමේ අවශ්‍යතාවය වටහාගෙන ඇත. සැලසුමේ පළමු අරමුණ හරහා හඳුනාගත් මෙම අවශ්‍යතාවයට උපායාත්මක විසඳුම් "නගර නිර්මාණ උපාය මාර්ගය" ඔස්සේ ඉදිරිපත් වේ.

10.1.1. අරමුණු හා පරමාර්ථ

“අනන්‍ය ප්‍රතිරූපයකින් හා අවේණික ලක්ෂණ වලින් හෙබි අගනගරයක් ”

ඉහත උපායමාර්ගික ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පරමාර්ථ තුනක් ඇත. ඒවා පහත විස්තරාත්මකව දක්වා ඇත.

> **පරමාර්ථ 1.1** — *වසර 2050 වන විට හඳුනාගත් උපකල්පිත රේඛාවක් තුළ රටේ ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන පාලන අධිකාරීන් තුන සංකේතවත් වන්නා වූ ගොඩනැගිලි භෞතිකව ස්ථාපනය කිරීම.*
>
> **පරමාර්ථ 1.2** — *2030 වන විට පාර්ලිමේන්තු සංකීර්ණයේ සිට වර්ග කිලෝමීටර 1.5 වන අරයක් ඇතුළත පිහිටන්නා වූ වෘතාකාර ප්‍රදේශයක් ඔස්සේ අගනගර මධ්‍යය කලාපය නිර්මාණය කිරීම.*
>
> **පරමාර්ථ 1.3** — *2050 වන විට අගනගර මධ්‍ය කලාපය, ඇතුළත නගර කලාපය හා පිටත නගර කලාපය තුළ භූ දර්ශන නිර්මාණයන් හා නගර නිර්මාණ උපගමනයන් යොදා ධුරාවලියක් ආකාරයෙන් නිර්මාණය කිරීම.*

10.1.2. ප්‍රවේශය

ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා, සැලසුම්කරණ ලෝකයේ බහුලව භාවිතා වන සැලසුම්කරණ මූලධර්ම පහක් හඳුනා ගනු ලැබූ අතර, ඒවා අනුගමනය කරමින් කරන ලද අගනගර සැලසුම්ද දැනට ලෝකයේ සාර්ථක වී ඇති බැව් පැහැදිළි විය.එම මූලධර්ම පහ නම්,

1. **අක්ෂය** — *යම් ප්‍රදේශයක හඳුනාගත් අංග විශේෂිත ආකාරයකින් අක්ෂගතව ස්ථානගත කිරීම*
2. **ධුරාවලිය** — *ප්‍රදේශයේ පිහිටවන්නා වූ මංමාර්ග, මංසන්ධි හා ගොඩනැගිලි, ධුරාවලියක් ආකාරයෙන් පිහිටුවීම*
3. **සංවෘත කලාපය** — *අගනගර ප්‍රධාන කලාපය ස්වාභාවිකව හෝ භෞතිකව අනිත් කලාපවලින් වෙන්කර දැක්වීම.*
4. **සංක්‍රාන්තිය** — *ඒ ඒ කලාපයන් ඒවාට අනන්‍ය වූ ලක්ෂණයන්ගෙන් නිර්මාණය කිරීම.*
5. **මධ්‍ය කලාපය** — *පැහැදිලි හර කලාපයක් නිර්මාණය කිරීම*



රූපය 10.1 : අගනගර සැලැස්මේ සැලසුම් මැදිහත්වීම්
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

10.2. විෂය පථය

- *නාගරික සැලසුම් මූලධර්ම පහක් මත පදනම්ව නගර සැලැස්ම ප්‍රතිසංවිධානය කිරීම (නාගරික සැලසුම් නගර පරිමාණයෙන්)*
- *කුඩා ප්‍රමාණයේ ප්‍රදේශ සඳහා නගර සැලසුම් සැලසුම් රෙගුලාසි සහභාගිත්ව ප්‍රවේශයකින් හඳුන්වා දීම*

10.3. නාගරික නිර්මාණ උපායමාර්ගයේ උපායමාර්ගික මැදිහත්වීම්

උපායමාර්ගික මැදිහත්වීම 1: *උපකල්පිත අක්ෂයක් නිර්මාණය.*
උපායමාර්ගික මැදිහත්වීම 2: *ධූරාවලිය / සංක්‍රාන්ති කලාපයක් නිර්මාණය කිරීම.*
උපායමාර්ගික මැදිහත්වීම 3: *සංවෘත කලාපයක් නිර්මාණය කිරීම.*
උපායමාර්ගික මැදිහත්වීම 4: *අගනගර මධ්‍ය කලාපයක් නිර්මාණය කිරීම.*

ශ්‍රී ලාංකීය අග නගරය නිර්මාණයේදී යොදාගන්නා පංචවිධ නගර නිර්මාණ මූලධර්මයන්ගෙන් සමහරක් දැනටමත සැලසුම් කලාපය තුළ දක්නට ඇති අතර උදාහරණ වශයෙන්,

- *වර්තමානයේදීත් පාර්ලිමේන්තුව මුල්කරගෙන විශේෂ කලාපයක් පවත්වාගන යන අතර එම ප්‍රදේශයට පැමිණෙන අමුත්තන් හා නේවාසිකයන් හා හට එම කලාපය පිළිබඳ හැඟීමක් ඇතිවන පරිදි ය ප්‍රදේශය පවත්වාගන යනු ලැබේ. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇති දෘශ්‍ය නියාමන සැලසුම මඟින් පාර්ලිමේන්තුවේ සිට අරය කිලෝමීටර 1.5 කින් යුත් වෘතාකාර ප්‍රදේශයක් විශේෂ ගොඩනැගිලි උස පිළිඹඳ රෙගුලාසි ක්‍රියාත්මක කරන්නා වූ ප්‍රදේශයක් දැනටමත් හඳුනාගෙන ඇති අතර මේ නිසා එම කලාපය නව සැලැස්ම තුළ ද අගනගර මධ්‍ය කලාපය ලෙස භාවිතා කල හැකි වේ.*

- *ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සංකීරණය හා කැළණි ය රජමහ විහාරය එකම මංකල්පිත ලක්ෂයක් තුළ පිහිටීම නිසා අනිකුත් පාලන අධිකාරියද එකම අක්ෂයක් තුළම පිහිටුවීමේ හැකියාවක් පවතිනු ලබයි.*

- *අගනගර මධ්‍ය කලාපය විශේෂ තෙත්බිම් ජාලයක් මඟින් ස්වභාවිකව ම වටව පවතිනු ලැබේ.අගනගරය සංවෘත කලාපයක් ලෙස නිර්මාණය කර යුතුය යන මූලධර්මයද වර්තමානයේ ස්වාභාවිකවම ප්‍රදේශය තුළ පවතින බව එමඟින් පැහැදිලි වේ.*

ඉහත කරුණ සඳහා ඉහත අගනගර නිර්මාණ සංකල්පය යථාර්තයක් බවට පත්කිරීම සඳහා බොහෝ දුරට වැදගත් වේ.

සිතියම 10.1 : නාගරික සැලසුම් උපායමාර්ගයේ සංයුක්ත සිතියම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරඥ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සංයුක්ත සිතියම

නගර නිර්මාණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය

නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :

බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018

10 පරිච්ඡේදය
නගර නිර්මාණ උපායමාර්ගය

නාගරික නිර්මාණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1 : අක්ෂය

10.4. නාගරික නිර්මාණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1 : අක්ෂය

මෙම මූලධර්මය මඟින් මනක්කල්පිත රේඛාවක් ඔස්සේ රට තුළ පවතින ප්‍රධාන දේශපාලනික මූලධර්මයන් ස්ථානගත කිරීම සිදුකරනු ලැබේ. ඒ අනුව පහත දැක්වෙන යෝග්‍ය මැදිහත්වීම් යෝජනා කරනු ලැබේ.

- **අගනගර සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන අක්ෂය නිර්මාණය කිරීම**

රටේ ප්‍රධානතම දේශපාලනික ව්‍යුහයන් 03න ස්ථානගත කිරීම සඳහා උපකල්පිත අක්ෂයක් හඳුන්වා දීම.

සැලසුම් සංකල්පයක් සැලකිල්ලට ගැනීමෙන්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයේ එක් උපකල්පිත රේඛාවකට ස්ථානගත කිරීමට සැලසුම් කරනු ලැබේ . මෙහි ප්‍රධාන අරමුණ වනුයේ මෙම අනන්‍ය වූ විශේෂ ලක්ෂණය සන්නාමගත කිරීමය.

විධායකය	-	*ජනාධිපති කාර්යාලය*
ව්‍යවස්ථාදායකය	-	*පාර්ලිමේන්තුව*
අධිකරණය	-	*ශ්‍රේෂ්ඨාධිකරණය*



සිතියම 10.2 : අගනගරයේ අක්ෂය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



මනඃකල්පිත අක්ෂ රේඛාව
නගර නිර්මාණ උපායමාර්ගය , අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිසරීක්ෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 1:
ශ්‍රේෂ්ඨිකරණය වර්තමාන IDH භූමියට ගෙන යාම



රූපය 10.2 : උපාය 1 : ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතිස්ථානගත කිරීමේ ව්‍යාපෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 2 : ජනාධිපති මන්දිරය / කාර්යාලය පාර්ලිමේන්තුවේ පිටුපස පැත්තට ගෙන යාමේ උපායමාර්ගික ව්‍යාපෘතිය



රූපය 10.3 : උපායමාර්ගික ව්‍යාපෘතිය 2 : ජනාධිපති මන්දිරය ප්‍රතිස්ථානගත කිරීම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 3 : අගනගර භූමි සලකුණ වශයෙන් ලාංකීය සංස්කෘතිය හා ප්‍රධාන ආඅගම නියෝජනය වන බෞද්ධ ස්ථූපය නිර්මාණය කිරීම

රටේ ප්‍රධාන දේශපාලනික මධ්‍යස්ථානයන් පිහිටුවීමට අමතරව ප්‍රදේශයට අනන්‍ය වූ විශේෂ නාගරික සන්ධිස්ථාන අගනගර මධ්‍ය කලාපය හා හඳුනාගත් ප්‍රදේශ තුළ පිහිටවීම ප්‍රධාන අරමුණක් වේ. ඉහත විස්තර කර ඇති පරිදි උපකල්පිත ලක්ෂය ලෙස බත්තරමුල්ලේ පිහිටි කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවට යාබදව ඇති ඉඩම උපකල්පිත අක්ෂය හරහා පිහිටන අතර ඒ තුළ රටේ ප්‍රධාන ආගම නිරූපනය වන පරිදි ස්ථූපයක් නිර්මාණය කිරීමට ද ඒ හා සමගාමිව ජනාධිපති ලේකම් කාර්යාලය විසින්ද එම භූමිය තුළ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජනා කර ඇත. එමගින් විශේෂ නාගරික සංකේතයක අවශ්‍යතාවය මෙන්ම ආගමික මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අරමුණද මුදුම්පමුනුවන අතර එම ඉදිකිරීම් නවීන වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් යුක්තව සිදුකිරීමටද සැලසුම් කර ඇත.



රූපය 10.4 : උපායමාර්ගික ව්‍යාපෘතිය 3 : නගර සලකුණක් ස්ථාපිත කිරීම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

10 පරිච්ඡේදය
නගර නිර්මාණ උපායමාර්ගය

නාගරික නිර්මාණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති

උපායමාර්ගික මැදිහත්වීම 1 : අක්ෂය

උපායමාර්ගික මැදිහත්වීම 2 : ධූරාවලිය හා සංක්‍රාන්ති කලාපයක් නිර්මාණය කිරීම



රූපය 10.5 : අක්ෂ සිතියම සඳහා ත්‍රිමාණ ආකෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම 2 : ධූරාවලිය හා සංක්‍රාන්ති කලාපයක් නිර්මාණය කිරීම

අගනගර සැලැස්ම මඟින් යෝජිත නාගරික ආකෘතියේ එක එක නාගරික කලාප වලට අනන්‍ය වූ ආකාරයෙන් පිටත නගර කලාපයේ සිට අගනගර මධ්‍යය කලාපයට පැමිණෙන පුද්ගලයෙකු හට දැනෙන ආකාරයට සැලසුම් කිරීමට අගනගර සැලසුම මඟින් කටයුතු කර ඇති අතර ඒ සඳහා අගනගර විශේෂ පිවිසුම් මාර්ගයේ හඳුනාගත් විශේෂ පිවිසුම් ද්වාරයන් නිර්මාණය කිරීමට යෝජනා කරනු ලැබේ. ඒ මඟින් විවිධ කලාපයන්හි යෝජනා කර ඇති පරිදි වෙනස්කම් නාගරික කලාප ධූරාවලියට අනුකූලව වෙනස්වන අයුරින් විශේෂ පිවිසුම් මාර්ගය තුළ දක්වලිම අරමුණ වේ. ඒවා පහත ව්‍යාපෘති මඟින් යථාර්තයක් බවට පත්කිරීම අරමුණු කර ඇත.

උපායමාර්ගික ව්‍යාපෘති 1 : අගනගර කලාපය තුළට පිවිසීම සඳහා වූ විශේෂ පිවිසුම් ද්වාර.

අගනගරයට පිවිසීමට ඇති විශේෂ පිවිසුම් ද්වාර දෙපස භූ දර්ශනයන් සැකසීම.

අගනගර මධ්‍ය කලාපය, ඇතුළත නගරය හා පිටත නගරය යන කලාප වල ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නා වූ වෙනස්කම් හැගෙන අයුරින් අගනගර කලාපයට පිවිසීමට තිබෙන්න වූ මාර්ගයන් දෙපස භූමි නිර්මාණයන් සිදු කිරීමට අගනගර සැලසුම්තුළින්යෝජනා කර ඇති අතර වෙන් වෙන් වශයෙන් වර්ණ සංයෝගයක් පවතින්න වූ වෘක්ෂ ඒ ඒ කලාපවල එම විශේෂ මාර්ග දෙපස රෝපණය කිරීමට ද යෝජනා කර ඇත.

සිතියම 10.3 : අගනගරයෙහි ධුරාවලි මට්ටම

මූලාශ්‍රය : Western Province Division and Research & Development Unit, UDA - 2018



ධුරාවලිය

නගර නිර්මාණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය

නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :

බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය, ජූනි මස 2018

උපායමාර්ගික ව්‍යාපෘති 2 : යෝජිත නාගරික ස්වරූපය විශේෂිත මාර්ග දෙපස නිර්මාණය කිරීම.



රූපය 10.6 : විශේෂ පිවිසුම් මාර්ග ඔස්සේ නාගරික ස්වරූපය නිර්මාණය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 10.7 : අගනගරයේ නාගරික ස්වරූපය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේයේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

පිටත නගරය — මෙම නගර ප්‍රදේශය තුළ උස් වූ ගොඩනැඟිලි වලින් සමන්විත විය යුතු අතර, ඒවා එම ප්‍රදේශය ඉහළ ඝනත්වයක් සපයා ගැනීමට උපකාරී වේ. පිටත නගරය සැම ආකාරයකින්ම ස්වාධීනව ක්‍රියාත්මක වනු ඇත. වඩාත්ම වැදගත් වන්නේ එය ප්‍රධාන වාණිජ සහ කාර්යාල අවකාශ සපයන සහ රැකියා උත්පාදන කිරීමට නියමිත කලාපය වීමයි. තවද, තොරතුරු තාක්ෂණික හා දැනුම නගරයේ මෙම ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. නූතන ගෘහ නිර්මාණ කලාව තුළට විවිධ වාණිජමය වටිනාකම් එකතු කරන ලද ව්‍යුහයන් මෙම කලාපය තුළ නිරූපණය කිරීමට නියමිත වේ.

කොට්ටාව සිට ඇතුල් තෙත් භූමි සීමාව දක්වා (බොරැල්ල - කොට්ටාව පාර දෙපස)
නුගේගොඩ ගුවන් පාලම හන්දියේ සිට නුගේගොඩ සුපිරි වෙළඳසැල පිහිට ඇති හන්දිය දක්වා
ඩී එස් සේනානායක වටරවුමේ සිට රාජගිරිය වට රවුම හන්දිය දක්වා
කඩුවෙල සිට කොස්වත්ත හන්දිය දක්වා



රූපය 10.8 : පිටත නගර මංසන්ධි
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේස්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

ඇතුළත නගරය — මධ්‍යම ඝනත්වයක් පවත්වා ගනිමින් මධ්‍යම ප්‍රමාණයේ උස විශාල ගොඩනැගිලි වලින් මෙම ප්‍රදේශය පිහිටුවීමට යෝජනා කර තිබේ. ප්‍රධාන වශයෙන්, මෙහි පරිපාලන ප්‍රදේශය හා විධායක නිල නිවාසය ස්ථාපිත කිරීමට නියමිතය.

තෙත් භූමි කලාපයේ සිට අගනගර මධ්‍ය කලාපයේ (1.5 කි.මී) සීමාව දක්වා (කිඹුලාවෙල හන්දිය)
නුගේගොඩ සුපිරි වෙළඳසැල හන්දියේ සිට අගනගර මධ්‍ය කලාපයේ (1.5 කි.මී) සීමාව දක්වා
රාජගිරිය හන්දියේ සිට අගනගර මධ්‍ය කලාපයේ (1.5 කි.මී) සීමාව දක්වා
කොස්වත්ත හන්දියේ සිට අගනගර මධ්‍ය කලාපයේ (1.5 කි.මී) සීමාව දක්වා



රූපය 10.9 : ඇතුලු නගරය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

අගනගර මධ්‍ය කලාපය — මෙම කලාපයේ සුවිශේෂිත්වය විදහා දැක්වීමට ප්‍රදේශයට ආවේණික වූ වස්තු විද්‍යාත්මක ආවේණික කමකින් යුත් විශේෂිත ගොඩනැගිලි ඉදිකිරීමට යෝජනා කර ඇති අතර ප්‍රදේශයට පිවිසෙන්නන්ට අනර්ග අගනගරයක අසිරිය විඳීමට, විශ්ලේෂණයන්ට අනුගත වෙමින් අඩු ඝනතාවයකින් යුත්තව හා ක්‍රමානුකූලව, තේජාන්විතව යලි නිර්මාණය කිරීමට විධිවිධාන යොදා ඇත. එම ප්‍රති නිර්මාණයට ලාංකික ගෘහනිර්මාණ කලාවේ අභාෂය ද තෙත්බිම සංවර්ධනයද දායක කරගතයුතු වේ. මෙහි අවසාන අරමුණ වනුවේ අගනගරය අභිමානවත් බව තීව්‍රකිරීමත් එය කරා පැමිණෙන්නන්ගේ ප්‍රමාණය ඉහල දැමීමත්, අගනගරය හා ඒ අවට ප්‍රදේශය තුළ වෙසෙන ජනයාගේ ජීවන තත්වය ඉහළ නැන්වීමත්ය.

උපායමාර්ගික ව්‍යපෘති 3 : සංක්‍රාන්තික මංසන්ධි හඳුන්වා දීම

මංසන්ධි සංවර්ධනය

අගනගර මධ්‍ය කලාපයට පිවිසීම සඳහා වූ විශේෂ පිවිසුම් මාර්ග වල පිහිටි සුවිශේෂිය මංසන්ධි දොළහක් හඳුනා ගැනීම. ඒවා නම්

අගනගර මධ්‍ය කලාපයේ වූ සංක්‍රාන්ති මංසන්ධි

- *ඇතුලත නගරයේ සිට මධ්‍ය කලාපයට පිවිසීම සඳහා පාලම් හතරක් හඳුනාගෙන ඇත.*
  - *කිඹුලාවෙල පාලම*
  - *පාලම් තුන පාලම*
  - *බත්තරමුල්ල දියත උයන පාලම.*
  - *අනිකුත් විශේෂ ස්ථාන වල හඳුනාගත් පාලම් (පාර්ලිමේන්තුවට පිටුපස.)*

ඇතුළත නගරයේ සංක්‍රාන්ති මංසන්ධි

- *කලල්ගොඩට ආසන්නව පිහිටා ඇති තෙත්බිම.*
- *රාජගිරිය මංසන්ධිය*
- *ඩී. එස් සේනානායක වටරවුම*
- *නුගේගොඩ ගුවන් පාලම*

පිටත නගරයේ සංක්‍රාන්ති මංසන්ධි

- *කොට්ටාව මංසන්ධිය*
- *කඩුවෙල මංසන්ධිය*
- *ඩී එස් සේනානායක මංසන්ධිය*
- *නුගේගොඩ ගුවන් පාලම අසල මංසන්ධිය*

මෙම මංසන්ධිය නව ආකාරයකින් වැඩිදියුණු කිරීම ප්‍රදේශයේ සෞන්දර්යාත්මක අගය වර්ධනය කිරීම හා රටේ අගනගරයක පැවතියයුතු ප්‍රෞඩත්වය ජනනය කිරීමද අරමුණු වේ. මෙම සඳහා ප්‍රතිමා තැනවීම, විශේෂ ද්වාරයන් නිර්මාණය කිරීම, දැන්වීම් පුවරු නිර්මාණය කිරීම වැනි ව්‍යාපෘති මාර්ගය දෙපස ක්‍රියාවට නැංවීම සිදුකරනු ලැබේ.

උපායමාර්ගික ව්‍යපෘති 4 : නගරයේ පිවිසුම් ද්වාර ඉදිකිරීම

නගරයේ විශේෂ පිවිසුම් ද්වාර අනාධිමත් වූ ශ්‍රී ලංකාවේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය වන අයුරින් නිර්මාණය කිරීමෙන් ප්‍රදේශයට ප්‍රෞඩත්වය ජනිත කරවීමේ හැකියාවක් ලැබේ. කඩුවෙල, කොට්ටාව, නුගේගොඩ පාලම සහ ඩී. එස්. සේනානායක වටරවුම යන හඳුනාගත් ප්‍රදේශ තුළ මෙම ව්‍යපෘති සිදුකිරීමට කටයුතු යොදා ඇත.



සිතියම 10.4 : අගනගර ද්වාර ඉදිකිර්ම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේශ්‍රණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 10.10 : අගනුවර කේන්ද්‍රය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික මැදිහත්වීම් 3 : සංවෘත කලාප පිහිටුවීම.

විශේෂයෙන්ම සංවෘත කලාප පිහිටුවීම මඟින් සෞන්දර්යාත්මක දෘෂ්ටි කෝණයෙන් නාගරික අවකාශයේ සැලසුම් කිරීම මෙමඟින් සිදුවෙන්න වූ ප්‍රධානතම බලපෑම වේ. එබැවින් ආකර්ෂණීය අවකාශයන් තුළ අගනගරය යන හැඟීම පෝෂණය කිරීම අරමුණු කර ඇත. එසේ කිරීම සඳහා යෝජිත ආරම්භක පියවර පහත පරිදි වේ.

- **අගනගර කලාපයේ ඇතුල් නගර සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම.**

උපායමාර්ගික ව්‍යාපෘතිය 1 : ඇතුල් නගර සීමාව තුළ ක්‍රමවත් සම්බන්ධ නොවූ නගර සීමා කලාපයන් ක්‍රමවත් ආකාරයෙන් සම්බන්ධ කිරීම.

ඇතුල් නගර කලාපය නිර්ණය කර ඇත්තේ ඒ අවට පිහිට ඇති තෙත්බිම් ජලය මඟින් වන අතර තෙත් බිම් ජලය නොපිහිටනා ස්ථානවල ස්වභාවික අංගයන්ගෙන් (ජල පද්ධති මඟින්, ගස් මඟින්) ක්‍රමවත් ආකාරයට සිමාවන් යොදා ගැනීමට කටයුතු යොදා ඇත. එම හේතුව නිසා, කලපලුවාව මාර්ගය දෙපසින් ගස් වැවුණු මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කරයි. මෙම මැදිහත්වීම සමඟ හරිත ජාල (මාර්ග දෙපස හරිත තීරු) නඩත්තු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

සිතියම 10.5 : ඇතුළත නගර මධ්‍ය වෙහිලිම

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිසරවේදය හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සංවෘත කලාපය
නගර නිර්මාණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

උපායමාර්ගික මැදිහත් වීම 4 : අගනගර මධ්‍ය කලාපය

මෙම මූලධර්මයෙන් පැහැදිලි වනුයේ ශක්තිමත් මෙන්ම සැමහටම හඳුනගත හැකි වූ අගනගර මධ්‍ය කලාපයක් පිහිටුවීමයි. දෘෂ්‍ය නියාමන සැලසුමට අනුව පාර්ලිමේන්තු පර්යන්තයේ සිට කිලෝමීටර 1.5 ක අරයකින් යුතු ප්‍රදේශයක් මේ සඳහා හඳුනාගෙන ඇත. පාර්ලිමේන්තු ගොඩනැගිල්ල කැපී පෙනෙන අයුරින් එම ප්‍රදේශ වල ගොඩනැගිලි සඳහා නිශ්චිත උසක් තීරණය කර ඇත. තවදුරටත් එම ප්‍රදේශය අගනගර මධ්‍ය කලාපයේ මධ්‍යය ලෙස සලකන අතර එම ප්‍රදේශයේ ගොඩනැගිලි උස නියාමනය කර ඇති නිසා අඩු ගොඩනැගිලි ඝනත්වයකින් යුත් විවෘත භූමි වැඩි ප්‍රමාණයකින් යුක්ත වූ කලාපයක් ලෙස මෙහි වාසය කරන ජනතාවටත් පිටතින් පැමිණෙන අමුත්තන් සඳහාත් හඳුන්වාදීමට හැකි වේ. ඒ අනුව ඒ සඳහා ව්‍යාපෘති තුනක් හඳුන්වාදී ඇත. ඒවා නම්

- *රාජ්‍ය තාන්ත්‍රික පරිවර්තනය*
- *මධ්‍ය කලාප උද්‍යාන නිර්මාණය කිරීම*
- *සංස්කෘතික වටිනාකම පවතින නැවත සංවර්ධනය*

උපායමාර්ගික ව්‍යාපෘතිය 1 :
රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් වෙන්කර ගැනීම.

ව්‍යවස්ථාදායකය රටක පිළිගත් ප්‍රධාන පරිපාලනමය ව්‍යුහයක් වන අතර එම ප්‍රදේශය තුළම එනම් අගනගර මධ්‍ය කලාපය තුළම රාජ්‍ය තාන්ත්‍රික ආයතන එනම් තානාපති කාර්යාල පිහිටුවීමට මෙම සැලසුමතුළින්යෝජනා කර ඇත. ඒ සඳහා මංසන්ධියේ සිට පාර්ලිමේන්තු පර්යන්තය (අපේ ගම ඉඩමද ඇතුළත්ව) දක්වා ප්‍රදේශය විශේෂයෙන් යෝජනා වී ඇත එම ප්‍රදේශය දැනටමත් අධි ආරක්ෂිත කලාපයක් ලෙසද ආරක්ෂක අංශයන් පවත්වාගෙන යනු ලබන කලාපයකි තවද, ජනාධිපති කාර්යයාලය හා අදාළ ක්‍රියාකාරකම් පාර්ලිමේන්තුව පිටුපස ඇති භූමියට ගෙන එම මඟින් ඉහත පැහැදිලිකරන ලද මනක්කල්පිත අක්ෂය මත විධායකය නිරූපන කිරීමද සිදුවනු ලැබේ. මෙහි ප්‍රධාන අරමුණ වනුවේ අගනගර මධ්‍ය කලාපය සඳහා විශේෂ අනන්‍ය තාවයක් ලබා දීමය.



සිතියම 10.6 : අගනගරයේ රාජ්‍ය තාන්ත්‍රික පරිවර්තනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේශ්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 2 : අගනගර මධ්‍ය කලාපය තුළ උද්‍යාන පිහිටුවීම.

අභිමානවත් අගනගර කලාපයක් බිහිකිරීම සඳහා නගරයට අවශ්‍ය පහසුකම් සැපයීම මෙන්ම එම ප්‍රදේශයේ පවතින්න වූ තෙත්බිම් දාමයන් 100% ක් ආරක්ෂාකර ගැනීම ද කිලෝමීටර 1.5 ක අරයෙන් යුක්ත වූ අගනගර මධ්‍ය කලාපය තුළ සිදුකල යුතු වේ එම තෙත්බිම් අශ්‍රිතව ප්‍රෞඩත්වයෙන් හෙබි උද්‍යාන නිර්මාණය කිරීම ඒ සඳහා හඳුනාගත් උපාය මාර්ගයක් ලෙස දැක්විය හැක.

උපායමාර්ගික උප ව්‍යාපෘතිය 1 : ඇවිදින මංතීරු හා කුඩා උද්‍යාන නිර්මාණය කිරීම

මෙහි අවසාන අරමුණ වන්නේ, ස්වභාවික හරිත කලාපයන් සම්පූර්ණයෙන්ම සංරක්ෂණය කරන අතරම සෞන්දර්යාත්මක වටිනාකම වැඩි කිරීමය එමෙන්ම මෙම වැඩපිළිවෙළ රටට විශාල ආර්ථික ප්‍රතිලාභයක් විය හැකි බව විශ්වාස කරන අතර සිතියමෙහි දැක්වෙන අගනගර මධ්‍ය කලාපයේ හා ඒ හා බී වශයෙන් දක්වා ඇති කුඩා උද්‍යාන මඟින් පරිසර හිතකාමී ලෙස තෙත්බිම් විවෘත කිරීම මඟින් ස්වභාවික සම්පත් වැඩිදියුණු කිරීමට උපායමාර්ගික මැදිහත්වීම යෝජනා කරයි. තවද, තෙත්බිම් සම්බන්ධ කිරීම සඳහා උද්‍යාන එකිනෙකට සම්බන්ධ කිරීමට යෝජනා කරනු ලැබේ මෙම උද්‍යාන සම්බන්ධකයන් මඟින් තෙත්බිම් පරිසර පද්ධතිය පදිකයන් හට හා රථ වාහන භාවිත නොකොට සිදුකරන්න වූ ප්‍රවාහන සේවා (පාපැදි) සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.



රූපය 10.11 : ඇවිදින මංතීරු, උද්‍යාන සහ පාලම් සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේයිෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



රූපය 10.12 : ඇවිදින මංතීරු, උද්‍යාන රූප
මූලාශ්‍රය : www.mtl.org/en/experience/explore-montreals-parks-and-green-spaces

උපායමාර්ගික උප ව්‍යාපෘතිය 2 : නව පාලම් සැදීම හා පවතින පාලම ප්‍රතිසංස්කරණය කිරීම

අගනගරයෙ හි පවතින එහි වටිනාකම ඔප්නැංවීම සඳහා නගරයේ පවතින භෞතික අංගයන් ගෙන් ලැබෙන පිටුවහල ඉමහත් වන අතර මෙම උපාය මාර්ගය තුළින්එම භෞතික අංගයන්ට වාස්තු විද්‍යාත්මක අගයක් ලබාදීමට මෙයින් යෝජනා කරයි තවද, 10. 13 රූපයේ සඳහන් පරිදි 01 ,05 යන ස්ථාන වල පාලමද 02, 03, 04 සහ 06 යන ස්ථානවල නව පාලම් ඉදිකිරීමට යෝජිත අතර, අගනගර මාධ්‍යය කලාපය වටා ගමන් කරන මාර්ගය වඩාත් ක්‍රියාකාරී වනු ඇත.



රූපය 10.13 : ඇවිදින මංතීරු සහ උද්‍යාන සංවර්ධනය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 3 : ජල අභිමුඛ මාර්ග සංවර්ධනය කිරීම

අගනගර සංවර්ධන සැලසුමේ මුල් භාගයේදී ප්‍රදේශය තුළ පවතින තෙත්බිම් ප්‍රශස්ත ලෙස වර්තමානයේ භාවිත නොවන බව පැහැදිලිව හඳුනාගත් අතර ඒ සඳහා ප්‍රවේශ වීමට ඉඩකඩක් නොමැතිවන බව පැහැදිලි වුණු කරුණක් වේ එම හේතුව නිසාම පාරිසරික හිතකාමී භූමි අලංකරණය මඟින් තෙත්බිම් ආශ්‍රිත මාර්ගයන් සංවර්ධනය කිරීමට යෝජිතය. පාරිසරික සංවේදී ප්‍රදේශ හා නාගරික ප්‍රදේශ අතර විශාල සුසංයෝගයක් ගොඩනැගීමට මෙමඟින් බලාපොරොත්තු වනු ලැබේ.

නිපොන් මාවත, මහින්දාරාම පාර, කොළඹ තන්තිරි පාර, කෝට්ටේ පාර, බැද්දගාන පාර, දුව පාර, ඇළ මාර්ගයේ (ඉයන් පෝරුව රජමහා විහාරය) වැනි ප්‍රවේශ මාර්ග තෙත්බිම් මාර්ග ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වී ඇත.



රූපය 10.14 : වැව වෙන ඇති පිවිසුම් මාර්ග වැඩිදියුණු කිරීමේ උපායමාර්ගය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 3 : පුරාවිද්‍යාත්මක වටිනාකමක් පවතින ස්ථාන ඔස්සේ සංචාරකයන් සඳහා චාරිකා ප්‍රදේශ හා විධිමත් මාර්ගෝපදේශනයකින් යුත් මාවත් නිර්මාණය කිරීම.

Sub-Project 1 : Design an Archeological Trail

සැලසුම් ප්‍රදේශ තුළ පවතින්න වූ පුරාවිද්‍යාත්මක ස්මාරකයන්, කෝට්ටේ බලකොටුව ඉතා වැදගත් අංගයක් ලෙස දැක්විය හැක මෙම පුරා වස්තූන් ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ වූ අද්විතීය ගෘහනිර්මාණ සහ සංස්කෘතික වටිනාකම් සංරක්ෂණය කිරීමේදී තීරණාත්මක අභියෝග පවතී. එබැවින්, ස්මාරකයන්ට මායිම් වූ ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා අනිවාර්යයෙන්ම විශේෂ මාර්ගෝපදේශ සැලැස්මක් භාවිතා කළ යුතු වේ. තවද සංරක්ෂණය කළ ප්‍රදේශ තුළ පවතින විශේෂ ලක්ෂණයන් පවත්වා ගැනීම සඳහා නිසි රෙගුලාසි යොදා ගත යුතුය. ඓතිහාසික හා සංස්කෘතික වටිනාකමක් සහිත ඓතිහාසික කෞතුකාගාරය, පුස්තකාලය, කලාගාරය, කලා හා ශිල්ප මධ්‍යස්ථානය සහ ලේඛනාරක්ෂක කටයුතු පවත්වාගැනීමට ඉවහල් වන්න වූ ව්‍යපෘති නිර්මාණය කිරීමටත් එමඟින් වාණිජමය වටිනාකමක් ලබාදීමටත් බලාපොරොත්තු වනු ලැබේ.

පුරාවිද්‍යා නැරඹුම් මාර්ගයේ පිහිටා ඇති ඓතිහාසික ස්ථාන

- ශ්‍රී පැරකුම්බා පිරිවෙන
- මහින්දාරාම විහාරය
- අලකේශ්වර සොහොන් කොත
- අංගම්පිටිය
- පුරාවිද්‍යා කෞතුකාගාරය
- ලැම්බ්‍රික් ශාලාව
- සුනේත්‍රාරාමය
- කෝට්ටේ අම්බලම
- වෙහෙරකන්ද විහාරය
- ආනන්ද ශාස්ත්‍රාලය
- කෝට්ටේ රාජ මහා විහාරය
- ජුබිලි කනුව
- කෝට්ටේ කොටු පවුර



රූපය 10.15 : යෝජිත පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකම පිළිඹිබු වන භූමි ප්‍රදේශ
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපාය මාර්ගික මැදිහත් වීම	ව්‍යපෘති කේතය	උපායමාර්ගික ව්‍යාපෘතිය
මනඃකල්පිත අක්ෂ හෝ අක්ෂය නිර්මාණය.	SII-D12	ශ්‍රේෂ්ඨාධිකරණය IDH ඉඩමේ ස්ථානගත කිරීම
	SI-D-1	ජනාධිපති මන්දිරය හා රටට අදාළ ගොඩනැගිලි පාර්ලිමේන්තුව පිටුපස අක්ෂ ගත ඉඩමට යෝජනා කිරීම.
	SI-D-2	අනන්‍යතාවය දැනවෙන අයුරින් නගරයේ හඳුනාගත් ස්ථානවල සංකේත නිර්මාණය කිරීම
ධූරාවලිය හා සංක්‍රාන්ති කලාපයක් නිර්මාණය කිරීම.	SII-D7	විශේෂ පිවිසුම් මාර්ග තුළ භූමි නිර්මාණාත්මක ව්‍යපෘති සිදුකිරීම.
	SII-D8	විශේෂ පිවිසුම් මාර්ග වලට මුහුණලා ඇති ගොඩනැගිලි නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය .
		හඳුනාගත් ප්‍රධාන මංසන්ධි නිර්මාණය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය
	SI-D-3, SI-D-4, SI-D-5 and SI-D-6	නගරයට පිවිසෙන විශේෂ ද්වාර නිර්මාණය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය .
සංවෘත කලාපයක් නිර්මාණය කිරීම.	SIII-W-13, SI-W-1, SII-W- 6, SII-W- 7	අගනගර කලාපය නිර්ණය කරන්නා වූ ස්වභාවික මායිම් වල ගිලිහුණු සම්බන්ධතා යලින් ප්‍රතිස්ථාපනය කිරීම.
අගනගර මධ්‍ය කලාපයක් නිර්මාණය කිරීම.	SII-D10	රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා විශේෂ කලාපයක් වෙන්කර ගැනීම.
	SI-W-2	අගනගර මධ්‍ය කලාපයේ උද්‍යාන නිර්මාණය.
	SII9-D and SII-D11	ඇවිදින මංතීරු හා කුඩා උද්‍යාන නිර්මාණය කිරීම.
		ජල අභිමුඛ මාර්ග සංවර්ධනය කිරීම.

වගුව 10.1 : නාගරික සැලසුම් උපාය මාර්ගික උපායමාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

10.5. නාගරික නිර්මාණ උපාය මාර්ගය නිසා ඇතිවන බලපෑම

ඉහත සඳහන් උපායමාර්ගික සැලසුම නිසි ආකාරව ක්‍රියාවට නැංවීමතුළින් අගනගර සැලසුම් කලාපය සැලසුමේ ප්‍රධාන අරමුණක් වන්න වූ "අනන්‍ය ප්‍රතිරූපයකින් හා අවේණික ලක්ෂණ වලින් හෙබි අගනගරයක්" සැලසුම් ප්‍රදේශයට ලබාදෙන අතර, අගනගර කලාපය තුළට පිවිසේන්නෙක් හට විශේෂ මාර්ග අභිමුඛව හා පිවිසුම් ද්වාර තුළ අගනගරයට පිවිසුම යන හැඟීම ප්‍රතිනිර්මාණය කිරීමට හැකියාවක් පවතී මෙම සැලසුම හරහා ශ්‍රී ලංකාවේ අගනුවර ප්‍රනිර්මාණය කරන අතර එවෙනි අතිශයෙන් වැදගත් වූ කාර්යක ප්‍රථම පියවර වශයෙන් හැදින්වීමට හැකියාවක් පවතී.

11

අනීත දරුමයන් ආරක්ෂා කරගැනීමේ උපාය මාර්ගික සැලසුම



11 පරිච්ඡේදය
අතීත උරුමයන් ආරක්ෂා කරගැනීමේ උපාය මාර්ගික සැලසුම

හැදින්වීම

අභිප්‍රායන් සහ අරමුණු

11.1. හැදින්වීම

උරුමය යන්න සෘජු නිර්වචනයේදී "පාරම්පරික දේපළ ලෙස අර්ථ ගැන්වුවද උරුමයක වටිනාකම අතීතය සමඟ සබැඳි යන්නෙන් පමණක් ඇති වන්නක් නොවන අතර එහි වර්ථමාන තත්ත්වය පිළිබඳ ඇගයීමද අත්‍යවශ්‍ය වනු ඇත .ඉහත සඳහන් කල ආකාරයට උරුමයක වටිනාකම වර්ගීකරණය ,ස්පර්ශ කළ හැකි එනම් භෞතිකව පවතින දේ මෙන්ම ,ස්පර්ශ කළ නොහැකි එනම්, දැනුම ප්‍රතිමාන හෝ ආචාර රීතීන් ලෙස පවත්නා දේ ලෙස දැක්වීම කරනු ලබයි. අගනගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී "උරුමය" යන්න ව්‍යුත්පන්න කිරීමේදී ඉහත දක්වා ඇති අදහස් සැලකිල්ලට ගනු ලැබූ අතර ඒ අනුව සැලසුම් ප්‍රදේශය තුළ භෞතික හා භෞතික නොවන අයුරින් උරුමයන් පවත්නා බව හඳුනාගත හැකි විය.

පුළුල් පරාසයක විහිදුනු උරුමයන්ගෙන් සංයුක්ත වූ අගනගර සැලසුම් ප්‍රදේශය සඳහා වඩාත් සුක්ෂම හා සංවේදී ප්‍රවේශයක් සහිත සංරක්ෂණ උපායමාර්ගයක් අවශ්‍ය වන අතර එම ප්‍රදේශය ඉලක්ක කරගත් ව්‍යාපෘති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා නාගරික සංවර්ධන අධිකාරියේ අදීක්ෂණයට යටත්ව සිදුවිය යුතුය.

11.1.1. අභිප්‍රායන් සහ අරමුණු

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත ගැසට් පත්‍රයට අනුව සංරක්ෂණය කල යුතු පුරාවිද්‍යා ස්මාරක හඳුනාගෙන ඇති අතර, ඒවා සංවර්ධනයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ඇතිව එම සංවර්ධන කටයුතු සිදුකලයුතු වේ.

සිතියම 11.1 : සැලසුම් කළ ප්‍රදේශයේ හඳුනාගත් පෞරාණික ස්ථාන

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරිශ්‍රණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



සැලසුම් ප්‍රදේශය තුළ හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන
උරුම සංරක්ෂණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පරිශ්‍රණ හා ඉඩම් අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි මස 2018

Monument / Place	Number
මුල්ලේරියාව සටන සිදුකල ස්ථානය	1
නවගමුව පන්සල	2
කෝට්ටේ පුරාවිද්‍යාත්මක කෞතුකාගාරය	3
කෝට්ටේ අම්බලම	4
සිරි පැරකුම්බා පිරිවන	5
අලකේශ්වර සොහොන	6
ලැම්බ්‍රික් ශාලාව	7
ආනන්ද ශාස්ත්‍රාලය	8
වෙහෙරකන්ද පන්සල	9
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව	10
ආරක්ෂක අමාත්‍යංශ ගොඩනැගිල්ල	11
යෝජිත බෞද්ධ ස්මාරකය	12
කෝට්ටේ රජමහ විහාරය	13
ශ්‍රී විජයාරාම රජ මහා විහාරය	14
කොරතොට රජමහ විහාරය	15
කැළණි ය රජමහ විහාරය	16
ජුබිලි කනුව	17
අංගම් පිටිය	18
සුනේත්‍රාරාමය	19
මහින්දාරාමය පන්සල	20
ජනාධිපති කාර්යාලය හා මන්දිරය	21
ශ්‍රේෂ්ඨාධිකරණය	22

වගුව 11.1 : ලැයිස්නුගත ඓතිහාසික ස්මාරක සහ ස්ථාන
මූලාශ්‍රය : ජාතික පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

11.2. වර්තමාන තත්ත්වය

11.2.1. ස්පර්ශීය උරුමයන්

ස්පර්ෂිය උරුමයන් පහත පරිදි වර්ගීකරණය කල හැක

- ආගමික වශයෙන්
- පෞද්ගලික අයිතිය මත
- පොදු අයිතිය මත
- රාජ්‍ය සන්තක
- ස්වභාවික පාරිසරික අංග
- පොදු එළිමහන් ස්ථාන
- වීදි

අංකය	ස්ථාන	වර්ගීකරණය
1	මුල්ලේරියාව සටන සිදුකල ස්ථානය	පොදු එළිමහන් ස්ථාන
2	නවගමුව පන්සල	ආගමික වශයෙන්
3	කෝට්ටේ පුරාවිද්‍යාත්මක කෞතුකාගාරය	පොදු
4	කෝට්ටේ අම්බලම	පොදු
5	සිරි පැරකුම්බා පිරිවන	ආගමික වශයෙන්
6	අලකේශ්වර සොහොන	පොදු එළිමහන් ස්ථාන
7	ලැම්බ්බිරික් ශාලාව	පොදු
8	ආනන්ද ශාස්ත්‍රාලය	පොදු
9	වෙහෙරකන්ද පන්සල	ආගමික වශයෙන්
10	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව	රාජ්‍ය
11	ආරක්ෂක අමාත්‍යංශ ගොඩනැගිල්ල	රාජ්‍ය
12	යෝජිත බෞද්ධ ස්මාරකය	ආගමික වශයෙන්
13	කෝට්ටේ රජමහ විහාරය	ආගමික වශයෙන්
14	ශ්‍රී විජයාරාම රජ මහා විහාරය	ආගමික වශයෙන්
15	කොරනොට රජමහ විහාරය	ආගමික වශයෙන්
16	කැළණි ය රජමහ විහාරය	ආගමික වශයෙන්
17	ජුබිලි කනුව	පොදු
18	අංගම් පිටිය	පොදු එළිමහන් ස්ථාන
19	සුනේත්‍රාරාමය	ආගමික වශයෙන්
20	මහින්දාරාමය පන්සල	ආගමික වශයෙන්
21	ජනාධිපති කාර්යාලය හා මන්දිරය	රාජ්‍ය
22	ශ්‍රේෂ්ඨාධිකරණය	රාජ්‍ය

වගුව 11.2 : ස්මාරක වර්ගීකරණය
මූලාශ්‍රය : ජාතික පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

අගනගර සැලසුම තුළ ප්‍රධාන වශයෙන් පොදු එළිමහන් ස්ථාන, ආගමික, රාජ්‍ය හා රජයට අයත් ස්මාරක පිළිබඳ පමණක් සඳහන් කරන අතර හඳුනා නොගත් පෞද්ගලික ඉඩම් වල (නිවාස හා ව්‍යුහ)ස්මාරක රාශියක් පවතින බවටද හඳුනාගෙ ඇත. මෙම ස්මාරකයන්ද හරි ආකාරව හඳුනාගෙන නිසි ක්‍රම වේදයක් තුළ ඒවා සංරක්ෂණය කිරීමටද විධිවිධාන යොදා ගතයුතු වේ.

11.2.2. අස්පර්ශීය උරුමය

සංස්කෘතික උත්සව

- *කෝට්ටේ පෙරහැර*
- *නවගමුව පෙරහැර*

1. නවගමුව දේවාල පෙරහර

නවගමුව දේවාලය යනු කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල නගර සභා බල ප්‍රදේශයේ පිහිටි පත්තිනි දේවාලයට කැප කර ඇති පන්සලකි. මෙම විහාරස්ථානය කැළණි ගඟ හා කොළඹ රත්නපුර මාර්ගයේ 13 වන සැතපුම් කණුව අසල පිහිටීම එයට මහගු වටිනාකමක් එක් කරයි.



සිතියම 11.2 : නවගමුව පෙරහැර මාර්ගය
මූලාශ්‍රය : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2002 වර්ෂයේ නොවැම්බර් 22 වන දින කොළඹ නව නගරයේ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකය ලෙස නවගමුව පටුන දේවාලය ප්‍රකාශයට පත් කරන ලදී. එහි ඓතිහාසික, වාස්තුවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මක වැදගත්කම නිසා එලෙස නම්කර ඇති අතර අතීත පුරාවෘත්තයන්ට අනුව දේවාලයේ මුල්කාලීන ස්ථාපනය නැවතත් 1 වන සියවස දක්වා දිව යයි. පුරාවිද්‍යා පරීක්ෂණවලට අනුව පුරාවිද්‍යා ස්ථානවල සිට නව යුගයට උරුමකම් දක්වා ඇත. එමෙන්ම පත්තිනි දේවතාවියන්ගේ ආශීර්වාද ලබාගැනීම සඳහා මෙම දේවාලයට ජනතාව නිතැතින් පැමිණෙනු ලැබේ.

නවගමුව පත්තිනි දේවාලයේ ප්‍රධාන උත්සවය අගෝස්තු මස පවත්වන ලද 'ගොනිපිට පෙරහැර' වේ. මෙම සාම්ප්‍රදායික උත්සවය පසුගිය වසර 1500 ක් පුරා දිවගිය පත්තිනි දේවතාවියගේ ආශීර්වාද පතා පවත්වන අතර වාර්ෂික පෙරහර මංගල්‍යයට සහභාගී වන ගම්මාන වල සුදු ගවයින් මේ සඳහා යොදාගනු ලැබේ.

මෙම උපාය මාර්ගය ඔස්සේ පෙරහැරේ මාර්ග නැවත සකස් කළ යුතුය යයි හඳුනාගන ඇති අතර අවශ්‍ය අවකාශය හා පහසුකම් සැපයීම සඳහා ද අවධානය යොමුකරනු ලැබේ.

2. කෝට්ටේ රජමහා විහාරය පෙරහැර

කෝට්ටේ රජ මහා විහාරය ශ්‍රී ලංකාවේ පිහිටි ඓතිහාසික බෞද්ධ විහාරයක් වන අතර එය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිට ඇත. එමෙන්ම එය ඓතිහාසික ගොඩනැගිල්ලක් වන කෝට්ටේ ගල් අම්බලම අසල පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා භූමියක් වශයෙන් මෙම විහාරය නිල වශයෙන් පිළිගෙන ඇති අතර 1811 අංක දරණ රජයේ ගැසට් නිවේදනය යටතේ මෙම නාමය ප්‍රකාශයට පත් කරන ලදි.

සෑම වසරකම කෝට්ටේ රජමහා විහාරයේ වාර්ෂිකව පෙරහැර පැවැත්වෙන අතර බුදුන්ගේ දන්ත ධාතූන් වහන්සේ එහි වැඩ සිටි බව සිහි කිරීම උදෙසා සහ ගෞරවාචාර දැක්වීමට මෙම පෙරහැර මංගල්‍යය පවත්වනු ලැබේ. පෙරහැර පළමු වරට ආරම්භ කළේ විදියගම මෛත්‍රී හිමියන්ගේ උපදෙස් අනුව VI වන පැරකුම්බා රජු විසිනි. කෝට්ටේ රාජධානිය කඩා වැටීමෙන් පසුව 1914 දී පෙරහැර උත්සවය නතර කරන ලද්දේ ඇඹුල්ගම විමලතිස්ස හිමි විසිනි.



සිතියම 11.3 : කෝට්ටේ පෙරහැර මාවත
මූලාශ්‍රය : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

මෙම සැලසුම මඟින් පෙරහැර ගමන්කරන මාර්ගයන් (නාග විහාර පාර, කෝට්ටේ පාර, රජ මහා විහාර පාර, මින්දු මාවත සහ පාගොඩ පාර) ප්‍රතිසංස්කරණය කළ යුතු අතර අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා අවධානය යොමුකර ඇත.

11 පරිච්ඡේදය
අතීත උරුමයන් ආරක්ෂා කරගැනීමේ උපාය මාර්ගික සැලසුම

උරුමයට උපායමාර්ගික මැදිහත්වීම්

උපාය මාර්ගික මැදිහත්වීම 1 : අතීත උරුමයන් කළමනාකරණය කිරීම සඳහා විදිවිධාන සැලසීමේ ක්‍රමවේදයන්

11.3. උරුමයට උපායමාර්ගික මැදිහත්වීම්

උපාය මාර්ගික මැදිහත්වීම 1 :
අතීත උරුමයන් කළමනාකරණය කිරීම සඳහා විදිවිධාන සැලසීමේ ක්‍රමවේදයන්

මෙම සැලසුමේ අභිමතාර්ථ වනුයේ අතීත උරුමයන්හී මිලකළ නොහැකි වටිනාකම් අවබෝධ කොටාගෙන ඒවායේ අගයන් වර්ථමානයේදී ප්‍රයෝජනයට ගැනීමට කටුතු කිරීමය. ඒ සඳහා පහත දැක්වෙන උරුම කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

නැවත භාවිතා කිරීම — මෙම ක්‍රමවේදයේදී නැවත භාවිතා කිරීම යන සංකල්පයට යොමු වී තිබේ. මෙමඟින් පෞරාණික වටිනාකමකින් යුතු ගොඩනැගිලි එම ලක්ෂණ ආරක්ෂා වන අයුරින් ගොඩනාඟ, නව භාවිතයකට හෝ පෙර තිබූ භාවිතයටම හෝ යොදා ගැනීම සිදුකෙරේ. එමෙන්ම එම උරුමයන්හී සුරක්ෂිත භාවය නැවත ගොඩනැඟීම තිරසාර සංවර්ධනයට හොඳ ඉදිරි මාවතක් වන අතර, එම ක්‍රියාවලිය අතීත උරුමයේ වටිනාකම් පිළිබඳ හැඟීම් සම්ප්‍රේෂණය කිරීමේදී භෞතික සන්දර්භය ආරක්ෂා කර ගැනීම සඳහා ද හේතුවනු ලැබේ.

නැවත ප්‍රතිනිර්මාණය කිරීම — මෙම ක්‍රමවේදය තුළින් වන්නේ පෞරාණික වටිනාකමකින් යුත් ගොඩනැගිළි එම ලක්ෂණ ඇතිව මුල් ව්‍යුහය පමණක් ආරක්ෂා කරගනිමින් නැවත ගොඩ නංවා එහි ඇතුළත භාවිතය නව භාවිතයක් සඳහා භාවිතා කිරීමයි. පෞරාණික ගොඩනැගිලි සංරක්ෂණයේ මෙම ක්‍රමවේදය ආර්ථිකමය වටිනාකමක් ආකර්ෂණය කරගැනීම සඳහා වැඩි බලපෑමක් ඇති කරනු ලැබේ.

ප්‍රතිසංස්කරණය — උරුමය සංරක්ෂණය කිරීමේ මෙම ක්‍රමවේදය දැනටමත් නැති වී ඇති උරුම වූවත් නැවත සාදා හෝ ඉදිකිරීමතුළින්කල හැකි වන අතර මෙම සංකල්පය ගොඩනැඟිලි, ස්මාරක, මූර්ති ආදිය සමඟ භාවිතා කළ හැකිය. මෙය නව සමාජය තුළ ඓතිහාසික සාරධර්ම නැවත ඇති කිරීමට තුඩු දෙනු ඇත.

මේ සියලු මෙවලම් ඓතිහාසික ස්මාරකයන්ට සෘජුව සම්බන්ධ වන බැවින් එහි සන්දර්භය විශ්ලේෂණය සිදුකර ක්‍රියාත්මක කලයුතු වේ. ඒ සඳහා ජාතික උරුමයන්ව පවතින ස්ථානය, පැරණි භාවිතය, පවත්නා පරිහරණය, අසල්වැසි ඉඩම් භාවිතය, ප්‍රවේශ මාර්ග , ඓතිහාසික පරිමාව ආදිය විශ්ලේෂණය කළ යුතුය.

උපාය මාර්ගික මැදිහත්වීම 2 :
අලවිකරණය හා ප්‍රවර්ධනය කිරීම (ජාතික උරුමයන් සමඟ ජීවත වීම)

'උරුමය සමඟ ජීවත් වීම ' යන සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා නිසි අලෙවි ක්‍රමෝපායක් ඇති කිරීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රවණතාවය අනුව සංවර්ධකයන් විශ්වාස කරනු ලබන්නේ නූතන වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරු සැලසුම් පමණක් වැඩි ආර්ථික ප්‍රතිලාභ ළඟා කරගන්නා බවය. එහෙත් උරුමයන් තක්සේරු කරන්නන් විසින් සනාථ කර ඇති පරිදි ඉපැරණි ස්මාරකයන් තුළ ගණනය කල නොහැකි වටිනාකමක් අන්තර්ගත බවයි, අදාළ පාර්ශවකරුවන් අතර ක්‍රමවත් අලෙවිකරණ ක්‍රමවේදයක් තුළින් මෙම සංකල්පය ප්‍රවර්ධනය කිරීමට හැකිවන අතර, ඒතුළින්එහි ඇති සැගවුණු වටිනාකම ඔවුන්ට අවබෝධ වනු ඇත.

සංයුක්ත නගර නිර්මාණ සැලැස්මක ප්‍රවේශය ලබාගැනීම

සංස්කෘතිය, සාරධර්ම, ජීවනෝපාය වැනි සාරධර්ම පවා යම් භෞතික සැකසුම් සමඟ සෘජුව සම්බන්දව නොතිබුනද, එම ප්‍රදේශයේ භෞතික සන්දර්භය එම අස්පර්ශන උරුමයන් හට බලපෑමක් සිදුකල හැක. එබැවින්, මුලින් හඳුනාගත් එවැනි අස්පර්ශීය උරුමය හඳුනා ගැනීම අවශ්‍ය වන අතර ඒ අනුව අනෙකුත් යටිතලපහසුකම් හා ආයෝජන සැලැස්ම වෙනස් කිරීම සිදුකල යුතු වේ.

Regulatory Approach

උරුමය සංරක්ෂණය කිරීමේ උපාය මාර්ගයේ, ස්වාභාවික පාරිසරික සංරචක සහ පොදු අවකාශය සංරක්ෂණය කිරීමේ නියාමන විධිවිධාන අනිවාර්ය සාධකයකි. මුලින් සඳහන් කළ පරිදි අගනගර සැලසුම් ප්‍රදේශ තුළ විවිධාකාර ස්වභාවයේ ස්මාරක පැතිරී පවතින අතර පුරාවිද්‍යා ආඥාපනත, වෙරළ සංරක්ෂණය පනත, නාගරික සංවර්ධන අධිකාරි සහ පළාත් පාලන ආයතන රෙගුලාසි ආදී දැනට පවතින විධිවිධානද මේ සඳහා ඒකාබද්ධව යොදාගත හැකිවේ.

11.4. අතීත උරුමයන් පිළිබඳ නාගරික සැලසුම් උපායමාර්ගය සඳහා උපායමාර්ගික ව්‍යාපෘති

පහත සඳහන් ක්‍රියාමාර්ග යොදාගෙන උරුමයන් කළමනාකරණය කරගැනීමේ උපාය මාර්ගය හරහා උරුමයන් කළමනාකරණය කරගැනීමේ ව්‍යාපෘති හඳුනාගත හැකි වේ.

- *විශේෂ උරුම සැලැස්ම සකස් කිරීම (මාර්ගෝපදේශ සැලැස්ම)*

මෙම සැලැස්ම හරහා කෝට්ටේ රාජධානිය පවතින ප්‍රදේශය විශේෂ මාර්ගෝපදේශ සැලැස්මක් ලෙස තෝරාගෙන ඇති අතර එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, දේශීය හා ජාත්‍යන්තර අතීත උරුමයන් පිළිබඳ කටයුතු කරන්න වූ නගර නිර්මාණ ශිල්පින්, නාගරික සැලසුම්කරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතුය. එමෙන්ම මෙම ප්‍රදේශය තුළ හඳුනාගත් සහ හඳුනා නොගන්නා ලද පුරාවිද්‍යා ස්මාරකවලින් සම්පූර්ණයෙන්ම ආවරණය වී ඇති අතර ඒවා දිනෙන් දින වේගයෙන් විනාශ වෙමින් පවතී. එබැවින් හඳුනාගත් පුරාවිද්‍යාත්මක අංග ආරක්ෂා කිරීම, හෙළිදරව් කිරීම හා පුරාවිද්‍යා මං සැලසුම් සකස් කිරීමේ ක්ෂණික අවශ්‍යතාවය ඉතා වැදගත් වේ. එක් එක් උරුමයන්හි වටිනාකම්, අවකාශීය තොරතුරු සමඟ හඳුනාගත යුතුය. ගාලු කොටුවට සමාන තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සැකසිය යුතු අතර සියලුම සේවා ජාල භූගත කලයුතු අතර සියලු නාම පුවරු, ආලෝකකරණය කිරීම වැනි විශේෂිත ක්‍රියාමාර්ග මාර්ගෝපදේශන සැලසුම යටතේ සිදුකලයුතු වේ.

උපායමාර්ගික ව්‍යාපෘති 1 : පුරාවිද්‍යා ගවේෂණ මං තීරුවක් සැලසුම් කිරීම

ඇවිද යා හැකි දුරින්, පුරාවිද්‍යා වස්තු සුරැකීම සහ අනාවරණය සඳහා පුරාවිද්‍යා ගවේෂණ මං තීරුවක් සැලසුම් කිරීම.

නාගරික සංවර්ධන අදිකාරියේ පාරිසරික හා භූදර්ශන අංශය විසින් ගැසට් කල ඇති සමහරක් වටිනා පුරාවස්තූන් එක්කර ගවේෂණ චාරිකා මාවතක් වඩා පිළිවෙලකින් සකස්කරමින් පවතින අතර ඒ මඟින් පුරාවස්තූන් සාමන්‍ය මහජනයාට විවෘත කරලීමට වැඩපිළිවලක් යොදා ඇත.

1	කෝට්ටේ කෞතුකාගාරය
2	අම්බලම කෝට්ටේ
3	ශ්‍රී පැරකුම්බා පිරිවෙන
4	අලකේශ්වර සොහොන
5	ලම්බ්රික් ශාලාව
6	ආනන්ද ශාස්ත්‍රාලය
7	වෙහෙර කන්ද විහාරය
8	ජුබිලි කනුව
9	අංගම්පිටිය
10	සුනේත්‍රාරාමය
11	මහින්දාරාම පන්සල
12	කෝට්ටේ කොටු පවුර

ඒසඳහා කෝට්ටේ කෞතුකාගාරය, අංගම්පිටිය, කෝට්ටේ අම්බලම, ලම්බ්රික් ශාලාව, , කෝට්ටේ කොටු පවුර , වෙහෙරකන්ද, ජුබිලි පෝස්ට්, ටනල්ස්, අලකේශ්වර සොහොන , සුනේත්‍රාරාමය යන යනාදී වශයෙන් ස්ථාන රැසක් කේන්ද්‍ර කරගෙන ඇත. මෙසේ පුරාවිද්‍යා ස්මාරක රැසක් සම්බන්ද කරමින් නිර්මාණය වන පුරාවිද්‍යා මංතීරු, අග නගරයට ඇති ආකර්ෂණය තව දුරටත් වැඩි කරනු ඇත.

වගුව 11.3 : පුරාවිද්‍යා පියමගෙහි ගමනාන්ත
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරේක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



යෝජිත පුරාවිද්‍යා ගමන් මාර්ගය
උරුම සංරක්ෂණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා පුහුණු අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 11.4 : යෝජිත පුරාවිද්‍යාත්මක මාවත

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

උපායමාර්ගික ව්‍යාපෘතිය 2 : කොටු පවුර ප්‍රතිනිර්ජනන ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අධිකාරිය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කෝට්ටේ කොටුපවුර ප්‍රතිනිර්මාණය කිරීමේ වැදගත්කම වසර කීපයක සිට හඳුනාගෙන ඇත. පුරාවිද්‍යා ගවේෂණ මංපෙත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය ට සමගාමීව කොටු පවුර ප්‍රතිනිර්මාණ කිරීමද ආරම්භ කර ඇති අතර එය ප්‍රධාන අංගයක් බවටද පත්වී ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කොටුපවුරේ වත්මන් තත්වය මෙසේ තුන් ආකාරයකින් හඳුනගෙන ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය හරහා පහත සඳහන් දෑ ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ

- *හානියට පත් වූ ප්‍රදේශ නැවත ඉදිකිරීම.*
- *ඉතිරි කොටස සංරක්ෂණය කිරීම*
- *කොටු බැම්මේ ඇතුළතින් මීටර් 3ක ද, පිටතින් මීටර 4.5 ක ද සංරක්ෂණ කලාපයක් පිහිටුවීම*

Damaged Rampart

Non Conserved Rampart

Conserved Rampart

උපායමාර්ගික මැදිහත් වීම	ව්‍යපෘති ක්ෂේත්‍රය	ව්‍යපෘති නම
ජාතික උරුමයන් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ගය	SI-H-1	විශේෂ උරුමයන් ආරක්ෂා කරගැනීමේ සැලැස්මක් සකස් කිරීම
	SI-H-2	පුරාවිද්‍යා වස්තු සුරැකීම හා පුරාවිද්‍යා ගවේෂණය සඳහා ඇවිද යා හැකි දුරක් තුළ නිමවන පුරාවිද්‍යා මංතීරු නිර්මාණය කිරීම
	SI-H-3	කොටුපවුර ප්‍රතිනිර්ජනන ව්‍යාපෘතිය

වගුව 11.4 : උරුම සංරක්ෂණ උපායමාර්ගයේ උපායමාර්ගික ව්‍යාපෘති
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පරීක්ෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



බලකොටු ප්‍රකාරයේ වර්තමාන තත්වය
උරුම සංරක්ෂණ උපායමාර්ගය, අගනගර සංවර්ධන සැලැස්ම

දත්ත මූලාශ්‍රය
නාගරික සංවර්ධන අධිකාරිය ,2018

සැකසුම :
බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා ප්‍රසුතුණු අංශය ,නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
ජූනි මස 2018

සිතියම 11.5 : බලකොටු බිත්තියේ වර්තමාන තත්වය

මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය - 2018



12

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

12 පරිච්ඡේදය

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

අගනගර නාගරික සැලැස්මෙහි දැක්ම වන “ශ්‍රී ලාංකීය ස්වරිත්වයේ කිරුල’ උපායමාර්ගික ප්‍රවේශයන් තුනක් හා අරමුණු නවයක් ඔස්සේ ඉටු කිරීමට අපේක්ෂා කෙරේ සියලුම සංකීර්ණ උපායමාර්ගික ක්‍රියාකාරකම් යටතේ හඳුනාගත් උපායමාර්ගික ප්‍රවේශයන් සහ අරමුණු අතරින් හොඳම විසඳුම හා ක්‍රියාවලිය තෝරා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම ආරම්භ කර ඇත ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන ව්‍යුහාත්මක ප්‍රවේශය සැලසුම් කර ඇත.



රූපය 12.1: ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන හා පරිරක්ෂණ අංශය - 2018

12.1. උපායමාර්ගික ව්‍යපෘති ප්‍රමුඛතා ගතකිරීම

අගනගර සංවර්ධන සැලැස්මෙහි ප්‍රගතිය ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ ප්‍රධාන සංවර්ධන සැලසුම් හත යටතේ හඳුනාගෙන ඇති උපායමර්ගික ව්‍යපෘති මතය. එබැවින්, ව්‍යපෘති ප්‍රමුඛතාව හා එකඟතාව සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වේ. ඒ අනුව ව්‍යපෘති ප්‍රමුඛතාවය මඟින් එක් එක් ව්‍යපෘති, අගනගර සංවර්ධන සැලැස්මෙහි උපායමාර්ගික ප්‍රවේශයන් හා අරමුණු සමඟ සැසඳෙන අයුරු නිරීක්ෂණය කර ඇත. ව්‍යාපෘති යේ පවතින අවදානම, ව්‍යාපෘති යේ සංකීර්ණත්වය, ව්‍යාපෘති අතර පවතින අන්තර් ක්‍රියාකාරීත්වය හා උපායමාර්ගික වටිනාකම ඇතුළුව ප්‍රධාන නිර්ණායක හතරක් මත ව්‍යාපෘති ප්‍රමුඛතාව නිශ්චය කරඇත. අගනගර සංවර්ධන සැලැස්ම සැලසුම් ක්‍රියාවට නැංවීම, වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන්නුවත් කිරීම සහ සක්‍රිය සැලැස්මක් සඳහා ප්‍රමාණවත් විස්තර සහිතව මූලික සංකල්ප සහ උපායමාර්ග සකස් කිරීම මෙමඟින් පැහැදිලි කරයි. ඒ අනුව අගනගර දැක්ම යථාර්තයක් කරගැනීම වෙනුවෙන් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ට මඟ පෙන්වීම සඳහා යෝග්‍ය මූල්‍ය යාන්ත්‍රණයක් යෝජනා කර ඇත.

ව්‍යපෘති ප්‍රමුඛතා

1. *අගනගර සැලසුමේ සඳහන් සංකල්පය සාක්ෂාත් කරගැනීමට ව්‍යාපෘති න්හි පවතින උපායමාර්ගික වටිනාකම*
2. *ව්‍යාපෘති අතර පවත්නා අන්තර් සම්බන්ධතාව / අනෙකුත් ව්‍යාපෘති මත ඇතිවිය හැකි මෙහෙයුම්*
3. *ව්‍යාපෘති සංකීර්ණත්වය, ව්‍යාපෘති අවිනිශ්චිතතාව, ව්‍යාපෘතින්හි පවත්නා බැරෑරුම් බව සහ තාක්ෂණය භාවිතා කළ හැකි සංකීර්ණතාවය යන කරුණු පදනම් කරගෙන ව්‍යාපෘති සංකීර්ණතාවය.*
4. *ව්‍යාපෘති අවදානම හඳුනාගැනීම.*

1. අගනගර සැලසුමේ සඳහන් සංකල්පය සාක්ෂාත් කරගැනීමට ව්‍යාපෘති න්හි පවතින උපායමාර්ගික වටිනාකම

මෙම අගනගර සංවර්ධන සැලැස්මේ ඇතුළත් උපායමාර්ගික ව්‍යාපෘති මඟින් අගනගර සංවර්ධනයේ වටිනාකම වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන අතරම ව්‍යාපෘති න්හි උපායමාර්ගික වටිනාකමේ වර්ධනය සංකල්පිත සැලැස්මේ පෙර සැකැස්ම, උපායමාර්ගික ප්‍රවේශය සහ අරමුණු යන මූලික කරුණු සඳහා මෙහිදී වැඩි අවදානයක් දී ඇත. මෙම ව්‍යපෘති ආරම්භයේදී අගය 1-5ත් අතර වටිනාකම් යොදන අතර එහිදී අඩු උපායමාර්ගික වටිනාකමක් ඇති ව්‍යාපෘති සඳහා වටිනාකම 1 ද ,වැඩි උපායමාර්ගික වටිනාකමක් ඇති ව්‍යපෘති සඳහා වටිනාකම අංක 5 ද ලබා දී ඇත. මෙම මිනුම් වල සීමාවන් ලෙස සැලසුම් කමිටුවේ අදහස් මත මෙම ශ්‍රේණිගත කිරීම සහ ලකුණු ක්‍රමය තීරණය වීම හඳුනාගත හැකිය.

2. ව්‍යාපෘති අතර පවත්නා අන්තර් සම්බන්ධතාව / අනෙකුත් ව්‍යාපෘති මත ඇතිවිය හැකි මෙහෙයුම්

වෙනත් ව්‍යපෘති සඳහා පුර්ව අවශ්‍යතාවයක් වන ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.ඒ බැවින් හඳුනාගත් ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ පිළිවෙල අනුමාන කිරීම සඳහා යුගල සංසන්දනය කිරීමේ ආකෘතිය සකස් කරන ලදී. ආරම්භයේදී ව්‍යාපෘති වල අන්තර් සම්හන්ධතා මට්ටම හඳුනා ගැනීම සඳහා වර්ණ තුනක් භාවිතා කරන ලදී . පසුව මූලික වර්ණ සංඛ්‍යාත්මක අගයක් බවට පරිවර්තනය කරන ලදී.

ව්‍යාපෘති	P1	P2	P3	P4	P5	එකතුව	සාමාන්‍ය වටිනාකම
P1	0						
P2		0					
P3			0				
P4				0			
P5					0		
එකතුව							
සාමාන්‍ය වටිනාකම							

වගුව 12.1: ව්‍යාපෘති අන්තර් සම්බන්ධතා වගුව
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන හා පරීක්ෂණ අංශය - 2018

- *වම්පස ඇති ව්‍යාපෘතිය ඉහළම වටිනකමින් යුත් පූර්ව අවශ්‍යතාවක් සහිත ව්‍යාපෘතිය ක් නම් – 1*
- *වම්පස ඇති ව්‍යාපෘතිය ඉහළම වටිනකමින් යුත් පූර්ව අවශ්‍යතාවක් නොමැති ව්‍යාපෘතියක් නම් – 0*

3. ව්‍යාපෘති සංකීර්ණත්වය, ව්‍යාපෘති අවිනිශ්චිතතාව, ව්‍යාපෘති න්හි පවත්නා බැඳීරුම්බව සහ තාක්ෂණය භාවිතා කළ හැකි සංකීර්ණතාවය යන කරුණු පදනම් කරගෙන ව්‍යාපෘති සංකීර්ණතාවය

ව්‍යාපෘති වල සංකීර්ණතාව හඳුනා ගැනීම සඳහා, සාධක 7ක් භාවිතා කරමින් ව්‍යාපෘති සංකීර්ණතා දර්ශකය නිර්මාණය කරන ලදී. පහත සඳහන් නිර්ණායකයන් අනුව එක් එක් ව්‍යාපෘතිය ඇගයීම සඳහා එය සකස් කරන ලදී. වටිනාකම 1 සිට 5 දක්වා පරාසයක වූ අතර ඉතා සංකීර්ණත්වයෙන් යුත් ව්‍යාපෘති සඳහා වටිනාකම් 1 ක් සහ අඩු සංකීර්ණතාවයකින් යුත් ව්‍යාපෘති සඳහා අගය 5 ක් යොදා ගන්නා ලදී.

4. ව්‍යාපෘති අවදානම හඳුනාගැනීම

අවදානම් විශ්ලේෂණය සැලසුම් කිරීමේ ක්‍රියාවලිය ක්ෂේත්‍රයේ භාවිතා කළ යුතු අවශ්‍ය මෙවලමකි. එය ව්‍යාපෘති වල ඍණාත්මක බලපෑමක් ඇති කළ හැකි ගැටළු හඳුනා ගැනීමට සහ හඳුනාගත් ව්‍යාපෘති වල ප්‍රමුඛතාවය තීරණය කිරීම සඳහා සාධකයක් ලෙස භාවිතා කළ හැකි ය. අවදානම් දර්ශකය විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් පදනම් වූයේ, නිර්ණායකයන් හා සම්භාවිතාවයන් මත පදනම්ව ය. පහත දැක්වෙන පරිදි අවදානම් වර්ග 9 ක් (පිරිවැය අවදානම, උපලේඛන අවදානම, කාර්ය සාධන අවදානම, පාලන අවදානම්, උපායමාර්ගික අවදානම්, මෙහෙයුම් අවදානම්, වෙළඳපල අවදානම්, නීති අවදානම) භාවිතා කරන ලදී. මෙමඟින් අගනගර සංවර්ධන සැලැස්මේ ව්‍යාපෘති මඟින් සිදු විය හැකි අවදානම් පරාසයන් පෙන්නුම් කරයි.

ව්‍යාපෘති	T(P)	T(S)	R
P1			
P2			
P3			
P4			
P5			
එකතුව			
සාමාන්‍ය අගය			

වගුව 12.2: ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය
මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය සහ සංවර්ධන හා පරීක්ෂණ අංශය - 2018

Project	Inherent Complexity	Uncertainty	No of Techno-logies	Rigidity of Sequence	Overlap of Phases	Organizational inherent Complexity	Total	Complexity Index
P1								
P2								
P3								
P4								
